*Vidyodaya J. Arts, Sci., Lett., Silver Jubilee, pp.* 184-

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ දළ සටහනක්

විමල් ජී. බලගල්ලේ විසිනි

ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලය ස්වකීය අධ්‍යාපන සේවාවට පස්විසි වසරක් පිරීමේ රජත ජයන්තිය 1984 පෙබරවාරි මාසයේ දී පැවැත්වීමට සූදානම් වෙයි. විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ සවිස්තර සමාලෝචනයකට මේ සුදුසු අවස්ථාවකි. එහෙත් ලිපියේ පිටු ගණන සීමා කිරීමට සිදුව ඇති හෙයින් මෙහි ලා මා අපේක්ෂා කරන්නේ විශ්ව විද්‍යාලයීය ඉතිහාසයෙහි වැදගත් කරුණු අතුරෙනුදු සුවිශේෂ කරුණු හා අප්‍රසිද්ධ කරුණු සමහරක් කෙරෙහි පමණක් අවධානය යොමු කිරීමට ය.

## විශ්වවිද්‍යාලයේ නාමය:

පළමු කොට ම විශ්වවිද්‍යාලය හැඳින්වෙන නාමේ ඉතිහාසයෙන් අපේ විමර්ශනය පටන් ගැනීම යෝග්‍ය ය. දැනට මෙම විශ්වවිද්‍යාලය හැඳින්වෙන 'ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය' යන නාමය එතරම් පැරණි වූවක් නොවේ. කලින් 'විද්‍යොදය' නමින් හැඳින්වුණු මෙම විශ්වවිද්‍යාලය මණ්ඩපය ' ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය' යි නම් කරන ලද්දේ 1979.01.01 දින පටන් ක්‍රියාත්මක කරන ලද 1978 අංක 16 දරන විශ්ව විද්‍යාලය පනතේ 139 වන වගන්තිය මගිනි. මෙසේ කරන ලද්දේ ශ්‍රී ලංකාවේ සෑම විශ්වවිද්‍යාලයක්ම ආරෝපිත සංඥානාමයකින් හඳුන්වනු වෙනුවට එය පිහිටි නගරය හෝ ග්‍රාමය හෝ ඇසුරෙන් නම් කිරීමේ පොදු ප්‍රතිපත්තියක් අනුව ය.[1] විශ්වවිද්‍යාලය පිහිටි ගමෙහි නමින් 'ගංගොඩවිල විශ්වවිද්‍යාලය' යි මෙය නොහඳුන්වා, ළඟදී කොළඹ වෙනුවට ශ්‍රී ලංකාවේ අගනුවර බවට නැවතත් පත්කරනු ලැබූ ශ්‍රී ජයවර්ධනපුරයේ නමින් හඳුන්වනු ලැබීම, එක් අතකින්, මෙය ආයතනයට දැක්වූ විශේෂ අනුග්‍රහයක් සේ ද සැලකිය හැකිය. එසේ වුවද එවකට සිටි විශ්වවිද්‍යාලය ආචාර්යවරුන් වැඩි දෙනා විශ්වවිද්‍යාලයේ පැරණි නම වූ 'විද්‍යොදය' යන්නම තබා ගැනීමට වැඩි කැමැත්තක් දැක්වූ බව ආචාර්ය සංගමය ඒ සඳහා යෝජනාවක් සම්මත කර ගැනීමෙන් පෙනේ. මෙහිදී ආචාර්යවරුන්ගේ ප්‍රධාන තර්කය වූයේ, නම් වෙනස් වීම මෙතෙක් කෙමෙන් ගොඩනංවාගෙන ඇති ජාත්‍යන්තර ශාස්ත්‍රීය සම්බන්ධතා ආදියෙහි අවුලක් ඇතිවීමට හේතුවිය හැකිය යන්නයි.

1959 පෙබරවාරි මය 16 වනද උත්සවාකාරයෙන් විධිමත් අධ්‍යාපන කටයුතු ආරම්භ කළ මෙම විශ්වවිද්‍යාලය පිහිටුවන ලද්දේ 1959 ජනවාරි 01 වන දින පටන් ක්‍රියාත්මක වූ 1958 අංක 45 දරන විද්‍යොදය විශ්වවිද්‍යාලය හා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය පනත මගිනි. එම පනත මගින් මෙය නම් කරන ලද්දේ 'ශ්‍රී ලංකාවේ විද්‍යොදය විශ්ව විද්‍යාලය' යනුවෙනි.[2] ඉන්පසු, ගතවූ අවුරුදු විසිපහක කාලය තුළදී, 1966 දී[3] ද, 1972දී[4]

1. University Act No. 16 of 1978, Section 139 (1) බලන්න. 1982 දී වෙනම පනතක් මගින් පිහිටුවනු ලැබූ 'බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට' මෙම ප්‍රතිපත්තිය අදාළ නොවීය.
2. Vidyodaya University and Vidyalankara University Act, No. 45 of 1958, Section 2 (1).
3. Higher Education Act, No. 20 of 1966.
4. University of Ceylon Act, No. 1 of 1972.

ද, 1979 දී[5] ද යි අවස්ථා තුනක දී ව්‍යුහාත්මක වෙනස්කම්වලින් යුත් ප්‍රතිසංවිධානවලට භාජන කරනු ලැබූ නමුත්, එයින් මුල් ප්‍රතිසංවිධාන දෙකෙහි දී විද්‍යොදය නාමයෙහි වෙනසක් නොකරන ලදී.

**විශ්වවිද්‍යාලයේ ඓතිහාසික පසුබිම: 1 දේශපාලන හා සාමාජික:**

1958/59 දී විද්‍යොදය විශ්වවිද්‍යාලය පිහිටුවීමට තුඩුදුන් කරුණු කෙරෙහි මීළඟට අපේ අවධානය යොමු විය යුතුය. අපේ රටේ සමහරුන් "විද්‍යොදය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය පිහිටුවීම" නැතහොත් "විද්‍යොදය විද්‍යාලංකාර පිරිවෙන් දෙකට විශ්වවිද්‍යාලය තත්ත්වය දීම" "දේශපාලන පොරොන්දු ඉටුකිරීමක් පමණක්" හැටියට දකිතත්, වඩා වැදගත් ඓතිහාසික හේතු මෙම සිද්ධියට මුල්වී ඇති බව, පරීක්ෂාකාරිව බලන විට පැහැදිලි වේ. අදාළ දේශපාලන පොරොන්දු වුවද දැක්ක යුත්තේ එකී ඓතිහාසික හේතූන්ගේ ම ආනුෂාඞ්ගික ඵල වශයෙනි.

1931 සර්වජන ඡන්දයෙන් පසු, ලක්දිව ප්‍රථම අධ්‍යාපන අමාත්‍ය ධුරයට පත් සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා විසින් 1938 දී ඉදිරිපත් කළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා, විශේෂයෙන් රාජ්‍ය සභාවේ අධ්‍යාපන කාරක සභාව විසින් 1940 දී පත් කළ අධ්‍යාපනය පිළිබඳ විශේෂ කමිටුවේ යෝජනා[6] අනුව සකස් වූ, 1945-47 වර්ෂවල සිට ක්‍රියාත්මක වන්නට පටන්ගත් නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තියේ සෘජු ප්‍රතිඵලයක් වශයෙන් සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා, 1959–60 වන විට විශ්වවිද්‍යාලය ප්‍රවේශ සුදුසුකම් ලබන්නන්ට එම මාධ්‍යයෙන්ම විශ්වවිද්‍යාලය අධ්‍යාපනය ද ලබා ගැනීමට පහසුකම් සැලසීම රජය පිට පැවරුණු බැරෑරුම් වගකීමක් විය. එවකට රටේ පැවති එකම විශ්වවිද්‍යාලය ද එයට අනුකූලතාවක් නොදැක්විය.

'නිදහස් අධ්‍යාපනයේ පියා' මෙන් සැලකුණු කන්නන්ගර 1947 මහා මැතිවරණයෙන් පැරදීම නිසා නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාවට නැඟීමෙහි තාවකාලික පසුබැසීමක් සිදුවුවද මුලුමනින් ඇණහිටීමක් සිදු නොවීය. ඩී. ඇස්. සේනානායක රජයේ අධ්‍යාපන ඇමති ඊ. ඒ. නුගවෙල මහතා 1950.01.19 වනද නියෝජිත මන්ත්‍රණ සභාව වෙත ඉදිරිපත් කළ අධ්‍යාපන ධවල පත්‍රිකාවෙහි[7] ඇතුළත් වූ "ප්‍රාථමික පාසල්වල ඉගැන්වීමේ මාධ්‍යය මව්බස විය යුතු අතර, II ශ්‍රේණියේ පටන් ඉංග්‍රීසිය දෙවන බසක් වශයෙන් ඉගැන්විය යුතුය. සිංහල දෙමළ පාසල්වල අධ්‍යාපන මාධ්‍යය ඉදිරියටත් දැන් පරිදි වන්නේය. ඉංග්‍රීසි පාසල්වල IV ශ්‍රේණියෙන් ඉහළ අධ්‍යාපන මාධ්‍යය තාවකාලිකව දැනට පමණක් ඉංග්‍රීසි වන්නේය. නිදහස් අධ්‍යාපනය පිළිබඳ රජයේ ප්‍රතිපත්ති නොවෙනස්ව පවත්නේය" යන යෝජනාව එයට සාධක වෙයි. මේ අනුව, ස්වභාෂා මාධ්‍යය පශ්චාත් ප්‍රාථමික අධ්‍යාපනය තෙක් ද ව්‍යාප්ත කරමින්, 1951.12.14 වනද, 1953 දී VI ශ්‍රේණියෙහිත්, 1954 දී VII ශ්‍රේණියෙහිත්, 1955 දී VIII ශ්‍රේණියෙහිත් අධ්‍යාපන මාධ්‍යය මව්බස වියයුතු බවට නියෝගයක් ද 1953.01 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිකුත් කරන ලදී[8]

5. Universities Act, No. 16 of 1978.
6. Report of the Special Committee on Education, Sessional Paper XXIV, 1943.
7. Government Proposals for Educational Reforms in Ceylon, 1950, Parlimentary Series (House of Representatives), Fourth Session of the First Parliment, No. 2.
8. Administrative Report, DE, 1951, pp. A 5, A 20.

1952 දී පිහිටුවන ලද ඩඩ්ලි සේනානායක රජයෙහි අධ්‍යාපන ඇමති වූ එම්. ඩී. බණ්ඩා මහතාගේ කාලයේ දී, එනම් 1953.10.28 වනදා, ඊ. ඩබ්ලිව්. කන්නන්ගර (සභාපති) එල්. ජේ. ද ඇස්. සෙනෙවිරත්න, ආර්. ඇස්. ද සේරම්, ජී. පී. මලලසේකර, ජී. ඩබ්ලිව්. මයිල්වාගනම්, එල්. එච්. මෙත්තානන්ද, ජේ. ඕ. ඊ. පෙරෙයිරා යන භවතුන්ගෙන් සමන්විතව පත්කරනු ලැබූ කොමිසම මෙහිලා අපට වැදගත් වේ. කොමිසමේ ලේකම් වූයේ නන්දදේව විජේසේකර මහතා ය. 1954 දී කන්නන්ගර වෙනුවට ඊ. ජී. එල්. විජේවර්ධන මහතා සභාපති ලෙස පත්කරනු ලැබිය. කොමිසමේ ප්‍රධාන කාර්‍ය්‍ය වූයේ ලංකාවේ විශ්වවිද්‍යාලයේත්, ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාඨශාලාවලත් උගන්වනු ලබන විද්‍යා හා තාක්ෂණික විෂයීය පාඨමාලා පිරික්සා, අධ්‍යාපන තත්ත්වය පිරිහිය නොදී ඒවා ස්වභාෂාවන්ගෙන් ඉගැන්වීමේ කාර්‍ය්‍යය පටන් ගතහැකි ආකාරයත්, එසේ කළ හැකි කාලසීමාවත් පිළිබඳව වාර්තා කිරීමය.

1954 ඔක්තෝබර මාසයේ දී මෙම කොමිසම ඉදිරිපත් කළ අතුරු වාර්තාවෙහි[9] නිර්දේශයන් අතර, ජ්‍යෙෂ්ඨ ද්විතීයික තලයේ පාඨමාලා සඳහා යෝග්‍ය තත්ත්වයේ ස්වභාෂාමය පාඨ්‍ය ග්‍රන්ථ හා විමර්ශන සාහිත්‍යයත්, ශබ්දමාලා හා පරිවර්තනත් අවශ්‍ය පමණින් ප්‍රකාශනයට පියවර ගතයුතු බවටත්, දැනට විශ්වවිද්‍යාලයේ සහ ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල්වලත් විද්‍යා ගණිත විෂය ඉගැන්වීමෙහි නියුතු ගුරුවරුන් ක්‍රමයෙන් ස්වභාෂාවෙන් එම විෂය ඉගැන්වීමේ ප්‍රවීණයන් බවට පත්කර ගැනීමට පියවර ගතයුතු බවටත් යෝජනා ඇතුළත් විය. කොමිසමේ අවසාන වාර්තාව ඉදිරිපත් කරන ලද්දේ 1956 දී බණ්ඩාරනායක රජය සමයෙහි ය.[10]

1956 වර්ෂාරම්භයේ දී පූර්ව ජ්‍යෙෂ්ඨ පංතියෙහිත්, 1957 දී ජ්‍යෙෂ්ඨ පංතියෙහිත් විද්‍යා ගණිත හා අපරදිග භාෂාත් හැර සෙසු සියලු විෂය පිළිබඳ අධ්‍යාපන මාධ්‍යය ස්වභාෂාව වියයුතු බවට ප්‍රතිපත්ති තීරණයක් 1955 දී ගන්නා ලද අතර, අවශ්‍ය පොත් පරිවර්තනය කිරීම සඳහා ස්වභාෂා දෙපාර්තමේන්තුවක් ද ඇති කරන ලදි.[11]

රටපුරා ජාතිකාභිමානය පුබුදු කිරීමට හේතු වූ සාක්ෂ්‍ය විභාගයකින් අනතුරුව, 1956 පෙබරවාරි 04 වනද ආනන්ද විද්‍යාලයේදී ප්‍රකාශයට පත්කළ බෞද්ධ පරීක්ෂණ කොමිටියේ වාර්තාව[12] කෙළින්ම නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූල වූ යෝජනා ඉදිරිපත් කළේය.

1956 දී බලයට පත් එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක රජයේ අධ්‍යාපන ඇමති වූ ඩබ්ලිව්. දහනායක මහතාට ලක්දිව අධ්‍යාපනය පිළිබඳ වගකීම පැවරෙන විට, එය නිදහස් හා ස්වභාෂා මාධ්‍ය අධ්‍යාපන මාර්ගයෙහි සැහෙන දුරක් ගමන් කොට තිබිණ.

ඉහත කී විජේවර්ධන අධ්‍යාපන කොමිසම විජේවර්ධන, සෙනෙවිරත්න, මලලසේකර, මෙත්තානන්ද යන සාමාජිකයන් වැඩි දෙනාගේ අත්සනින් සිය අවසාන වාර්තාව ඉදිරිපත් කෙළේ මෙබඳු පසුබිමක ය. වාර්තාවේ නිර්දේශ අතර පහත සඳහන් යෝජනා ද විය.

9. Interim Report of the Commission on Higher Education in National Languages, Sessional Paper, XXI, 1954
10. Final Report of the Commission on Higher Education in National Lanuagages, Sessional Paper X, 1956.
11. Administrative Report, DE, 1955, pp. A 4; ඊ. එච්. ද අල්විස්, "භාෂාව සහ අධ්‍යාපනය" ලංකාවේ අධ්‍යාපනය, සියවස ප්‍රකාශනය, 1969 iii, 949–56 පිටු.
12. Report of the Buddhist Committee of Enquiry, 1956

* 1957 දී ජ්‍යෙෂ්ඨ පංතියට ක්‍රියාත්මක කෙරෙන ස්වභාෂා මාධ්‍ය ප්‍රතිපත්තිය ම 1958 දී පූර්ව විශ්වවිද්‍යාලය ප්‍රවේශ පංතියටත්, 1959 දී විශ්වවිද්‍යාලය ප්‍රවේශ පංතියටත් ව්‍යාප්ත කළ යුතුය.

* **ස්වභාෂා මාධ්‍යයෙන් ඉගෙනීම ලබන සිසුන්ට විශ්වවිද්‍යාලයේ දී තමතමන්ට අදාළ විෂය ස්වභාෂාවෙන් ම ඉගෙනීම සඳහා හැකිතාක් ඉක්මනින් කටයුතු සම්පාදනය කළ යුතුය.**

* පේරාදෙණියේ විශ්වවිද්‍යාලය **සිංහලයෙන්** අධ්‍යාපනය දිය යුතුය.

* යටත් පිරිසෙයින් **නවත් සිංහල මාධ්‍ය විශ්වවිද්‍යාලය දෙකක්** (කොළඹ සහ ගාල්ලේ) පිහිටුවිය යුතු අතර, දෙමළ මාධ්‍ය විශ්වවිද්‍යාලයක් ද (යාපනයේ හෝ මඩකලපුවේ) පිහිටුවිය යුතුය.

* ලන්ඩන් විශ්වවිද්‍යාලයීය උපාධි සඳහා මෙහි විභාග පැවැත්වීම නතර කළයුතු අතර **ස්වභාෂාවෙන් බාහිර උපාධි විභාග** පැවැත්වීමට වැඩ පිළිවෙළ යෙදිය යුතුය.

* **VI ශ්‍රේණියේ සිට සෑම ළමයකුට ම ඉංග්‍රීසි ඉගැන්විය යුතු අතර, උපාධි අපේක්ෂකයන්ගේ ඉංග්‍රීසි දැනුම දියුණු කිරීමට විශ්වවිද්‍යාලය ප්‍රවේශ තලයේ දී හෝ ඉන්පසුව හෝ අධිවේග ඉංග්‍රීසි පාඨමාලාවක් සකස් කළ යුතුය.**

* ස්වභාෂා දෙපාර්තමේන්තුව මගින් විශ්වවිද්‍යාලයේ ද සහයෝගය ඇතිව ජ්‍යෙෂ්ඨ ද්විතීයික හෝ විශ්වවිද්‍යාලය පාඨමාලා සඳහා විද්‍යා – තාක්ෂණික විෂයීය පාඨ්‍ය ග්‍රන්ථත් ශිල්ප වචන මාලාත් එබඳු වෙනත් පොතපතත් සැපයීමට පියවර ගතයුතු ය.

1956 දී බණ්ඩාරනායක මහතාගේ නායකත්වයෙන් බලයට පත් මහජන එක්සත් පෙරමුණ නිදහස් අධ්‍යාපනය ඉදිරියට ගෙන යෑමට පමණක් නොව, සිංහලය රාජ්‍ය භාෂාව කිරීමටත් මැතිවරණ ප්‍රතිඥා දී තිබුණු හෙයින්, ඒ වනවිට ද්විතීයික අධ්‍යාපනයෙහි ද බොහෝ දුරක් යන තෙක් ක්‍රියාත්මක කර තිබුණු ස්වභාෂා මාධ්‍ය ප්‍රතිපත්තිය නවදුරටත් ක්‍රියාත්මක කිරීමට වැඩි උද්‍යෝගයක් දැක්වීම පුදුමයට කරුණක් නොවේ.

1953 දී VI ශ්‍රේණියෙන් පටන් ගෙන ස්වභාෂා මාධ්‍යයෙන් ඉගෙනීම ලැබූවන් 1959 දී විශ්වවිද්‍යාලය ප්‍රවේශයට පෙනී සිටීමට නියමිතව සිටි හෙයින්, එතැන් පටන් අවුරුදු පතා විශ්වවිද්‍යාලයට ඇතුළත් වන්නන්ට එම මාධ්‍යයෙන් ම අධ්‍යාපනය දීමට කටයුතු සැලසීම නව රජයේ අධ්‍යාපනාමාත්‍ය ධූරයට පත් ඩබ්ලිව්. දහනායක මහතාට මුහුණ දීමට සිදුවූ බැරෑරුම් ප්‍රශ්නයක් විය. එවකට ලක්දිව පැවති එකම විශ්වවිද්‍යාලය වූ ලංකා විශ්වවිද්‍යාලය රජයේ ස්වභාෂා මාධ්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට මැලිබවක් දැක්විය. එසේ හෙයින් විජේවර්ධන කොමිසම යෝජනා කළ පරිදි සිංහල මාධ්‍යයෙන් උගන්වන විශ්වවිද්‍යාලයක් හෝ දෙකක් හැකිතාක් ඉක්මණින් පිහිටුවීම රජයේ අදහස විය. මෙම අදහස පිරිවෙන් විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් ක්‍රියාත්මක කිරීමට මංපෑදුණු අයුරු සැකෙවින් දැක්වීමට පහත සඳහන් 1968 කොමිෂන් සභා වාර්තා උද්ධෘතය ප්‍රමාණවත්ය:

''අධ්‍යාපන මාධ්‍යය සිංහලට පරිවර්තනය කිරීමේ දී පේරාදෙණි විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරන ලදැයි ඇතැම් දෙනා සැලකූ හෙමින් හෙමින් ප්‍රතිපත්තිය නොරිස්සූ, දේශපාලනය අතින් ක්‍රියාශීලීව සිටි අධ්‍යාපනඥයන්ගේ ඉල්ලීම වූයේ අප්‍රමාදවම අධ්‍යාපන මාධ්‍යය සිංහලට පරිවර්තනය කරන ලෙසය. 1956.06.01 වැනි දින උප ඇමතිවරයකුගේ නායකත්වයෙන් නියෝජිත පිරිසක් අධ්‍යාපන ඇමතිවරයා මුණගැසී මෙම කාරණය සම්බන්ධයෙන් ඉක්මණින් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටියෙන් ඇමතිවරයා විසින් ''සිංහල විශ්වවිද්‍යාල උපාධි පිළිබඳ කමිටුවක්' පත්කරනු ලැබිණ. 'ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල උපාධි සිංහලෙන් ලබා ගැනීමට හැකිවන පරිදි කටයුතු යොදනු සඳහා ගතයුතු ක්‍රියාමාර්ග ගැනත්, එම ප්‍රශ්නයට සම්බන්ධ වෙනත් කරුණු ගැනත්' නිර්දේශ කිරීමේ නියමය ඇතිව පත් කරනු ලැබූ මෙම කමිටුව අභාවප්‍රාප්ත ඇල්. එච්. මෙත්තානන්ද මහතා ප්‍රමුඛ සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත විය. කමිටුව පත්කළ ටික කලකින් එහි නිර්ණය විෂයයන්ට තවත් වගන්තියක් එකතු කරනු ලැබිණ. එනම් '**ලංකාවේ පිරිවෙන්වලට විශ්වවිද්‍යාල තත්ත්වය දීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග කවරේද**' යන්නය. තවත් සාමාජිකයන් දෙදෙනෙකු පත්කිරීමෙන් පසු මෙම කමිටුවේ නම '**සිංහල උපාධි හා පිරිවෙන් විශ්වවිද්‍යාල තත්ත්වය**' යනුවෙන් වෙනස් කරන ලදී''[13]

රජය 'පිරිවෙන් විශ්වවිද්‍යාලය' අදහසට නැඹුරු වීමට තවත් හේතුවක් වූයේ නව විශ්වවිද්‍යාලය සඳහා අලුතින්ම ගොඩනැගිලි තැනවීමට එක්වර ම විශාල ධනයක් ද කාලය ද වැය කළයුතු වූ හෙයින්, එම වැය ඔරොත්තු දිය හැකි පමණට අඩු කරගැනීමේ මගක් ද, ස්වභාෂා මාධ්‍යයෙන් උපාධි තත්ත්වයේ අධ්‍යාපනයක් දියහැකි විශේෂඥ ගුරුවරුන්ගේ හිඟයට, – සමහර විෂය සම්බන්ධයෙන් පමණක් හෝ –, පිළියම් යෙදිය හැකි මගක් ද එයින් සැලසෙන බව කල්පනා කිරීම ය. රජයේ ප්‍රකාශිත ප්‍රතිපත්තියක් වූ බුද්ධාගමයට, සංඝයාට හා දේශීය සංස්කෘතියට සුදුසු තැන දීමේ කාර්‍යය ඇත්තට ම ඉටුකරන බව රටට පෙන්නුම් කළ හැකි නිදසුනක් වශයෙන් සැලකීම ද අතුරු හේතුවක් වූබව පෙනේ.

මෙම අදහස ක්‍රියාත්මක කිරීම සඳහා රජය තෝරා ගත්තේ නූතන ලංකාවේ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමයෙහි පුරෝගාමී පැරණිතම පිරිවෙන් දෙක වූත්, දේශීය විදේශීය විද්වතුන් විශාල සංඛ්‍යාවක් බිහිකොට ඇත්තාවූත්, ශාඛා පිරිවෙන් විශාල සංඛ්‍යාවකින් සමන්විත වූත් විද්‍යෝදය (1873), විද්‍යාලංකාර (1875) යන දෙපිරිවෙන ය. මාස කීපයකට පසුව, 1956.10.08 දින ඉහත කී මෙත්තානන්ද කමිටුව ඉදිරිපත් කළ අතුරු වාර්තාවෙන් ද එම දෙපිරිවෙනට විශ්වවිද්‍යාලය තත්ත්වය දියයුතු බව නිර්දේශ කරන ලදී.[14]

**ඓතිහාසික පසුබිම: II සංස්කෘතික:**

ලංකාවේ සාම්ප්‍රදායික පන්සල් අධ්‍යාපන ක්‍රමයෙහි ඉතා වැදගත් ආයතනයක් වූ 'පිරිවෙන' ශ්‍රී ජයවර්ධනපුර රාජධානි යුගයේ දී විශ්වවිද්‍යාලයක ස්වරූපයෙන් දියුණු වී පැවති බව තොටගමුවේ විජයබා පිරිවෙනත්[15] කැරගල පද්මවතී පිරිවෙනත්[16] ගැන සංදේශ කවීන් කරන වර්ණනාවලින් පෙනේ. යුරෝපීය ආක්‍රමණ ආදිය නිසා 16 සියවසේ පටන් පන්සල් අධ්‍යාපනය පිරිහෙන්නට වූ අතර 18 සියවස වන විට පිරිවෙන්

13. ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව, 1968, xxiii වැනි සැසි වාර්තාව – 1968, 2 කොටස, 10, 8 පිට.
14. xxiii සැසි වාර්තාව – 1968, 11 කොටස, 8 පිට.
15. ගිරා සංදේශය, කුමාරතුංග සං., පද්‍ය 218 සිට.
16. හංස සංදේශය, ධර්මවර්ධන සං., පද්‍ය 170 සිට.

නාමය පවා පන්සල් අධ්‍යාපනයෙන් ඈත්ව ගොස් තිබිණ. එම සියවසේ දී ධර්ම ශාස්ත්‍රීය පුනර්ජීවයක් ඇතිකළ වැලිවිට සරණංකර සඟරජ හිමියන් ආරාමික ශාස්ත්‍රශාලා හතකට නොඅඩු ගණනක්[17] පිහිටුවීමට ක්‍රියාකර ඇතත්, ඉන් එකකුදු 'පිරිවෙන්' නමින් හඳුන්වා නැත.

යටපත් වී ගිය පිරිවෙන් නාමය නැවත ගොඩගන්නා ලද්දේ එතෙක් පැවති සාම්ප්‍රදයික අධ්‍යාපන ක්‍රමය විධිමත් හා පෘථුල ද කරමින්, 1873 වර්ෂයේ දී, විද්‍යාධාර සභාවේ අනුග්‍රහය මත, මාලිගාකන්දේ 'විද්‍යෝදය පිරිවෙන' නමින් විද්‍යාස්ථානයක් ඇරඹූ හික්කඩුවේ සුමඞ්ගල නාහිමියන් විසිනි.[18] හික්කඩුවේ නාහිමිත්, එහෙයින්ම විද්‍යෝදය පිරිවෙනත්, ශාස්ත්‍රීය සම්ප්‍රදය අතින් වැලිවිට සරණංකර සඟරජ හිමි සිසු පරපුර සමඟ කෙළින් ම සම්බන්ධ වෙයි. සඟරජ හිමියන්ගේත් සිටිනාමලුවේ ධම්මජෝති හිමියන්ගේත් ශිෂ්‍යයකු වූ වෙහැල්ලේ ධම්මදින්න හිමියන් ඇරඹූ පැල්මඩුල්ලේ විද්‍යාස්ථානයෙහි දී, පසුකලෙක එහි ආධිපත්‍යයට පත් ගාල්ලේ මේධංකර හිමියන් හා ඉඳුරුවේ සුමංගල හිමියන් වෙතින් අධ්‍යාපනය ලබාගත් වලානේ සිද්ධාර්ථ හිමියන් විසින් 1849 දී ඇරඹූ රත්මලානේ පරමධම්ම චේතිය විහාරීය විද්‍යාස්ථානයෙහි ය[19] හික්කඩුවේ නාහිමියන් මෙන්ම විද්‍යාලංකාරය[20] පිහිටුවූ රත්මලානේ ධම්මාලෝක නාහිමියන් ද අධ්‍යාපනය ලද්දේ [21]

හික්කඩුවේ නාහිමියන් ජාත්‍යන්තර කීර්තිධර ප්‍රාචීන පඬිවරයකු වූ හෙයින්, විද්‍යෝදය පිරිවෙනට දේශීය ගිහි පැවිදි සිසුන් පමණක් නොව, විදේශීය ශිෂ්‍යයන් ද ඇදී ආ අතර, ඔවුන්ගෙන් බොහෝ දෙනා පසුකල්හි විවිධ ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වයට පත් විද්වත්හු වූහ.[22] විද්‍යෝදය පිරිවෙනට අඩසියවස පිරුණු එක්දස් නවසිය විසිගණන්වලදී විද්‍යෝදය පිරිවෙනේ ශිෂ්‍ය සංඛ්‍යාව නවසියය ඉක්මවා ගියේය.[23] 1925 දී, එවක පරිවේණාධිපති වූ කහවේ රතනසාර නාහිමියන් සිදු කළ ප්‍රතිසංවිධානයෙන් බිහිවූ උසස් පිරිවෙන් අංශය බොහෝ දුරට විශ්වවිද්‍යාලය ස්වරූපය ගත්තේය.[24] ප්‍රාචීන භාෂා අධ්‍යාපනය අතින් විද්‍යෝදය මෙම උසස් තත්ත්වයට පැමිණ සිටි බව එකල රජය ද ඇතුළු කාගේත් පොදු පිළිගැනීම විය. 1926.11.17 වනද ශ්‍රී සුමංගල ධර්මශාලා ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවයේදී ලංකාණ්ඩුකාර ශ්‍රීමත් හියු ක්ලිපර්ඩ් කළ කථාවේදි, ලංකා විශ්වවිද්‍යාලය

17. නියමකන්ද, පෝයමලුව, අස්ගිරිය, සුදුහුම්පොළ, අංපිටිය, නිත්තවෙල, ගංගාරාමය; සංඝරාජ සාධු චරියාව, සන්නස්ගල සං., 10,28 පිටු; මන්දරම්පුර පුවත, ලංකානන්ද සං., 640, 646 පද්‍ය.

18. බලගල්ලේ විමලබුද්ධි "ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පසුබිම" සංස්කෘති, විශ්වවිද්‍යාල අංකය, xxii -4, (1965). පිටු 17 සිට; වැලිවිටියේ සෝරත නාහිමි, "අප විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය සංග්‍රහය, 1-1, (1960), 1-3 පිටු; විද්‍යෝදය 1-11/12, (1926) පිටු 448 සිට.

19. 1839 දී පැල්මඩුල්ලේ සිට වලානට පැමිණ එහි සිද්ධාන්වාරාමයෙහි සිටිය දී ද කලක් ඉගැන්වීම කරගෙන ගිය බව පෙණේ.

20. මෙය මුලදී නම් කරන ලද්දේ 'ශාස්ත්‍ර ශාලාව' යනුවෙනි. විද්‍යාලංකාර පිරිවෙන, ශත සංවත්සරය 1975, 12 පිට.

21. කොටගම වාචිස්සර, සරණංකර සංඝරාජ සමය, 1960, පිටු 247 සිට; ප.බ.ජී. හේවාවසම්, මාතර යුගයේ සාහිත්‍යය, 1966, 83,85 පිටු, පී.බී. සන්නස්ගල, සිංහල සාහිත්‍ය වංශය, 1964, 641 පිට.

22. විස්තර සඳහා විද්‍යෝදයාශීති වර්ෂ පූර්ති සංග්‍රහය, 1953, පිටු 54 සිට.

23. ජී. පී. වික්‍රමාරච්චි, "විද්‍යෝදය පිරිවෙන" මහජන ආණ්ඩුව සහ පිරිවෙන් විශ්වවිද්‍යාලය, 1959, පිටු 19 සිට.

24. විද්‍යෝදය 1-10 (1926), 389 පිට.

පිහිටුවූ පසු ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර ඉගැන්වීම සඳහා ආචාර්ය මාර්ස්ට[25] අවශ්‍ය වන විද්වතුන් මෙම පිරිවෙනින් ලබා ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරන බවට කළ ප්‍රකාශය එයට සාධකයකි.[26]

**පූර්වකෘත්‍ය සම්පාදනය (1):**

ඉහත කී පරිදි, විද්‍යෝදය විද්‍යාලංකාර දෙපිරිවෙනට විශ්වවිද්‍යාලය තත්වය දීමට සනිටුහන් කිරීමෙන් අනතුරුව, එයට අදාළ පනත් කෙටුම්පත සැදීමේදී වහල් කරගැනීම පිණිස, පිරිවෙන් විශ්විද්‍යාලයක වියයුතු වූ විශේෂාංග ඇතුළත් ආදර්ශ කෙටුම්පත් පනතක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යාපනාමාත්‍යවරයා පිරිවෙන්පතිවරුන් දෙනමගෙන් ඉල්ලීමක් කෙළේය. විද්‍යෝදය පිරිවෙන වෙනුවෙන් මෙම ඉල්ලීම පිළිගත් වැලිවිටියේ සෝරත නාහිමියෝ පලන්නොරුවේ විමලධම්ම හිමි, බලගල්ලේ විමලබුද්ධි හිමි[27] යන පරිවේණාචාර්යවරුන්ගේත්, මහාචාර්ය එස්. පරණවිතාන, ඩී. පී. ජයසේකර යන හිතෛෂී විද්වතුන්ගේත් සහායත්වය ඇතිව ආදර්ශ පනත් කෙටුම්පතක් පිළියෙල කොට[28] 1956.10.02 දින අධ්‍යාපනාමාත්‍ය කාර්යාලයේදී ඇමතිවරයා වෙත පිළිගන්වන ලදී.[29] විද්‍යාලංකාර පිරිවෙන ද පසුව එබඳු කෙටුම්පතක් පිළිගැන්වීය. අනතුරුව එම ආදර්ශ කෙටුම්පත්වලින් යෝජිත ආකාරයේ ව්‍යවස්ථා සම්පාදනය කරන ලෙස ඇමතිවරයා 1956.11.12 දරන කැබිනට් සංදේශයෙන් කැබිනට් මණ්ඩලයට නිර්දේශ කළේය. එහෙත් විද්‍යෝදය විද්‍යාලංකාර දෙපිරිවෙනට විශ්වවිද්‍යාලය තත්ත්වය දිය යුතුය යන යෝජනාව කැබිනට් මණ්ඩලය පිළිගෙන ඇත්තේ 1957.11.16 වනද යි[30].

විද්‍යෝදය විද්‍යාලංකාර දෙපිරිවෙනට විශ්වවිද්‍යාලය තත්ත්වය දීමේ අදහසට සාමාන්‍ය මහජනයාගේ සහයෝගය නොමඳව ලැබුණ ද (1) බෞද්ධ හා දේශීය සංස්කෘති විරෝධී ඇතැම් අදෘශ්‍යමාන බලවේග ක්‍රියාත්මක වීමත්, (2) ඒ සමඟම තවත් පිරිවෙන්-වලට එම තත්ත්වය ලබා ගැනීමට ඇතැම් ප්‍රබල භික්ෂූන් කළ ප්‍රයත්නයත්, (3) රජයේ ම සමහර සාමාජිකයන් පිරිවෙන් විශ්වවිද්‍යාලය සංඛ්‍යාව එකකට පමණක් සීමා කිරීමට ගත් උත්සාහයත්,[31] (4) මෙය සසුනේ පිරිහීමට හේතු වෙතැයි අවංකව විශ්වාස කළ ගිහි පැවිදි නායකයන් ටික දෙනකුගේ විරුද්ධතාවත් නිසා එය ක්‍රියාත්මක කිරීම සිතූ තරම් පහසු කාර්යයක් නොවීය. මෙම බාධා මගහැරවීමටත් රජයේ මුල් ප්‍රතිඥාව අප්‍රමාදව ඉටුකරවා ගැනීමටත් විද්‍යෝදය විද්‍යාලංකාර දෙපිරිවෙනට, එක්ව හා වෙන් වෙන්ව ද, සැහෙන අරගල කරන්නට සිදුවිය. මාස ගණනක් නොකඩවා ගෙන ගිය මෙම ප්‍රේරණ ව්‍යාපාරය මෙහෙයවීමේ දී වැලිවිටියේ සෝරත නාහිමියන්ට දිගට ම සහාය වූවෝනම් පලන්-නොරුවේ විමලධම්ම නාහිමි, බලගල්ලේ විමලබුද්ධි හිමි යන පරිවේණාචාර්යවරුය.

---

25. එකල කොළඹ විශ්වවිද්‍යාලය කොලීජියේ අධිපතිව සිටි ආර්. මාර්ස් අනාගත ලංකා විශ්වවිද්‍යාලය සඳහා සැලසුම් සකස් කළවුන් අතුරෙහි ප්‍රමුඛයකු වූ අතර, ශ්‍රීමත් හියු ක්ලිපර්ඩ් ද ඒ සම්බන්ධව විශේෂ උනන්දුවක් දැක්වූවෙකි; ජී. පී. මලලසේකර, '' විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ආරම්භය'', ලංකාවේ අධ්‍යාපනය, සියවස ප්‍රකාශනය, 1969, පිටු 849 සිට.

26. විද්‍යෝදය, 1-11/12 (1926), 445 පිට.

27. පසුව මහාචාර්ය විමල් ජී. බලගල්ලේ.

28. මුද්‍රිත කෙටුම්පත බලන්න: යෝජනා කරන ලද විද්‍යෝදය විශ්වවිද්‍යාලය ආඥාව, බු.ව. 2500 ක්‍රි.ව. 1956.

29. පසුදින හා ඊළඟ දින දිනමිණ, Daily News, ලංකාදීප පත්‍රවල මේ පිළිබඳ ඡායාරූප/වාර්තා පළ විය.

30. xxiii සැසි වාර්තාව, 1968, 11.

31. රජය මුලදී අදහස් කළේ ලංකාවේ විශාලම පිරිවෙන වූ විද්‍යෝදයට පමණක් විශ්වවිද්‍යාලය තත්ත්වය දීම බව ඊරියගොල්ලේ පසුව පාර්ලිමේන්තුවේදී පවසයි. Hansard, Vol. 67, Session 1966-67, Col. 1053; විද්‍යාලංකාරයට පමණක් බව සමහරු කීහ. මෙහිම ආචාර්ය ගුරුගේගේ ලිපිය බ.

මෙහිදී විද්‍යෝදය ආදිශිෂ්‍ය සංගමය වැනි සංවිධානවලත්, දේශපාලනඥයන් ද ඇතුළු වෙනත් විවිධ අනුග්‍රාහකයන්ගේත් උපකාරය සෙවීමට විද්‍යෝදයේ ප්‍රේරණ ව්‍යාපාරය මෙහෙයවූවන්ට සිදු විය.

සමස්ත ලංකා භික්ෂු සම්මේලනය මෙසේ උපකාරයට පැමිණි එක් සංවිධානයකි[32] ප්‍රාචීන පණ්ඩිත උපාධිධාරීන්ගේ සංගමය තවත් එබඳු සංවිධානයකි.[33] විද්‍යෝදය ශාඛා පරිවේණාධිපතිවරුන්ගේ සංගමය[34] මේ කාර්‍ය්‍යය සඳහාම පිහිටුවා ගනු ලැබූ සංවිධානයක් විය. පසුව මෙම ප්‍රශ්නය විද්‍යෝදයට අවාසි වන අතට හැරීගෙන යන බවක් පෙනුණු බැවින්, කැඳවන ලද ශාඛා පරිවේණාධිපතිවරුන්ගේ ද, විද්‍යෝදය ආදි ශිෂ්‍යයන්ගේ ද, සමස්ත ලංකා භික්ෂු සම්මේලනයේ ද, සංඝනායකවරුන්ගේ ද ඒකාබද්ධ රැස්වීමක දී විශ්වවිද්‍යාලය තත්ත්වය දීම එක් පිරිවෙනකට සීමා කරන්නේ නම්, එහි ලා ප්‍රමුඛතාව ලැබිය යුත්තේ විද්‍යෝදයට ම බවට යෝජනාවක් සම්මත කරගනු ලැබූ අතර, තවදුරටත් කටයුතු කිරීම සඳහා යථෝක්ත සංවිධාන සියල්ල නියෝජනය වන කාරක සභාවක් ද පත්කර ගන්නා ලදී[35]. මේ අනුව ගිය කාරක සභා නියෝජිත පිරිසක් 1957.03.26 දින අධ්‍යාපන ඇමතිවරයා හමුවී ඉහත කී යෝජනාව හාරදී පැවැත්වූ සාකච්ඡාවේදී විකල්පයක් වශයෙන් විද්‍යෝදය විද්‍යාලංකාර දෙපිරිවෙනම එක් විශ්වවිද්‍යාලයක මණ්ඩප බවට පත්කිරීමේ අදහස ද අවධානයට යොමුකරන ලද අතර, ඇමතිවරයා කීයේ මෙම මතභේදය අදාළ පණ්ඩිත භික්ෂූන් වහන්සේලා ම එකතු වී විසඳා ගතයුත්තක් බවයි[36].

1957 වර්ෂයේ අවසාන භාගය වනවිට ඉහත අංක 4 සහ 3 වශයෙන් දැක්වූ විරුද්ධතා තාවකාලිකව හෝ බොහෝදුරට යටපත්ව ගියේය. අනුබද්ධායතන පිළිබඳ යෝජනාව අංක 2 විරුද්ධතාවට පිළියමක් විය. එහෙත් පළමුවැන්න අවසන් මොහොත දක්වා ම ක්‍රියාත්මක වූ බවට නීඩහැම් කොමිෂන් වාර්තාවෙන් සාක්ෂ්‍ය ලැබේ.[37] මුලදී ප්‍රකාශ කළ පරිදි ම විද්‍යෝදය විද්‍යාලංකාර දෙපිරිවෙනට විශ්වවිද්‍යාලය තත්ත්වය දිය යුතුය යන යෝජනාව 1957.11.18 වනදා කැබිනට් මණ්ඩලය පිළිගත්තේය. අනතුරුව කෙටුම්පත් පනත සම්පාදනය කරන ලෙස උපදෙස් දෙන ලදී. පසුව පාර්ලිමේන්තුවේ නියෝජිත මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත පිළිබඳ විවාදය ආරම්භ වූයේ 1956.09.16 වනදය.[38]

අධ්‍යාපන ඇමති දහනායක මහතා විවාදය අවසන් කරමින් කළ පිළිතුරු කථාවෙහි එන පහත සඳහන් ප්‍රකාශ පිරිවෙන් විශ්වවිද්‍යාලය ඉතිහාසයත්, ඒ පිළිබඳ රජයේ ආකල්පය හා අරමුණත් සැකෙවින් දක්වයි :

"විද්‍යාලංකාර විද්‍යෝදය යන පිරිවෙන් දෙකට විශ්වවිද්‍යාලය තත්ත්වය දීමේ යෝජනාව ඉදිරිපත් කළේ මහජන රජය පිහිටුවා මාසයකින් දෙකකින් පමණ

32. "වහා කළයුතු යි", දිනමිණ 1956.11.05, 7 පිට.
33. "සරසවි පනත පමාවීම ගැන රටපුරා රැස්වීම් කැඳවීමට යති", ලංකාදීප, 1956.1.08, 7 පිට.
34. විද්‍යෝදය ශාඛා පිරිවෙන් නාම ලැයිස්තුවක් සඳහා බලන්න. විද්‍යෝදයාග්නි වර්ෂපූර්ති වාර්තාව, 1953, පිටු 34-40.
35. "විශ්වවිද්‍යාලය තත්ත්වය විද්‍යෝදය පිරිවෙනට", දිනමිණ, 1957.03.26, 6 පිට.
36. "සරසවි තැන විසඳුම් භික්ෂූන්ට ම බාරයි", ලංකාදීප, 1957.03.27, 1 පිට.
37. Report of the Ceylon University Commission, XXIII Sessional Paper, 1959, Comments by L. J. de S. Seneviratne, annex J, pp. 355 f.
38. Hansard, House of Representatives, 3rd Session 1958–59, Cols. 24 f.

පසුවයි. දැන් දැවුරුදු හාරපස් මාසයක් ගතවී තිබෙනවා. ඒ අතරතුර විද්‍යාලංකාර විද්‍යෝදය සභා කෙටුම්පත් ඉදිරිපත් කළා. ඒ පිරිවෙන් දෙකට විශ්වවිද්‍යාලය තත්ත්වය දීම ගැන අදහස් ප්‍රකාශ කළා''[39]

''විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන් දෙකට විශ්වවිද්‍යාල තත්ත්වය දී අපි අනෙක් පිරිවෙන් අමතක කරන්නේ නැහැ.........මේ කෙටුම්පත් පනතේ 5 වගන්තියේ (4) (5) උප වගන්ති.........[40] විශ්වවිද්‍යාලවල නිර්දේශපත්‍ර අනුව කටයුතු කරන වෙනත් ආයතන ඒ පිරිවෙන් විශ්වවිද්‍යාල දෙකට සම්බන්ධ වෙනවා.[41]

''අපේ ආණ්ඩුව පිහිටුවන අවස්ථාවේ අපට ලැබුණේ අපේ සංස්කෘතිය දියුණු කිරීමේ වරප්‍රසාදය යි............ ඒ නිසා අපේ ආණ්ඩුව පිහිටුවායින් පසුව අප ඉදිරිපත් කළ සිංහලය රාජ්‍ය භාෂාව කිරීමේ පනත අනුව සහ මේ රටේ උගත් භික්ෂූන් වහන්සේ විසින් පවත්වා ගෙන යන මේ පිරිවෙන්වලින් අපට ලබා ගත හැකි උදව්ව, උපකාරය හා සහයෝගය අනුව, අපේ ජාතියත්, අපේ භාෂාවත් හොඳින් ආරක්ෂා කර ගැනීමට......මේ පනත ඉතාමත් සන්තෝෂයෙන් දෙවන වරට ඉදිරිපත් කරනවා.[42]

පාර්ලිමේන්තුවේ මන්ත්‍රී මණ්ඩල දෙක්හිදීම සම්මත වීමෙන් පසු 1958.12.19 වනදා ලකිසුරුගේ අනුමැතිය ලත් මේ පනත හැඳින්වුණේ 1958 අංක 45 දරන විද්‍යෝදය විශ්ව-විද්‍යාලය සහ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය පනත යනුවෙනි.

පනත ක්‍රියාත්මක කළ 1959.01.01 දින සිට බල පවත්වන පරිදි ලකිසුරු තුමන් විසින් වැලිවිටියේ සෝරත නාහිමියෝ ආරම්භක විශ්වවිද්‍යාලයාධිපති (උපකුලපති) වශයෙන් පත් කරනු ලැබූහ.[43] එහෙත්, මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනේ දී ප්‍රථම උපාධි අපේක්ෂකයන් පිරිසට ශිෂ්‍ය වාර්තා පොත් බෙදා දීමෙන් හා උපකුලපතිවරයා විසින් බෞද්ධ සංස්කෘතිය පිළිබඳව දේශනයක් පැවැත්වීමෙන් විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම් කටයුතු ආරම්භ කරන ලද්දේත් එනිසාම විශ්වවිද්‍යාලයීය ප්‍රථම අධ්‍යයන වර්ෂය ආරම්භ වූයේත් 1959.02.18 වනදා ය. එදිනම, මහනාහිමිවරුන් ඇතුළු මහා සංඝයා වහන්සේද, අගමැති අධ්‍යාපන ඇමති ප්‍රධාන මැති ඇමතිවරුන්ද ඇතුළු ගිහිපැවිදි මහජනයාගේ සහභාගිත්වයෙන් 'විශ්වවිද්‍යාලය විවෘත කිරීමේ' උත්සව සභාවක්, නිල බලයෙන් විශ්වවිද්‍යාලයේ වියත්ගණ නායක (කුලපති) වූ ලකිසුරුතුමන්ගේ සභාපතිත්වයෙන් කොළඹ නිදහස් මන්දිරයේ දී පවත්වන ලදී.[44]

විශ්වවිද්‍යාලයේ සමාරම්භයෙහි පටන් මෙතෙක් ගතවූ කාලය තුළ ඇති වූ ප්‍රකටව පෙනෙන ව්‍යූහාත්මක හා පරිපාලනාත්මක වෙනස්කම් සහිත ප්‍රතිසංවිධානයන් නිසා එම පස්විසි වසක කාලය අතුරු කාලපරිච්ඡේද හෙවත් අවධි හතරකට බෙද දැක්විය හැකිය.

---

39. Ibid.Col.91.
40. Ibid. Col. 94.
41. Ibid. Col. 95.
42. Ibid. Col. 99. විශ්වවිද්‍යාලය විවෘත කිරීමේ උත්සවයේ කළ කථාව ද සසඳන්න: මහජන ආණ්ඩුව සහ පිරිවෙන් විශ්වවිද්‍යාල ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ප්‍රකාශන 1959, 29 පිට.
43. 1958.12.19 දින දරන ප්‍රකාශනය බලන්න. ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රය. 1958.12.31.
44. උත්සව සභාව පිළිබඳ විස්තරයක් සඳහා බලන්න. මහජන ආණ්ඩුව සහ පිරිවෙන් විශ්වවිද්‍යාලය, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ප්‍රකාශන, 1959, පිටු 27-29.

| | | | |
|---|---|---|---|
| පිරිවෙන් විශ්වවිද්‍යාලය අවධිය : | 1959 | — | 1966 |
| ජාතික උසස් අධ්‍යාපන සභා : | 1966 | — | 1972 |
| තනි විශ්වවිද්‍යාලය : | 1972 | — | 1978 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම : | 1979 | — | අද දක්වා යනුවෙනි. |

මෙහි කී පිරිවෙන් විශ්වවිද්‍යාලය අවධියෙන් පෙර අදාළ සිදුවීම් ඇතුළත් කාලපරිච්ඡේදය 'ප්‍රාග් විශ්වවිද්‍යාලය අවධිය' යනුවෙන් හැඳින්වීම යෝග්‍ය ය. ඒ අනුව විද්‍යොදය විශ්වවිද්‍යාලයේ සම්පූර්ණ ඉතිහාසය කාලපරිච්ඡේද පසකට බෙදේ :—

## 1. ප්‍රාග් විශ්වවිද්‍යාලය අවධිය :

විද්‍යොදය විශ්වවිද්‍යාලයේ ප්‍රථම අධ්‍යයන වර්ෂය ඇරඹුණේ ඉහත දක්වූ පරිදි 1959.02.18 වනදා වුවද, පිරිවෙන් විශ්වවිද්‍යාලය නෛතික වශයෙන් ඇරඹුණු දිනය වූයේ පනත ක්‍රියාත්මක කළ 1959.01.01 වනදාය. මෙයින් පෙරාතුව කාලපරිච්ඡේදය,—විශේෂයෙන්, එක් අතකින් 1873 දී විද්‍යොදය පිරිවෙන ආරම්භ කළ තැන් පටන් වූ කාලපරිච්ඡේදය, අනෙත් අතින්, ස්වභාෂා මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය දීම රජයේ ප්‍රතිපත්තිය බවට පත් තැන් පටන් වූ කාලපරිච්ඡේදය—, ප්‍රාග් විශ්වවිද්‍යාලය අවධිය වෙයි. එයිනුදු, 1956 දී විද්‍යොදය විද්‍යාලංකාර පිරිවෙන්වලට විශ්වවිද්‍යාලය තත්ත්වය දෙන බවට රජය ප්‍රතිඥාදුන් තැන් පටන් ඉහත 'පූර්වකෘත්‍ය සම්පාදනය I, යටතේ හා පහත ' පූර්වකෘත්‍ය සම්පාදනය II, යටතේ දක්වෙන කටයුතු ඇතුළත්, අවුරුදු 3 ක් පමණ වූ කාලපරිච්ඡේදය **'සමාසන්න ප්‍රාග් විශ්වවිද්‍යාලය අවධිය'** වශයෙන් සැලකිය හැකිය.

විද්‍යොදය විශ්වවිද්‍යාලයේ නිර්මාතෘවරුන් වීම ගෞරවයක් නම්[45] එම ගෞරවයට පාත්‍ර විය යුත්තෝ පාර්ශ්ව දෙකකට අයත් වෙති. එක් අතකින් එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක රජයේ අධ්‍යාපන අමාත්‍ය විජයානන්ද දහනායක මහතා විශ්වවිද්‍යාලය සඳහා අවශ්‍ය බලතල සැපයෙන පනතක් සම්මත කොට ගෙන මුදල් ප්‍රතිපාදන සලස්වා, අවශ්‍ය අවස්ථාවල දී අමාත්‍යාංශ නිලධරයන්ගේ සහායත්වය ලබාදීම් ආදියෙන් අප්‍රමාදව විශ්වවිද්‍යාලයේ කටයුතු ආරම්භ කිරීමට වහල්වීම නිසා මෙම ගෞරවයට පාත්‍ර වෙයි. අනෙක් අතින්, 1956 දී රජය ඉහත කී පිරිවෙන් විශ්වවිද්‍යාලය ප්‍රතිඥාව දුන් තැන් පටන්, ආදර්ශ කෙටුම්පත් පනතක් සාද ඇමතිවරයා වෙත බාරදීමෙන් ද ඉන්පසු පැන නැගුණු විවිධ බාධක මැඩලීම සඳහා ආචාර්‍ය මණ්ඩලයේ දෙතුන් දෙනෙකුගේ ද සහායත්වය ඇතිව ප්‍රේරණ ව්‍යාපාරයක් සාර්ථකව මෙහෙයීමෙන් ද, බාධක ජය ගැනීමෙන් පසු විශ්වවිද්‍යාලයේ කටයුතු තවදුරටත් ප්‍රමාද නොවී ඉක්මනින් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පූර්වකෘත්‍ය සම්පාදනය කිරීමෙන්[46] ද, අනතුරුව, පනත ක්‍රියාත්මක වූ 1959–01–01 දින සිට තමන් වෙත පැවරුණු විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපති පදවිය බාර ගෙන පනතේ විධිවිධාන නිසි ලෙස ක්‍රියාවට නැගීමෙන් ද විද්‍යොදය විශ්වවිද්‍යාලය ප්‍රතිෂ්ඨාපනයට මූලාධාර වූ වැලිවිටියේ සෝරත නාහිමියෝ වැඩියක් එම ගෞරවයට පාත්‍ර වෙති. විවාද රහිතව එකහෙලා මුළු රටේම පිළිගැනීමට ලක් වූ ත්‍රිපිටක බුද්ධ ධර්මය හා සමායාන්තර ඇතුළු ප්‍රාචීන භාෂා විෂයෙහි වූ උන්වහන්සේගේ අප්‍රතිම පාණ්ඩිත්‍යය ද, මෙම විශ්වවිද්‍යාලය නොබෝ කලකින් ම අනෙක් විශ්වවිද්‍යාලය මගින් සම්භාවනීය ලෙස පිළිගනු ලැබීමට මෙන්ම එහි ආයතනික ස්ථාවර භාවයට ද හේතු විය. එසේ හෙයින් විශ්වවිද්‍යාලයේ ප්‍රධාන නිර්මාතෘවරයා වශයෙන් සෝරත නාහිමියන් සලකනු ලැබීම යුක්තියුකත වෙයි.

---

45. මෙය ශාසන හානියක් ලෙස සලකන පිරිසක් ද ඇත.
36. පූර්වකෘත්‍ය සම්පාදනය 11 බලන්න.

## පූර්වකෘත්‍ය සම්පාදනය II

විශ්වවිද්‍යාලය පනතේ විධිවිධාන නිසි ලෙස ක්‍රියාවට නැගීම සඳහා පූර්ව අවශ්‍යතා කීපයක් සපුරා ගතයුතුව තිබුණි. පසුව ස්ථාවර ගොඩනැගිලි තනා ගන්නා තෙක්, විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතු සඳහාත්, පංති පැවැත්වීම ඇතුළු අධ්‍යාපනික කටයුතු සඳහාත්, පුස්තකාලය සඳහාත් තාවකාලිකව ගොඩනැගිලි ඉඩකඩ සපයා ගැනීමත්, පනතේ විධිවිධාන අනුව නියමිත නිලධාරීන් ද ඇතුළුව විශ්වවිද්‍යාලය පවත්වාගෙන යෑම සඳහා ප්‍රාරම්භක වශයෙන් අවශ්‍ය නාඨ්‍යවීය අධ්‍යයන හා අනධ්‍යයන කාර්‍ය මණ්ඩලයක් පත්කර ගැනීමත්, ප්‍රවේශ පරීක්ෂණය ඇතුළුව විශ්වවිද්‍යාලයීය පරීක්ෂණ හා බාහිර උපාධි පරීක්ෂණ පැවැත්වීම සඳහා අවශ්‍ය නියෝග හා නිර්දේශ පත්‍ර ආදිය ප්‍රකාශයට පත්කිරීමත්, විශ්වවිද්‍යාලයට උපාධි අපේක්ෂක හා පශ්චාත් උපාධි සිසුන් ඇතුළත් කර ගැනීමත්, අනුබද්ධායතන අනුමත කිරීම හා ඒවායේ කටයුතු, අනුසන්ධානය කිරීමත්, උපාධි ප්‍රදානෝත්සව පැවැත්වීම ආදී වූ පනතෙහි නියමිත කුදුමහත් කර්තව්‍යයන් සඳහා ව්‍යවස්ථා, අතුරු ව්‍යවස්ථා, නියෝග, රෙගුලාසි ආදිය අප්‍රමාදව නියමිත අධිකාරීන්ගේ මාර්ගයෙන් සම්මත කරවා ගැනීම සඳහා කල්තබා සූදනම් කරගැනීමක් මෙබඳු පූර්වකෘත්‍ය අතුරෙන් සමහරක් විය.

සෝරත නාහිමියන් මෙයින් සමහරක් කටයුතු ඇරඹුවේ පනත් කෙටුම්පත 1958.09. 16 වන දින පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමටත් මාස දෙක තුනකට කලිනි. පනත කෙටුම්පත් කිරීමේ වැඩ 1958 අප්‍රේල් මාසයේ දී අවසන් වූ අතර, එහි පිටපතක් පාර්ලි-මේන්තු විවාදයට කලින්ම සෝරත නාහිමියන් වෙත ද ලැබෙන්නට සලස්වා තිබුණි.

එක් අතකින්, විද්‍යෝදය පිරිවෙන් පාලක සභාව වූ විද්‍යාධාර සභාවේ සාහාය්‍යය ඇතිව, පිරිවෙනේ ගොඩනැගිලි විශ්වවිද්‍යාලය පංති පැවැත්වීමට සුදුසු වන පරිදි නවාංග එක්කිරීම් සහිත ප්‍රතිසංස්කරණයකට භාජන කරන ලද අතර, අනික් අතින් විශ්වවිද්‍යාලය ප්‍රවේශ පරීක්ෂණයට හා උපාධි පරීකෂණවලට අදළ නියෝග හා නිර්දේශ පත්‍ර සම්පාදනය හා ප්‍රවේශ පරීකෂණ සංවිධානය වැනි ශාස්ත්‍රීය කටයුතු ආචාර්‍ය මණ්ඩලයෙහි දෙතුන් දෙනෙකුගේ ද සහායත්වය ඇතිව වහ වහා කරන ලදී. නිල වශයෙන් විශ්වවිද්‍යාලය ආරම්භ වීමෙන් පසු, අධ්‍යාපන අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, 'උපකුලපතිගේ පාලන සහායක' නමින් විශේෂ ධුරයකට පත්කර ගනු ලැබූ ආචාර්‍ය ආනන්ද ගුරුගේ ගේ සහායත්වය මෙම මූලික කටයුතුවල දී ද නාහිමියන්ට සපුරා ලබා ගත හැකි විය. සිංහල හා ඉංග්‍රීසි යන දෙබසින්ම සම්පාදිත වූ ප්‍රවේශ පරීක්ෂණාදිය පිළිබඳ නියෝග හා නිර්දේශ පත්‍ර 1958 සැප්තැම්බර මාසය තුළදීම මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කළ හැකි විය.[47]

විද්‍යෝදය පරිවේණාධිපති වශයෙන් සෝරත නාහිමියන් විසින් 1958.10.15 තෙක් ප්‍රවේශ අයදුම්පත් බාරගන්නා ලද අතර, විද්‍යෝදය පිරිවෙන මගින් නොවැම්බර 10වනද සිට ප්‍රවේශ පරීක්ෂණය පවත්වන ලදී.

## 11 පිරිවෙන් විශ්විද්‍යාලය අවධිය :

පිරිවෙන් විශ්වවිද්‍යාලය අවධිය නියම වශයෙන් ඇරඹෙන්නේ පනත ක්‍රියාත්මක වූ 1959.01.01 දින පටන්ය. එදින සිටම බලපවත්වන පරිදි ආරම්භක විශ්වවිද්‍යාලයාධිපති

47. 1958-60 ප්‍රවේශ පරීක්ෂණාදිය පිළිබඳ නියෝග හා නිර්දේශ පත්‍ර, 1958, ප්‍රාරම්භක වැකිය හා ප්‍රවේශ දින දර්ශන බලන්න.

(උපකුලපති) වශයෙන් වැලිවිටියේ සෝරත නාහිමියෝ (1,3,*4,*7,9,10) ලකිසුරු- තුමන් විසින් පත් කරනු ලැබූහ. උපකුලපති වශයෙන් සෝරත නාහිමියන් ඉටු කළ ප්‍රථම කාර්‍යයන්ගෙන් එකක් වූයේ පීඨයන්හි හා මුඛ්‍ය අධ්‍යයනාංශයන්හි කාර්‍ය සංවිධානය සඳහා අවම අධ්‍යයන කාර්‍ය මණ්ඩලයකුත්, පරිපාලන කටයුතුවලට සහාය කර ගැනීම සඳහා නිලධාරීන් ස්වල්ප දෙනෙකුත් එම දිනයෙහි පටන්ම ක්‍රියාත්මක වන පරිදි බඳවා ගැනීම ය.

පලන්නොරුවේ විමලධම්ම නාහිමි (2, 3*, 4*, 7, 9, 10)
: බුද්ධ ධර්ම මහාචාර්‍ය හා බෞද්ධ අධ්‍යයන පීඨාධිපති.

පරවාහැර වජිරඤාණ නාහිමි (4*, 6, 8, 9, 10)
: දර්ශන මහාචාර්‍ය හා සමය පීඨාධිපති

දෙහිගස්පේ පඤ්ඤාසාර නාහිමි (2, 3*, 4*, 5, 6, 7, 9, 10)
: පාලි මහාචාර්‍ය හා භාෂා පීඨාධිපති (පසුව බෞද්ධ සංස්කෘති මහාචාර්‍ය)

කලුකොඳයාවේ පඤ්ඤාසේඛර නාහිමි (2, 4*, 7, 9, 10)
: සිංහල මහාචාර්‍ය (පසුව 59.5.1. සිට පාලි මහාචාර්‍ය හා භාෂා පීඨාධිපති)

ජී. පී. වික්‍රමාරච්චි (3,4*,8)
: ආයුර්වේද හා විද්‍යා පීඨාධිපති–අර්ධකාලීන (දීමනා රහිත)

එස්. එෆ්. ද සිල්වා (5, 8, 10)
: ඉතිහාස මහාචාර්‍ය හා කලා පීඨාධිපති – අර්ධකාලීන

ආනන්ද ගුරුගේ (5*, 6, 8, 10)
: උපකුලපතිගේ පාලන සහායක

වේරගොඩ අමරමෝලි නාහිමි (3, 4*, 7, 9, 10)
: පුස්තකාලයාධිපති

ඩී. ජේ. කුමාරගේ (5,7,8)
: ලේඛකාධිකාරි

විමල් ජී. බලගල්ලේ (1, 2, 3*, 4*, 5*, 7, 10)
: සහාය ලේඛකාධිකාරි (විභාග), කථිකාචාර්‍ය (සිංහල); (පසුව 59.5.1 සිට අංශ ප්‍රධාන (සිංහල): 59.10.1 සිට සිංහල මහාචාර්‍ය)

ඒ. ඩබ්ලිව්. කලුආරච්චි (7, 8 ,10)
: සහාය ලේඛකාධිකාරි (පාලන)

ඉහත නම් සඳහන් ගිහි පැවිදි භවත්හු මෙයේ බඳවා ගත් අය වූහ. බඳවා ගන්නා විට ඔවුන සතුව තිබුණු අධ්‍යයන විශිෂ්ටතා/සුදුසුකම් වරහන් තුළ අංක සංකේත මගින් දැක්වේ.

1. ප්‍රාචීන ස්වර්ණ මුද්‍රිකාව (භාෂාත්‍රයෙන් ගෞරව පංතියේ ප්‍රමුඛයා)
2. විද්‍යෝදය ශ්‍යාමරාජ ත්‍යාගය (අවසාන විභාගයේ ප්‍රමුඛයා)
3. පණ්ඩිත උපාධිය (3*ගෞරව හෝ ප්‍රථම පංතිය සහිත)
4. විද්‍යෝදය අවසාන විභාගය (4*ගෞරව හෝ ප්‍රථම පංතිය සහිත)
5. විශ්වවිද්‍යාලයීය ප්‍රථම උපාධිය (5*ප්‍රථම හෝ ද්විතීය පංතිය සහිත)
6. විශ්වවිද්‍යාලයීය ආචාර්ය උපාධිය
7. විද්‍යෝදය පිරිවෙනේ ආචාර්ය
8. වෙනත් වෘත්තීය හෝ පරිපාලන සුදුසුකම්
9. ත්‍රිපිටක වාගීශ්වර හෝ වෙනත් ශාසනික සම්මාන
10. ග්‍රන්ථ කර්තෘ.[48]

මෙම න්‍යෂ්ටිය ආචාර්ය හා නිලධාරි මණ්ඩලයට අමතරව අධ්‍යයනාංශයන්හි සංවිධාන කටයුතු හා /හෝ ඉගැන්වීම් කටයුතු සඳහා ආරම්භයෙහිදීම හෝ මුල් මාස කීපය තුළදී තවත් ආචාර්යවරු ටික දෙනෙක බඳවා ගන්නා ලදහ. බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය නාහිමි (මහාචාර්ය – මහායාන බුද්ධධර්මය) හාන්දුපැල්පොළ පුඤ්ඤරතන නාහිමි (පුරාවිද්‍යාව), මිරිස්සේ ගුණසිරි හිමි (බුද්ධ ධර්මය), එල්. එල්.කේ. ගුණතුංග (මහාචාර්ය – ඉංග්‍රීසි), හේම එල්ලාවල (ඉතිහාසය), ලීනස් සිල්වා (ප්‍රමුඛාචාර්ය ආර්ථික හා පරිපාලන විද්‍යා) කේ. පී. ජී. විජයසුරේන්ද්‍ර (සංස්කෘත: පසුව සහාය ලේඛකාධිකාරි), කේ. පී. මුඛර්ජි (මහාචාර්ය – දේශපාලන විද්‍යා) යන විද්වත්හු මෙසේ පූර්ණකාලීන සේවයෙහි ද ටී. එච්. ඩී. අභයගුණවර්ධන (භූගෝල විද්‍යා), ඩී. එම්. හෙට්ටිආරච්චි (අධ්‍යාපන විද්‍යා), ඩී. සී. ගුණවර්ධන (නවීන විද්‍යා), ඇම්. ඇම්. උවයිස් (දෙමළ) ඒ. ඇම්. ඇම්. සහාබ්දීන් (ප්‍රතිචීන දර්ශන) ඩී. පී. ජයසේකර (ගණිතය), එස්. අභයසිංහ (තර්ක න්‍යාය) ආදීහු අර්ධකාලීන සේවයෙහි ද යෙදුණෝය. මුල් අධ්‍යයන වර්ෂය තුළ පූර්ණකාලීන ආචාර්යවරුන්ගේ බලවත් හිඟයක් පැවති නිසා අර්ධකාලීන ආචාර්යවරුන්ගේ මෙන්ම බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ද වැඩිපුර ලබා ගැනීමට සිදුවිය. මෙයට ගැළපෙන පරිදි, මුල් අධ්‍යයන වර්ෂයෙහි විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සතිය අඟහරුවාද පස්වරුවෙහි පටන් ඉරිද ද ඇතුළත් වන සේ සකස් කර ගෙන තිබිණ. සඳුද හා අඟහරුවාද පෙරවරුවත් සතියේ නිවාඩු දවස් විය.

ඉහත දැක්වූ පරිදි 1959.02.18 වනද ඇරඹුණු ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි අවසාන වර්ෂ පංතියට ඇතුළත් කර ගන්නා ලද්දේ විද්‍යෝදය පිරිවෙනේ අවසාන පරීක්ෂණය සමත් වූවන් අතුරෙන් සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගත් දහතර දෙනෙකි. 1958 වර්ෂයද ඇතුළුව විද්‍යෝදය පිරිවෙනේ අවසානය සමත් සිසුන් අතුරෙන් තෝරා ගත් 55 දෙනෙකුගෙන් යුත් ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම වර්ෂ පංතියක් ද, ඉහත සඳහන් කළ ප්‍රවේශ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව තෝරා ගත් 297 දෙනෙකුගෙන් යුත් මධ්‍ය පරීක්ෂණ පාඨමාලා පංතියක් ද මාර්තු 01 වනද පටන් ගත් බැවින්, මුල් අධ්‍යයන වර්ෂය තුළම 366 ක් ශිෂ්‍යයන් සහිත වර්ෂ 3 කට අයත් පංති විශ්වවිද්‍යාලයෙහි විය. අනිවාර්ය සිංහල බෞද්ධ සංස්කෘතිය ද සමඟ විෂය ක්ෂෙත්‍ර 19 ක පාඨමාලා සපයන ලදී.

48. "Origin of the University," First Convocation and Ceremonial Inauguration of the Building Scheme at Gangodawila, 1960, pp. 5f; "Origin of the University," Second Anniversary Souvenir, 1961, pp. 1 f.

ශාස්ත්‍ර සූරි උපාධිය සඳහා 1 ක් ද ශාස්ත්‍රපති උපාධිය සඳහා 9 ක්දැයි පශ්චාත් උපාධි ශිෂ්‍යයෝ 10 දෙනෙක් ද මේ වර්ෂයෙහි ලේඛ්‍යාරූඪ වූහ. විශ්වවිද්‍යාලයේ පංති පැවැත්වීම සඳහා පිරිවෙනේ ගොඩනැගිලි සියල්ල යොද ගත යුතු වූ හෙයින්, පිරිවෙන් අංශයේ පංති තාවකාලිකව නාලන්ද විද්‍යාලයීය ගොඩනැගිලිවල හවස්වරුවේ පවත්වන ලදි.

දෙවන අධ්‍යයන වර්ෂය සඳහා නවක සිසුන් ඇතුළත් කර ගනු පිණිස ප්‍රවේශ පරීක්ෂණයක් 1959 අගෝස්තු මාසයේදී පවත්වන ලද අතර, උපාධි අවසාන පරීක්ෂණය පවත්වන ලද්දේ 1960 අප්‍රේල් මාසයේ ය. අභ්‍යන්තර ශිෂ්‍යයන් 14 දෙනෙකු ද බාහිර ශිෂ්‍යයන් 33 දෙනෙකු ද පෙනී සිටි මෙය, සිංහල මාධ්‍යයෙන් පවත්වන ලද පළමුවන විශ්වවිද්‍යාලය උපාධි පරීක්ෂණය මෙන්ම ලංකාවේ විශ්වවිද්‍යාලයක් මගින් පවත්වන ලද ප්‍රථම බාහිර උපාධි පරීක්ෂණය ද විය.[49] මෙහි ප්‍රතිඵල අනුව ලක්දිව ප්‍රථම වරට බිහිවූ සිංහල මාධ්‍ය උපාධිධරයන්ගේ ගණන 13 ක් වූ අතර ඉන් 11 ක් අභ්‍යන්තර ශිෂ්‍යයෝ වූහ.[50]

විශ්වවිද්‍යාලයේ වාර්ෂික ප්‍රගතිය පිළිබඳව තවදුරටත් සාකච්ඡා කිරීමට පෙර, එහි සම්භවය සිදුවූ ආකාරය හා ආරම්භක අවධියෙහි වූ ව්‍යුහය ද විග්‍රහ කොට බැලීම ප්‍රයෝජනවත් ය.

විශ්වවිද්‍යාලයේ සම්භවය පිළිබඳව ප්‍රධාන මත දෙකක් ප්‍රචලිතව ඇත: එකක් නම් රජය මගින් කරන ලද්දේ විද්‍යොදය පිරිවෙනට විශ්වවිද්‍යාලය තත්ත්වය දීම බවයි; අනෙක නම්, 'විද්‍යොදය' යන ඓතිහාසික නාමය හැරුණු විට, පිරිවෙනට කිසිදු සම්-සම්බන්ධයක් නැති අමුතුම ආයතනයක් 'විද්‍යොදය විශ්වවිද්‍යාලය' නමින් පිහිටුවීම බවයි.

රජයේ මුල් ම ප්‍රතිඥාව වූයේ විද්‍යොදය විද්‍යාලංකාර දෙපිරිවෙනට විශ්වවිද්‍යාලය තත්ත්වය දීම වූ බව ඉහත දක්වන ලදි. අධ්‍යාපන ඇමතිවරයා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් කීයේ ද තමා ''විද්‍යොදය පිරිවෙනට හා විද්‍යාලංකාර පිරිවෙනට විශ්වවිද්‍යාලය තත්ත්වය දීමේ පනත'' ඉදිරිපත් කරන බවයි[51]. විද්‍යාධාර සභාවේ හා විද්‍යොදය පාලක සභාවේ සාමාජිකයකු වූ ද, ඩඩ්ලි සේනානායක රජයේ නියෝජ්‍ය අධ්‍යාපන අමාත්‍ය වූ ද ගාමිණී ජයසූරිය මහතා, 1966 උසස් අධ්‍යාපන පනත් විවාදයේ දී පැවසූ ''විද්‍යොදය විශ්වවිද්‍යාලය විද්‍යොදය පිරිවෙනින් හටගැණුනු පිරිවෙනේ ආභාසයෙන් ම දියුණු වුණු හා තද සම්බන්ධතාවක් ඇති ආයතනයක්''[52] යන වදන්ද එයට පටහැනි නොවේ. එහෙත්, එහිදී කථා කළ ආණ්ඩු පක්ෂයේ වෙනත් සමහර මන්ත්‍රීවරු එයට ඉඳුරා පටහැනි මතය ගත්හ.[53]

''පිරිවෙන් විශ්වවිද්‍යාලය'' සහ ''පිරිවෙන් විශ්වවිද්‍යාලය පනත'' යන නම් ඇමතිවරයා විසින්[54] මෙන්ම වෙනත් අය විසින් ද මේ විවාදයේදීත්[55] ඉන් පසුවත් භාවිත

49. වාර්ෂික පාලන වාර්තාව, II, 1960, 2 පිට.
50. මොවුනතුරෙන් හොඳින් සමත් වූ වැලිගම සීලානන්ද, රත්මලේ ආනන්ද, හුන්දිරාපොළ රතනජෝති යන හිමිවරු තිදෙනා පසුව ආචාර්ය මණ්ඩලයට බඳවා ගන්නා ලදහ.
51. Hansard, 3rd Session, 1958-59, Col. 27.
52. Hansaad ,Vol. 67, 1966-67, Cols. 1468 f.
53. Ibid, ආර්. ප්‍රේමදාස. Col. 1547 f.
54. Ibid., Col. 95
55. Ibid., Cols. 60, 87, 88.

කරන ලද අතර, එය පොදු ජන ව්‍යවහාරය බවට ද පත්විය. විද්‍යෝදය පිරිවෙනේ පාලක සභාව වූ විද්‍යාධාර සභාවේ ද අනුමැතිය ඇතිව විද්‍යෝදය පිරිවෙන මහන්සි ගත්තේ ද එයට විශ්වවිද්‍යාලය තත්ත්වය ලබා ගැනීමට ය. විශ්වවිද්‍යාලය පිහිටවූ පසු එහි ප්‍රථම උපකුලපති වශයෙන් පත්කරනු ලැබුයේ විද්‍යෝදය පරිවේණාධිපතිවරයා ය. ආරම්භක අවධියේ දී ඉගැන්වීම ඇතුළු සියලු කටයුතු කළේද පිරිවෙන් ගොඩනැගිලිවල ය. විද්‍යෝදය පිරිවෙනේ උසස් අධ්‍යාපන අංශයේ ආචාර්යවරුන් සියලු දෙනම පාහේ නව විශ්වවිද්‍යාලයේ විවිධ තනතුරුවලට යෝග්‍යතා අනුව බඳවා ගනු ලැබූ අතර, විශ්ව-විද්‍යාලයීය අධිකාරී මණ්ඩලවල පිරිවෙන් පාලක සභිකයන්ගේ නියෝජනය ද බෙහෙවින් ශක්තිමත් වීමට ඉඩ සලසන ලදි. නිදසුනක් වශයෙන්, විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ පත්කළ සභිකයන් 12 න් 5 ක් ම විද්‍යාධාර සභිකයෝ වූහ.[56] විශ්වවිද්‍යාලයේ උප-කුලපතිවරයා පැවිද්දකු ම වීම[57] විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍යභාවය හා තනතුරු ද පුරුෂ පක්ෂයට පමණක් සීමා කිරීම[58] සාදනු ලබන ව්‍යවස්ථා විනය පිටකයට පටහැනි නොවිය යුතු වීම[59] ආදි වූ සාමාන්‍ය විශ්වවිද්‍යාලයකට නොගැළපෙන විධිවිධාන කීපයක් ද පනතෙහි වේ. පිරිවෙනට විශ්වවිද්‍යාලය තත්ත්වය දුන් බව අඟවන මෙබඳු කරුණු රැසක් ඇත ද, එම මතයට විරුද්ධ වන්නන්ගේ ප්‍රධාන සාධකය නම්, විද්‍යෝදය විද්‍යාලංකාර නමින් විශ්වවිද්‍යාලය දෙකක් පිහිටුවන බව මිස දෙපිරිවෙනට විශ්වවිද්‍යාලය තත්ත්වය දෙන බවක් අදාළ පනතේ කොතැනකවත් සඳහන් නොවීම යි. පනත ඉදිරිපත් කළ ඇමතිවරයා එය හැඳින්වීමේ දී කෙසේ නම් කළත්, පනතෙන් නීත්‍යානුකූලව එම ආයතනවලට ලැබෙන යථාස්වරූපයෙහි වෙනසක් සිදු නොවන බවත්, රජය සිතා මතා ම මෙම නීතිමය ස්වරූපය නව විශ්වවිද්‍යාලයන්ට දී ඇත්තේ ප්‍රතිඥාව ද ඉටුකරන බවක් පෙන්වමින්, ආචාර්ය මණ්ඩලීය අංශයේ සම්පත්වලින් ද උපරිම ප්‍රයෝජන ලබමින් ජාතික වශයෙන් එතරම් ම සීමා නොවූ සේවයකට ඉඩ සලසා ගැනීම සඳහා බවත් එම පක්ෂයේ අදහස යි. විශ්වවිද්‍යාලය පිහිටුවූ පසුව ද විද්‍යෝදය පිරිවෙන දිගටම පවත්වා ගෙන යා හැකි වීමත් මෙය තහවුරු කරන්නක් බව ඔවුහු කියති. විද්‍යෝදය පරිවේණාධිපති සෝරත නාහිමියන් ප්‍රථම උපකුලපති වශයෙන් පත්කරනු ලැබුව ද ඉදිරියටත් එම තත්ත්වය එසේ ම ගෙන යෑමට පනතේ විධිවිධාන සලසා නැති නිසා එය පිරිවෙන විශ්වවිද්‍යාලය තත්ත්වයට නැංවූ බවට සාධකයක් නොවන බව ද පෙන්වා දෙති. විශ්වවිද්‍යාලය තත්ත්වය දුන්නේත් පිරිවෙනේ උසස් අධ්‍යාපන අංශයට පමණක් හෙයින්, එයින් පිරිවෙන දිගටම පවත්වාගෙන යෑමට බාධාවක් නොවිය හැකි බවත්, ආචාර්ය මණ්ඩලයෙන් වුවද විශ්වවිද්‍යාලයට බඳවා ගන්නා ලද්දේ කොටසක් පමණක් බවත්, විද්‍යෝදය පිරිවෙනට විශ්වවිද්‍යාලය තත්ත්වය ලැබීම යුනිවර්සිටි කොලිජිය ලංකා විශ්වවිද්‍යාලය බවට පත්වීම හා ඒකාකාර සේ නොසැලකිය යුතු බවත් අනෙක් පක්ෂය එයට දෙන පිළිතුර යි.

විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ සම්භවය සිදු වූයේ විද්‍යෝදය පිරිවෙනට විශ්වවිද්‍යාලය තත්ත්වය දීමෙන් වුවත් නැතත්, 'පිරිවෙන් විශ්වවිද්‍යාලය' යන නමින් එය හඳුන්වනු ලැබීම අයුක්තිසහගත නොවන බවට නම් පනතෙහි ඇතැම් විධිවිධාන දෙස් දෙයි.[60]

---

56. Act. No. 45 of 1958, Sec. 17 (2) (*b*) (iv).
57. Ibid, Sec. 11 (1)
58. Ibid, Sec. 6 (1).
59. Ibid, Sec. 16 (a)
60. ඉහත; ඡේදය; මෙහි එන ආචාර්ය ගුරුගේ ගේ ලිපිය ද බ.

විශ්වවිද්‍යාලයේ ව්‍යූහය දෙස බලන විට කෝට් සභා, පාලක සභා, සනාතන සභා, පීඨ ආදී අධිකාරි මණ්ඩල එවායේ සාමාජිකත්ව නියෝජනය අතින් ඇති වෙනස්කම් ස්වල්පය හැර, බලතල හා ආනුපූර්විකතාව අතින් විද්‍යොදය විශ්වවිද්‍යාලය ද බොහෝදුරට ලංකා විශ්වවිද්‍යාලයට සමාන බව පෙනී යයි.[61] විද්‍යොදය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලවල ඇති අනුශාසක ධූරය හැරුණු විට කුලපති, සම කුලපති, උපකුලපති ඇතුළු ධූරාවලියෙහි ද මෙම සමානතාව දක්ක හැකිය. 1966 විශ්වවිද්‍යාලය ප්‍රතිසංවිධානය සඳහා පනත් කෙටුම්පත ඉදිරිපත් කළ ඊරියගොල්ල මහතා මේ පිළිබඳව කළ එක් විවේචනයක් වූයේ විද්‍යොදය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය දෙක ලංකා විශ්වවිද්‍යාලය කොපි කොට ඇති බවයි.[62]

පීඨ බෙදීම ද පීඨයන් තුළ අධ්‍යයනාංශයන්ගේ අන්තර්ග්‍රහණය ද සිදු ර ඇති ආකාරයෙහි නම් නව විශ්වවිද්‍යාලයත් පූර්වතරයත් අතරෙහි තරමක වෙනසක් දක්නට ඇත. මෙයින් එක් වෙනසක් උගන්වනු ලබන විෂය ක්ෂේත්‍රයන්ගේ සීමා වීම නිසා අයත්නයෙන් ඇතිවූවකි. වඩා වැදගත් වෙනසක් දකක හැක්කේ ආයතන දෙකෙහිම උගන්වනු ලබන විෂය ක්ෂේත්‍රවලින් සමහරකට නව විශ්වවිද්‍යාලයත් පූර්වතරයත් දී ඇති ප්‍රමුඛතාවේ, නැතහොත් වැදගත්කමේ ප්‍රමාණයෙහි ය.

ලංකා විශ්වවිද්‍යාලයෙහි ප්‍රාචීන භාෂා, කලා (ශාස්ත්‍ර), විද්‍යා, නීති, වෛද්‍ය, කෘෂිකර්ම හා පශු වෛද්‍ය, වාණිජ්‍ය, ඉංජිනේරු යන පීඨ වූ අතර[63] පිරිවෙන් විශ්වවිද්‍යාලය පනතින් ආරම්භයෙහි දී නියමිත වූයේ බෞද්ධ අධ්‍යයන, භාෂා, දර්ශන, ආයුර්වේද යන පීඨයි[64] පනතේ අදාළ වගන්තිය යටතේ සම්පාදිත ව්‍යවස්ථා මගින් විද්‍යොදය විශ්වවිද්‍යාලයෙහි I බුද්ධ ධර්ම, II සමය (දර්ශන), III භාෂා, IV කලා (ශාස්ත්‍ර), V ආයුර්වේද හා විද්‍යා යන පීඨ සංස්ථාපිත විය. විද්‍යොදයේ බුද්ධධර්ම, සමය, භාෂා හා කලා වශයෙන් පීඨ සතරකට බෙදී ගියේ සාමාන්‍යයෙන් ලංකා විශ්වවිද්‍යාලයේ ප්‍රාචීන භාෂා, කලා යන පීඨ දෙකෙහි අන්තර්ගත වූ විෂයවලින් සමහරකි. බුද්ධධර්ම, සමය, භාෂා යන විෂය ප්‍රදේශ සඳහා වෙනම පීඨ පිහිටුවීමෙන් පෙනෙන්නේ අධ්‍යාපනයත් පර්යේෂණයත් අතින් එම විෂය ප්‍රදේශයන්හි විශේෂ දියුණුවක් නුදුරු අනාගතයෙහි මෙම විශ්වවිද්‍යාලය මගින් අපේක්ෂා කළ බවයි.

විද්‍යොදය විශ්වවිද්‍යාලය විවිධ විෂය ශාඛාවන්ට ස්වාධීන අධ්‍යයනාංශ තනත්වය දී තිබූ ආකාරයෙහි ද මෙම වෙනස දක්නට ඇත. මෙම විශ්වවිද්‍යාලයේ ඒ ඒ පීඨ (අධ්‍යයනේන්ද්‍රිය) තුළ වූ ස්වාධීන අධ්‍යයනාංශ මෙසේ විය:

**බෞද්ධ අධ්‍යයන පීඨය:**

I සූත්‍ර II. අභිධර්ම, III. විනය, IV. මහායාන, V. බෞද්ධ සංස්කෘති (පසුව සූත්‍ර අභිධර්ම විනය තුන 'ථේරවාද බුද්ධ ධර්ම' නමින් එක් අධ්‍යයනාංශයක් කරන ලදී.)

---

61. Cf., Ceylon University Ordinance No. 20 of 1942, Sec. 14 and Vidyodaya........Act No. 45 of 1958, Sec. 13.
62. Hansard, Vol. 67, 1966/67, Col. 1054.
63. Ordinance No. 20 of 1942, and Amendment No. 26 of 1943, Sec. 22 (1).
64. Act No. 45 of 1958, Sec. 29 (1)

**සමය (දර්ශන) පීඨය:**

I. ප්‍රාචීන දර්ශන, II. ප්‍රතීචීන දර්ශන.

**භාෂා පීඨය;**

I. සිංහල, II. පාලි, III. සංස්කෘත, IV. නූතන ප්‍රාචීන භාෂා, V. ප්‍රතීචීන භාෂා (ඉංග්‍රීසි ඇතුළුව)

**කලා පීඨය;**

I. ලංකා ඉතිහාසය*, II. භාරත ඉතිහාසය*, III. ලෝක ඉතිහාසය*, IV. පුරාවිද්‍යාව, V. අර්ථශාස්ත්‍රය, .VI භූගෝල ශාස්ත්‍රය, VII. අධ්‍යාපන විද්‍යාව (-පසුව මේ තුනම එක් අධ්‍යයනාංශයක් කරන ලදී. සමාජ මානව විද්‍යාව අලුතෙන් එක් කරන ලදි).

**ආයුර්වේද හා විද්‍යා පීඨය;**

I. ආයුර්වේදය, II. ගණිතය, III. ජ්‍යෝතිර් විද්‍යාව (පසුව නවීන විද්‍යාව අලුතෙන් එක් කරන ලදී. ආයුර්වේදය හා ජ්‍යෝතිර් විද්‍යාව අහෝසි වන්නට හරින ලදි).[65]

පනතෙහි නම් කළ ආයුර්වේද පීඨය[66] වෙනුවට, ඉදිරි කාලයෙහි අංගසම්පූර්ණ විද්‍යා පීඨයක් බවට සංවර්ධනය විය හැකි ආයුර්වේද හා විද්‍යා පීඨයක් පිහිටුවීම දූරදර්ශී පියවරක් සේ සැලකිය හැකිය. සාම්ප්‍රදායික පිරිවෙන් විෂයමාලාවෙහි අංග වූ ආයුර්වේදය හා ජ්‍යෝතිෂය සංස්කෘතික අගය තකා විශ්වවිද්‍යාලය විෂයමාලාවට ඇතුළත් කළ නමුදු, ඒ ගැන උනන්දුවක් දක්වූ බවට සාධක නැත. ඇත්ත වශයෙන්, ඉහත කී පරිදි අධ්‍යාපන ඇමතිවරයාගේ ඉල්ලීම අනුව විද්‍යොදය මගින් 1956 දී ඉදිරිපත් කළ ආදර්ශ කෙටුම්පතෙහි නම් කළ පීඨයන් අතර ආයුර්වේදය නැත. එහි දක්වා ඇත්තේ සමය, භාෂා, කලා, විද්‍යා යන පීඨ හතරය[67]

1959.02.18 වනදා නිකුත් කළ 'පරීක්ෂණ පිළිබඳ නියෝග හා නිර්දේශපත්‍ර' පුස්තිකාවෙහි දක්වෙන පරිදි ආරම්භයෙහි දී ම ඉගැන්වීමට විධිවිධාන යොද තිබුණු විෂය සංඛ්‍යාව 22කි; බුද්ධ ධර්මය, භාරත දර්ශන, ප්‍රතීචීන දර්ශන, තර්ක න්‍යාය, සිංහල, පාලි, ප්‍රාකෘත, සංස්කෘත, දෙමළ, හින්දි, ඉංග්‍රීසි, වාග්විද්‍යාව, ලංකා ඉතිහාසය, භාරත ඉතිහාසය, ලෝක ඉතිහාසය, පුරාවිද්‍යාව, අර්ථශාස්ත්‍රය, භූගෝල ශාස්ත්‍රය, අධ්‍යාපන විද්‍යාව, ගණිතය, ආයුර්වේදය, ජ්‍යෝතිර් විද්‍යාව යනුවෙනි. සිංහල බෞද්ධ සංස්කෘතිය හා ප්‍රායෝගික ඉංග්‍රීසි අනිවාර්ය විෂය වශයෙන් නියමිත විය. (1 පිට). මෙම විෂය මාලාව සමගම එන **''යථා කාලයෙහි නවීන විද්‍යාවන් ඉගැන්වීමටද කර්තව්‍ය සංවිධානය පිණිස විධි විධාන සම්පාදනය කරගෙන යනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය සංවිධායක මණ්ඩලයක් ද දැනටම**

---

65. පරීක්ෂණ පිළිබඳ නියෝග හා නිර්දේශ පත්‍ර 1959-63, 1959, 2 පිට.
66. Act No. 45 of 1958, Sec. 20 (1)
67. යෝජනා කරන ලද විද්‍යොදය විශ්වවිද්‍යාලය ආඥාව, බු.ව. 2500/ක්‍රි.ව. 1956, 26 (1) (ක), 21 පිට.

**පත්කරණු ලැබ සිටී.**" යන ප්‍රකාශයද විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ඉතිහාසය සම්බන්ධයෙන් වැදගත්ය. මෙම ප්‍රකාශය අනුව, ප්‍රථම අධ්‍යයන වර්ෂය තුළදීම, පසුව ඩී. සී. ගුණවර්ධන මහතාට නවීන විද්‍යා පාඨමාලා සංවිධානය පවරන ලදී.

අනෙක් විෂයවල දී කෙසේ වෙතත්, ප්‍රාමාණිකත්වයෙන් පිළිගැනුණු ආචාර්යවරුන්ගේ ප්‍රමුඛත්වයෙන් ඉගැන්වුණු ප්‍රාචීන භාෂා හා බෞද්ධ අධ්‍යයන යන ක්ෂේත්‍රාන්තර්ගත විෂයවල දී නම් උගන්වන ආකාරයෙහි ද ලංකා විශ්වවිද්‍යාලයට වඩා වෙනස්කම් වූ බවට එම පාඨමාලා හා නිර්දේශ පත්‍ර සාධක වෙයි. විසිරුණු සාමාන්‍ය දැනුමට හා කරුණු දැන හෝ නොදැන කරන විවේචනයට වඩා අර්ථාවබෝධයට හා අන්තර්ගත කරුණු වලටත් උගන්නා දේ ගැඹුරු ලෙස හා විචාරාත්මක ලෙස ඉගෙනීමටත් අනුබල දුන් බව පෙනේ. එහෙත් බොහෝ විෂය සම්බන්ධයෙන්, සිංහල, මාධ්‍යයෙන් දේශන හා නිබන්ධන පංති පැවැත්වීම හැරුණු විට, ලංකා විශ්වවිද්‍යාලය ගත් මගින් එතරම් ඈත්වීමට එම පාඨමාලා සංවිධායකවරු එඩිතර නොවූහ: උපාධියට ලැබෙන තත්ත්වය පහත්වීමට එය හේතු විය හැකිය යන අහේතුක බිය නිසාය. මෙම තත්ත්වය පිරිවෙන් විශ්වවිද්‍යාලයවලින් ලංකා විශ්වවිද්‍යාලය තුළ පැවති ගතානුගතික අධ්‍යාපන ක්‍රමයෙහි ප්‍රතිසංස්කරණයක් අපේක්ෂා කළ ඇතැම් අධ්‍යාපනඥයන්ගේ දෙම්නසට හේතු වූ බව පෙනේ[68]. ලංකාවේ විශ්වවිද්‍යාලය විෂය මාලාවෙහි ප්‍රතිසංස්කරණයක් අවශ්‍යය යන අදහස අවුරුදු ගණනක් මුළුල්ලේ සාකච්ඡාවට භාජන වූවකි. නිඩ්හැම් කොමිෂන් වාර්තාවෙහි ද මෙම මතභේදය පිළිබිඹු වේ.[69]

1959 නොවැම්බර් මාසයේ දී පිටවූ මෙම කොමිෂන් සභා වාර්තාවට, ඒ වන විට සමාරම්භක අධ්‍යයනාංශ සංවිධාන කටයුතු අවසන් කරමින් සිටි විද්‍යෝදය විශ්වවිද්‍යාලය කෙරෙහි බලපෑමක් කිරීමට ඉඩක් නොවිය. විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ අධිකාරීන්ට රටේ කාලීන අවශ්‍යතා ගැනත්, කලක් තිස්සේ ලක්දිව උසස් අධ්‍යාපනයෙන් කොන් කරනු ලැබූව ද දේශීය සංස්කෘතිය හා ලංව බැඳුණු විෂය ක්ෂේත්‍ර ගැනත් තරමක වැටහීමක් තිබුණි. එහෙත් එයට කටයුතු කළහැකි වූයේ පවත්නා සම්පත් ප්‍රමාණයට අනුරූපව ය. අප්‍රමාදව, ලක්දිව පළමුවරට 'පරිපාලන විද්‍යා' උපාධි පාඨමාලාවක් හා සාම්ප්‍රදායික සිංහල විෂයයට අමතරව, සෑම අපේක්ෂකයකු ම නිර්මාණාත්මක විචාරාත්මක නිබන්ධයක් ඉදිරිපත් කළ යුතු වූ "නූතන සිංහලය" නම් උපාධි පාඨමාලාවක් ඇතිකිරීමෙන් පාඨමාලා පිළිබඳ කාලෝචිත නවීකරණයන්ට විශ්වවිද්‍යාලය දැක්වූ කැමැත්ත පිළිබිඹු වෙයි. එසේ වුව ද, අධ්‍යාපන ව්‍යවස්ථා සම්පාදකයන්ගේත්, දේශීය වෛද්‍යවරුන් ඇතුළු සම්ප්‍රදාය ගරුක උගතුන්ගෙන් අභිප්‍රාය පරිදි ආයුර්වේද හා ජ්‍යොතිර් විද්‍යා පාඨමාලා ඉදිරිපත් කිරීම වැනි මේ අංශයෙහි කළ ඇතැම් අත්හද බැලීම් පසුව සමහර උගතුන්ගේ හා අධ්‍යාපන බලධරයන්ගේ සමච්චලයට ද ලක්විය.

**විශ්වවිද්‍යාලයීය නව ගොඩනැගිලි:**

ඉහත කී පරිදි එහෙන් මෙහෙන් එක්කිරීම් කීපයක් සමග පිළිසකර කර ගත් විද්‍යෝදය පිරිවෙන් ගොඩනැගිලිවල තාවකාලික වශයෙන් විශ්වවිද්‍යාලයේ පංති

68. J. E. Jayasuriya, "Some Thoughts on the Pirivena Universities," Reprint from The Journal of the National Education Society of Ceylon, Vol. VIII, 4 (1958); සසඳන්න: ජේ. ඊ. ජයසූරිය, "විෂය මාලා සම්පාදනය", විශ්වවිද්‍යාලයීය විෂය මාලාව, සං. කේ. එච්. එම්. සුමතිපාල, 1969, පිටු 36–45.
69. Report of the Ceylon University Commission, Sessional Paper XXIII—1959, pp. 43 f.; Ibid., Comments of Mr. L. J. de S. Seneviratne on the Private Report Submitted by Other Two Members, pp. 279 f.

පැවැත්වුව ද, විශ්වවිද්‍යාලය සඳහා ස්ථාවර ගොඩනැගිලි තැනවීමට සුදුසු වූත්,ආයති සංවර්ධනයට ඉඩ ඇත්තාවූත් භූමි භාගයක් සෙවීමට ද සෝරත නාහිමියන් පටන් ගත්තේ පනත ක්‍රියාත්මක වූ අලුතම ය. ගංගොඩවිල දනට මෙම විශ්වවිද්‍යාලය පිහිටි භූමිභාගය ගැන දැනගන්නට ලැබුණේ මෙසේ මාස ගණනක් තිස්සේ කළ විමසුම් හා පිරික්සුම් වලින් අනතුරුව ය. විද්‍යොදය පිරිවෙනේ ම ආදි ශිෂ්‍යයකු වූ පණ්ඩිත මැදගොඩ සුමනතිස්ස හිමියන්ගේ ආධිපත්‍යයෙන් පාලනය වූද, ශ්‍රී ජයවර්ධනපුර රාජධානි සමයෙහි, සවන සිරිපැරකුම්බා රජු විසින් සිය මෑණියන් නමින් පිහිටුවනු ලැබුවාවූ ද, රටපුරා භාවිතයට අවශ්‍ය ත්‍රිපිටකය ප්‍රධාන පොත්පත් පුස්කොළවල සංවිධානාත්මකව පිටපත් කළ මධ්‍යස්ථානයක් වශයෙන්[70] ඉමහත් ශාස්ත්‍රීය සේවාවක් කළ ආයතනයක් වූද පැපිළියානේ සුනේත්‍රා මහාදේවී පිරිවෙන් විහාරස්ථානය සතුව තිබූ මෙම ඉඩමෙන් අක්කර 25 ක් විශ්වවිද්‍යාලය සඳහා රජය අයත් කර ගන්නවාට එම විහාරාධිපති හිමියන් කැමැත්ත දීම නිසා ඒ පිළිබඳ සෙසු කටයුතු බොහෝ ඉක්මන් විය. අවට වූ තවත් අක්කර 9 ක පමණ ඉඩම් කැබැලි ද පසුව අයත් කර ගන්නා ලදි. ඉඩම අයත් කර ගැනීම පිළිබඳ රජයේ ප්‍රථම ගැසට් නිවේදනය[71] පළවීමෙන් පසුව, නිල වශයෙන්[72] එය බාරදෙන තෙක්ද ප්‍රමාද නොවී, පාලක සභාවේ ද අනුමතිය ඇතිව විශවවිද්‍යාලයීය ගොඩනැගිලි පිළිබඳ පූර්ණ සැලැස්මක් සාද දීමේ කාර්‍යය 'බිලිමෝරියා, ද සිල්වා, පීරිස් සහ පණ්ඩිතරත්න' ගෘහනිර්මාණ ශිල්පී සමාගමට පවරන ලදි.

ගොඩනැගිලි සඳහා රජයෙන් ලැබෙන මුදල් ප්‍රමාණය සීමාසහිත වූ හෙයින් අනවශ්‍ය යකැටයම්, සැරසිලි ආදියෙන් තොරව, සෞන්දර්‍ය පක්ෂයෙන් හානියක් නොවී ප්‍රායෝගික පක්ෂයෙන් උපරිම ප්‍රයෝජනය ලද හැකි පරිදි ගොඩනැගිලි සැලසුම් කරවීම සෝරත නාහිමියන්ගේ අභිප්‍රාය විය. මේ සඳහා ලංකා විශ්වවිද්‍යාලයෙන් ගුරුකම් නොගත හැකි බවත්, ඉන්දියාවේ නව විශ්වවිද්‍යාලය කීපයක ගොඩනැගිලි පිරික්ෂා බැලීම ප්‍රයෝජනවත් විය හැකි බවත් පෙනී ගියෙන්, විද්‍යොදය විශ්වවිද්‍යාලයේ නියෝජිත පිරිසක් ගොස් ඉන්දියානු විශ්වවිද්‍යාලය ගොඩනැගිලි පිරික්සා බැලීමේ චාරිකාවක්, ඉන්දියානු රජයේ ද අනුග්‍රහය ඇතිව පිළියෙල කරන ලදි. 1959.12.01 වනද ලංකාවෙන් පිටත්ව ගොස් දවස් 14ක් ඉන්දියාවේ සැරිසරමින් විශ්වවිද්‍යාලයීය ගොඩනැගිලි පිරික්සා බැලූ මෙම නියෝජිත පිරිස උපකුලපති වැලිවිටියේ සෝරත නාහිමි, මහාචාර්‍ය විමල් බලගල්ලේ, ලේඛකාධිකාරි ඩී. ජේ. කුමාරගේ යන භවතුන්ගෙන් හා පණ්ඩිතරත්න, ආදිත්‍ය යන ගෘහනිර්මාණ ශිල්පීන් දෙදෙනාගෙන් ද සමන්විත විය. මෙම චාරිකාවෙන් පසු සති කීපයක් ඇතුළත ගෘහනිර්මාණ ශිල්පීහු ගොඩනැගිලි සැලසුම් නිමහම් කොට ඉදිරිපත් කළහ. [73]

විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි වැඩ ආරම්භ කරන ලද්දේ 1960.01.18 වනද පෙරවරු උපකුලපති නාහිමියන්ගේ ආරාධනය පරිදි ආනන්ද ගුරුගේ මහතා විසින් පළමු පස්පිඩැල්ල කැපීමෙනි..[74] සෝරත නාහිමියන් විසින් උපකුලපති නිවසට මුල්ගල් තැබීම ද එදිනම කරන ලදි.

---

70. එච්. ඩබ්ලියු. කොඩ්රිංටන්, ''පැපිළියාන පිළිබඳ ලිපි සමහරක්'', විද්‍යොදය ධර්මශාස්ත්‍රීය සංග්‍රහය,1 (1926), පිටු 295-299, 374-377, 413-417.

71. 1959.07.20 වනද.

72. 1960.01.12 වනද.

73. මෙම විශ්වවිද්‍යාලයේ ශ්‍රී සුමංගල මන්දිරය සැලසුම් කොට ඇත්තේ එවකට අවසන් වෙමින් පැවති කේරළ විශ්වවිද්‍යාලයේ පුස්තකාලය ගොඩනැගිල්ලට අනුරූපව ය.

74. වාර්ෂික පාලන වාර්තා II, 1960, 6 පිට.

1960.08.07 වන දිනට නියමිත වූ විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි ප්‍රදානෝත්සවය[75] සඳහා මේ වර්ෂයේ දී ගොඩනංවන ලද ශාලාව පසුව ස්ථාවරත්වයට පැමිණවීමෙනි බණ්ඩාරනායක ශාලාව බිහිවූයේ. 1960.08.07 වන දිනම පෙරවරුයෙහි මල්වතු අස්ගිරි මහානාහිමිවරුන්ගේ හා අග්‍රාණ්ඩුකාර තුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවති උත්සවයක දී විහාර මන්දිරය, ශ්‍රී සුමංගල මන්දිරය, රතනසාර මන්දිරය, ඥානේශ්වර මන්දිරය, ධර්මපාල මන්දිරය, හේවාවිතාරණ මන්දිරය යන ගොඩනැගිලිවලට මුල්ගල් තබන ලදි.

විශ්වවිද්‍යාලය භූමියෙහි තිබූ පැරණි ගොඩනැගිල්ලත් (R.A.F. Building) පිළිසකර කොට 1961.09.29 වනද විශ්වවිද්‍යාලය කාර්‍යාලය එහි ගෙන යන ලදි. ගංගොඩවිල නව ගොඩනැගිලිවලට පිවිසීමේ උත්සවය 1961.11.22 වනද සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. මාලිගාකන්දේ විද්‍යෝදය පරිවෙණ ස්ථානයේත්, රාජකීය විද්‍යාලය මාවතේත් පවත්වා ගෙන ආ පංති ද පුස්තකාලය ද ඇතුළු විශ්වවිද්‍යාලයේ සියලු අංශ මේ වර්ෂය තුළදී නව ගොඩනැගිලිවලට ගෙන යා හැකි විය.

1962/63 වර්ෂයේ දී කලින් පටන්ගත් ගොඩනැගිලි වැඩ අවසන් වෙමින් පැවති අතර, අමුත්තන්ගේ නිවාසය, විනේතෘ නිවාසය ශිෂ්‍ය නිවාස භෝජනාගාර යන ගොඩනැගිලි කීපයක තැනීම් කටයුතු පටන් ගන්නා ලදි. තවත් අක්කර 14 ක් පමණ යාබද ඉඩම් ද අත්පත් කරගත හැකි වීම නිසා විශ්වවිද්‍යාලය භූමිය ද අක්කර 48½ ක් විශාල විය. 1964/65 වර්ෂ වන විට ඉහත කී ගොඩනැගිලිවලින් බොහොමයක් නිමවෙමින් පැවතිණ. මෙම ගොඩනැගිලි මගින් වර්ග අඩි 12000 ක වූ බණ්ඩාරනායක ශාලාවට අමතරව, දේශන ශාලා පංති කාමර සඳහා වර්ග අඩි 44000 කද, පුස්තකාල සඳහා වර්ග අඩි 136000 කද, නේවාසිකාගාර සඳහා වර්ග අඩි 44000 කද ඉඩ ප්‍රමාණයක් ලැබිණ[76]. 1965/66 වර්ෂයේ දී ක්‍රීඩා පිටිය තැනීම ආරම්භ කරන ලදි. විශ්වවිද්‍යාලය මුද්‍රණාලය පිහිටුවන ලද්දේ ද මෙම වර්ෂයේ දී ය. මේ අනුව බලන විට පිරිවෙන් විශ්ව විද්‍යාලය අවධිය ගොඩනැගිලි අංශයෙන් සැහෙන දියුණුවක් ලැබූ කාලපරිච්ඡේදයක් බව පෙනේ.

**ශිෂ්‍ය සංඛ්‍යා වර්ධනය :**

විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන කටයුතු ආරම්භ කළ 1959.02.18 වනද ශාස්ත්‍රවේදී අවසාන වර්ෂ පාඨමාලාවට ඇතුළත් කර ගනු ලැබූ සිසුන් 14දෙනා ද ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි 1 වර්ෂයට 55 ක් හා මධ්‍ය පරීක්ෂණ පාඨමාලාවට 297 ක් දැයි 1959.03.02 වනද ඇතුළත් කරගනු ලැබූ 352 දෙනාද, පශ්චාත් උපාධි සිසුන් 10 දෙනෙකු ද යනුවෙන් ප්‍රථම අධ්‍යයන වර්ෂයේ දී අධ්‍යයනය ලැබූ මුළු අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව 376 ක් වූ බව ඉහත දැක්විණ. මෙයින් 283 ක්ම භික්ෂූහු වූහ. ද්විතීය අධ්‍යයන වර්ෂයේ (1960) දී මෙම ශිෂ්‍ය සංඛ්‍යාව භික්ෂූන් 272 ක් ඇතුළුව 501 තෙක් ද[77] තෘතීය අධ්‍යයන වර්ෂයේ (1960/61) දී භික්ෂූන් 250 ක් ඇතුළුව 990 තෙක් ද[78] චතුර්ථ අධ්‍යයන වර්ෂයේ (1961/62)

75. විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි ලාභීන් 11 දෙනාටද, සම්මාන උපාධි ලාභීන් 15 දෙනකුට ද මෙදින උපාධි ප්‍රදානය කරන ලදි: ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි ප්‍රදානෝත්සවය, සම්මාන උපාධි, 1960.08.07; මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනෝත්සවය හා ප්‍රථම උපාධි ප්‍රදානෝත්සවය; First Cinvocation and Ceremonial Inauguration of the Building Scheme at Gangodawila, Sunday, 7th August, 1960.
76. ලංකාවේ අධ්‍යාපනය, සියවස ප්‍රකාශනය, 1969, 864 පිට.
77. වාර්ෂික පාලන වාර්තාව II–1960.
78. වා.පා.වා. 1960/61.

දී භික්ෂූන් 254 ක් ඇතුළුව 1070 තෙක් ද[79] (1961/62), පඤ්චම අධ්‍යයන වර්ෂයේ (1962/63) දී භික්ෂූන් 290 ක් ඇතුළුව 1165 තෙක් ද[80] ෂෂ්ඨ අධ්‍යයන වර්ෂයේ (1963/64) දී භික්ෂූන් 366 ක් ඇතුළුව 1396 තෙක් ද[81] සප්තම අධ්‍යයන වර්ෂයේ (1964/65) දී භික්ෂූන් 407ක් ඇතුළුව 1492 තෙක් ද[82] අෂ්ටම අධ්‍යයන වර්ෂයේ (1965/66) දී භික්ෂූන් 342 ක ඇතුළුව 1649 තෙක් ද[83] අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය විය. අභ්‍යන්තර ශිෂ්‍යයන් සියලු දෙනා ම පිරිමි වූ ඉතර, බාහිර සිසුන් අතරෙහි කාන්තාවෝද වූහ. අනුබද්ධායතන හා බාහිර සිසුන් සංඛ්‍යාවෙහි ද ක්‍රමික වර්ධනයක් මේ අවධියෙහි දක්ක හැකිය.

**පාඨමාලාවල ප්‍රගතිය:**

මේ කාලපරිච්ඡේදය තුළ අධ්‍යයනාංශ හැම එකකම පාහේ පාඨමාලා වරක් හෝ දෙකක් සංශෝධනයට හා නවීකරණයට භාජනය විය. සමාරම්භයේ දී විශ්වවිද්‍යාල-යෙහි වූ අධ්‍යායනාංශ හා සපයන ලද පාඨමාලා ඉහත දක්වන ලදී. ලංකාවේ විශ්ව-විද්‍යාලයක පළමුවරට, මෙම විශ්වවිද්‍යාලයේ සිංහලාංශය යටතේ, ලේඛන කලාවට සහ සාහිත්‍ය නිර්මාණයට උපාධි අපේක්ෂකයන්ගේ කොටසක් යොමු කිරීමේ අරමුණින් ද්විතීය අධ්‍යයන් වර්ෂාරම්භයේ (1960) දී පටන් ගත් 'නූතන සිංහලය' උපාධි පාඨමාලාව නව අත්හද බැලීමක් විය.

තෘතීය අධ්‍යයන වර්ෂාරම්භයේ දී ආර්ථික විද්‍යාව අධ්‍යයනාංශය යටතේ, ප්‍රමුඛා-චාර්ය ලීනස් සිල්වාගේ මෙහෙයීමෙන්, ලංකාවේ විශ්වවිද්‍යාලයක පළමුවරට මෙම විශ්වවිද්‍යාලයෙහි පටන් ගත් රාජ්‍ය හා ව්‍යාපාර පරිපාලන විද්‍යා උපාධි පාඨමාලාව අතිශය කාලෝචිත වූවක් බව පිළිගැනිණ. මෙම පාඨමාලාව සඳහා ප්‍රාරම්භක වශයෙන් සිසුන් 354 ක් ඇතුළත් කරගන්නා ලදින්, පංති පැවැත්වීමට පිරිවෙන් ගොඩනැගිලි ඉඩ මද බව පෙනුණු හෙයින්, කොළඹ 7, රාජකීය මාවතේ (එකල රේස්කෝස් ඇවනියු) අංක 3/1 දරන මන්දිරය කුලියට ගෙන 1960 දෙසැම්බර මාසයේ දී එම අංශය එහි ගෙන යන ලදී.[84] 1961 වර්ෂාවසානයේ දී නැවත එය විශ්වවිද්‍යාලයේ වෙනත් අංශ ද සමඟ ගංගොඩවිල නව ගොඩනැගිලිවලට ගෙන යන ලදී. පසුව මෙම විෂය ශාඛාව ආර්ථික විද්‍යා අංශයෙන් වෙන්ව ස්වාධීන අධ්‍යායනාංශයක් බවට ද තවත් පසු කලෙක ස්වාධීන පීඨයක් බවට ද සංවර්ධනය විය.

ආචාර්ය පී. ඊ. පී. දැරණියගලගේ සංවිධායකත්වයෙන් තෘතීය අධ්‍යයනවර්ෂයේදී ඇරඹුණු සමාජ මානවවිද්‍යා උපාධි පාඨමාලාව ද ලංකාවේ විශ්වවිද්‍යාලයක ප්‍රථම-යෙන්ම සැපයුණු මානව විද්‍යා පාඨමාලාව බව පෙනේ.

ආරම්භයෙහි පටන් මුල් අධ්‍යයන වර්ෂ හතරේ දී අධ්‍යාපන විද්‍යාව උගන්වන ලද්දේ සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි විෂයයක් වශයෙන් පමණි. පස්වන අධ්‍යයන වර්ෂයේ දී

79. වා.පා.වා. 1961/62.
80. වා.පා.වා. 1962/63.
81. වා.පා.වා. 1963/64.
82. වා.පා.වා. 1964/65.
83. වා.පා.වා. 1965/66: ලංකාවේ අධ්‍යාපනය, අ.සි., 1969, 864 පිට.
84. Information Concerning the Degrees in Economics, Business Administration and Public Administration 1960-61, pp. 7-8.

ගුරුවරුන් සඳහා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් ද ආරම්භ කරන ලදි[85] බෞද්ධ අධ්‍යයන පීඨය ද අධ්‍යාපන විද්‍යා අංශයේ සහයෝගය ඇතිව උපාධිධාරී නොවන ගුරුවරුන් සඳහා බුද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර පාඨමාලාවක් පැවැත්වීම චතුර්ථ අධ්‍යයන වර්ෂයේ දී ආරම්භ කෙළේය[86].

විශ්වවිද්‍යාලයෙහි නවීන විද්‍යා අධ්‍යාපනය දියුණු කිරීමට ප්‍රථම උපකුලපතිවරයා දැක්වූ උනන්දුව ගැන ඉහත දක්වන ලදි[87]. විශ්වවිද්‍යාලය ආරම්භයේ දී නිකුත් කළ නියෝග හා නිර්දේශ පත්‍ර (1959-63) අනුව ආයුර්වේදය, ගණිතය, ජ්‍යෝතිර් විද්‍යාව යනුවෙන් 'ආයුර්වේද හා විද්‍යාපීඨය' යටතේ දැක්වූ උපාධි පාඨමාලා 3ක් වූ අතර, ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය සඳහා ඉන් විෂය එකක් හෝ දෙකක් ගත හැකිවිය. විධිමත් පාඨමාලා පැවැත්වීමක් සිදු නොවූ ආයුර්වේදය, ජ්‍යෝතිර් විද්‍යාව යන විෂය ද්වය, පසුව විශ්වවිද්‍යාලයීය උපාධි විෂය මාලාවෙන් බැහැරව ගියේය.

විද්‍යා උපාධි පාඨමාලාවක් වශයෙන් නොව, කලා උපාධි අපේක්ෂකයන්ගේ සාමාන්‍ය ඥානය සඳහා 'නවීන විද්‍යා' උපාධි පාඨමාලාවක් ද, ප්‍රථම අධ්‍යයන වර්ෂයේදී ම පැවැත්වීමට විධිවිධාන යොදන ලදි. පසුව, එම වර්ෂය තුළදීම නවීන විද්‍යා අධ්‍යයනාංශයක් පිහිටුවා යථෝක්ත නවීන විද්‍යා පාඨමාලාව පැවැත්වූ ආචාර්ය ඩී. සී. ගුණවර්ධන එහි ප්‍රමුඛාචාර්ය ධුරයට පත් කොට, විද්‍යා උපාධි සඳහා පාඨමාලා සංවිධානය කිරීම භාර කරනු ලැබීය. එහෙත් සම්පත් හිඟය නිසා නවීන විද්‍යා අංශයෙහි දියුණුව සිදු වූයේ ඉතා ටෙමිනි. විශ්වවිද්‍යාලය ගංගොඩවිලට ගෙන යන තුරුම විද්‍යාගාරයක් සඳහා ඉඩකඩ ලබාගත නොහැකි විය. 1961 අවසාන භාගයේ දී ශ්‍රී සුමංගල මන්දිරයේ පහත මාලයේ කොටසක ප්‍රථම විද්‍යාගාරය පිහිටුවන ලදි[88]. 1961 ඔක්තෝබර මාසයේ පවත්වන ලද විද්‍යා ප්‍රවේශ පරීක්ෂණයකින් තෝරා ගත් සිසුන් 15 දෙනෙකුගෙන් යුත් විද්‍යා උපාධි මධ්‍ය පරීක්ෂණ පංතිය පළමුවරට ආරම්භ කළේ 1962.03.01 වනදය. මෙම වැඩ පිළිවෙළ යටතේ, විද්‍යා උපාධි අපේක්ෂකයන්ට, විද්‍යාවේදී උපාධිය සඳහා, මුල සිටම පැවති ගණිත විෂය ද ඇතුළුව භෞතික විද්‍යා, රසායන විද්‍යා, උද්භිද විද්‍යා යන පාඨමාලා හැදෑරීමට පහසුකම් සැලසිණ.[89] මුලදී සත්ත්ව විද්‍යාව උගන්වා නැත්තේ බෞද්ධ ජනතාවගේ අප්‍රසාදයට ලක්විය හැකි බැවිනි.[90] 1962/63 සහ 1963/64 වර්ෂවලදී තවත් එක් පූර්ණකාලීන සහකාර කථිකාචාර්යවරයකු බැගින් බඳවා ගන්නා ලද අතර, සමහරක් පාඨමාලා සඳහා බාහිර කථිකාචාර්ය සේවය ලබා ගන්නා ලදී. 1963/64 වර්ෂයේ දී විද්‍යා සිසුන්ගේ ගණන 26 තෙක් ද, 1964/65 වර්ෂයේ දී 47 තෙක් ද වර්ධනය විය. විද්‍යා මධ්‍ය, විද්‍යාවේදී I, විද්‍යාවේදී II යනුවෙන් මේ වන විට විද්‍යා ශිෂ්‍යයෝ වර්ෂ තුනකට අයත් වූහ. 1963/64 අධ්‍යයන වර්ෂාවසානයේදී මහාචාර්ය ඩී.සී. ගුණවර්ධන විශ්‍රාම ගත් පසු ජී. එන්. නානායක්කාර මහතා එම අංශයෙහි වැඩ බැලීමට පත් විය. 1964/65 අධ්‍යයන වර්ෂයේ දී ෆුල්බ්‍රයිට් මහාචාර්යවරයකු වූ ආචාර්ය ඩී. එන්. ඩෙලනිගේ සේවය ද විද්‍යා අංශයට ලැබුණේය.

විද්‍යා අංශයේ අධ්‍යාපනය වඩාත් ක්‍රමවත් වූයේ ආචාර්ය ජී. ඩී. එන්. ජයසූරිය 1965.05.01 දින පටන් රසායන විද්‍යා මහාචාර්ය තනතුරට හා භෞතික විද්‍යා අධ්‍යය-

85. වා.පා.වා. 1962/63, 37 පිට.
86. බුද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර පරීක්ෂණය, 1962–65, නියෝග හා නිර්දේශ බ.
87. ඉහත 17 පිට බලන්න.
88. වා.පා.වා. iii–(1960–61), 3 පිට.
89. වා.පා.වා. iv–(1961–62), 35 පිට.
90. වා.පා.වා. iii, (1960–61), 3 පිට.

නාංශ ප්‍රධාන තනතුරට පත් වීමෙන් පසුවය. භෞතික විද්‍යා අධ්‍යයනාංශය බිහි වූයේ 1964/65 වර්ෂයේ දී කරන ලද විද්‍යා අධ්‍යයනාංශ ප්‍රතිසංවිධානයෙනි.[91] එම ප්‍රතිසංවිධානය අනුව ගණිත, භෞතික විද්‍යා, ජෛවීය විද්‍යා යනුවෙන් අධ්‍යනාංශ ගණන 3 ක් විය. 1965.06.01 දින ආචාර්ය ඒ. සී. ජේ. වීරකෝන් සත්ත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (පසුව නොවැම්බර් මාසයේ දී මහාචාර්ය) ධූරයට හා ජෛවීය විද්‍යා අංශ ප්‍රධාන ධූරයට පත් කර ගන්නා ලදී. කේ. ටී. සෝමරත්න මහතා ගණිත විද්‍යා අංශයෙහි වැඩ බලනප්‍රධානයා විය. පසුව ප්‍රතිසංවිහිත විද්‍යා පීඨයෙහි ප්‍රථම පීඨාධිපති ධූරය ද මහාචාර්ය ජී. සී. එන්. ජයසූරිය වෙත පැවරිණ.

**පරිපාලනය:**

විශ්වවිද්‍යාලයේ ආරම්භක උපකුලපතිවරයා විසින් පත්කර ගනු ලැබූ ජ්‍යෙෂ්ඨ අධ්‍යාපන/පරිපාලන නිලධර මණ්ඩලය ගැනත් අංශ ප්‍රධානයන් ගැනත් ඉහත සඳහන් කරන ලදී. විශ්වවිද්‍යාලයේ අධිකාරි මණ්ඩල අතුරින් එහි පරිපාලනයට කෙළින්ම වගකිව යුතු පාලක සභාවට අයත් වූ ප්‍රථම සාමාජික පිරිස නම් නිල බලයෙන් පත් වූ උපකුලපති හා පීඨාධිපතිවරු, රාජනීතිඥ එන්. ඊ. වීරසූරිය, එච්. ජිනදාස (C.C.S), ආචාර්ය ආනන්ද ගුරුගේ (C.C.S), ඩී. බී. ජයසේකර, එල්. එල්. කේ. ගුණතුංග, ශ්‍රීමත් ලලිත රාජපක්ෂ, සී .ඩී. ඒ. ගුණවර්ධන, විද්‍යාධාර සභිකයෝ 5 දෙනෙක් (එනම්, ගාමිණී ජයසූරිය, සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර, මුදලි ඊ. ඒ. අබේසේකර, විමල ධර්ම හේවාවිතාරණ සහ ආචාර්ය ඒ. ඇම්. සමරසිංහ) යන භවත්හුය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් විශ්වවිද්‍යාලයේ තනතුරු නොදැරිය යුතු බවට රජය කළ තීරණයක් අනුව අර්ධකාලීන වශයෙන් විශ්වවිද්‍යාලයේ සේවයෙහි යෙදී සිටි ආචාර්ය ආනන්ද ගුරුගේ, එස්. එෆ්. ද සිල්වා, ඩී. එම්. හෙට්ටිආරච්චි ආදීහු 1961 දී විශ්වවිද්‍යාලයේ තනතුරුවලින් ඉල්ලා අස්වූහ. ගුරුගේ මහතාගේ ඉල්ලා අස්වීමෙන් පසු උපකුලපතිගේ පාලන සහායක ධූරය ද අහෝසි විය. එම වර්ෂයේ දී ම ඊ. එච්. දිසානායක මහතා සහාය ලේඛකාධිකාරි ධූරයටත්, සංස්කෘත අංශයේ සිටි කේ. පී. ජී විජයසුරේන්ද්‍ර මහතා සහාය විභාගාධිකාරි ධූරයටත් පත්කරනු ලැබූහ. ඩී. ජේ. කුමාරගේ මහතා සිවු අවුරුදු සේවයකින් පසු 1963 වර්ෂාරම්භයේ දී ලේඛකාධිකාරි ධූරයෙන් විශ්‍රාම ගත්තේ ය. 1964 දී හේමචන්ද්‍ර ගුණසේකර මහතා ලේඛකාධිකාරි ධූරයට පත්විය. 1965 දී පී. සුබසිංහ මහතා ගණකාධිකාරි ධූරයටත්, ඩී. ඇස්. අබේසිංහ මහතා සහාය ලේඛකාධිකාරි ධූරයටත් පත්වූහ.

ආරම්භක උපකුලපති සෝරත නාහිමියෝ 1963.07.17 වනද අපවත් වූහ. උන් වහන්සේගේ ආදාහනෝත්සවය විශ්වවිද්‍යාලය භූමියෙහි දී රටේ ආගමික හා රාජ්‍ය නායකයන් ප්‍රධාන දශසහශ්‍ර සංඛ්‍යාත ජනතාවගේ සහභාගිත්වය ඇතිව අත්‍යුත්කර්ෂයෙන් පැවැත්විණ. ඉන් පසු උපකුලපති ධූරයට පත්වූයේ බෞද්ධ අධ්‍යයන පීඨාධිපති ධූරය දැරූ පළන්නොරුවේ විමලධම්ම නාහිමියෝ ය. උන්වහන්සේ 1966.03.07 වනද අපවත් වූ අතර, පරවාහැරවජිරඥාණ නාහිමියෝ ඉන් පසු වැ.බ. උපකුලපති පදවියට පත්වූහ. 1963 දී විමලධම්ම නාහිමියන් උපකුලපති ධූරයට පත්වීමෙන් හිස් වූ බෞද්ධ අධ්‍යයන පීඨාධිපති ධූරයට පත් වූයේ බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නාහිමියෝ ය. 1964 දී කලුකොඳයාවේ පඤ්ඤාසේඛර නාහිමියන් භාෂා පීඨාධිපති ධූරයෙන් ඉල්ලා අස් වූ අතර, මහාචාර්ය විමල් බලගල්ලේ එම ධූරයට පත්විය. 1961 දී එස්. එෆ්. ද සිල්වා මහතාගේ ඉල්ලා

91. වා.පා.වා. 1964/65, 48 පිට.

අස්වීමෙන් හිස්වූ කලා පීඨාධිපති ධුරයට පත් වූයේ ආචාර්ය පී. ඊ. පී. දැරණියගල ය. 1964 දී ඔහු විශ්‍රාම ගිය පසු එම ධුරයට මහාචාර්ය මුඛර්ජී පත් විය. ඉතිහාස අධ්‍යයනාංශ ප්‍රධාන හේම එල්ලාවල, අධ්‍යාපන විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධාන එල්. ජී. හේවගේ යන මහත්වරු 1965 දී මහාචාර්ය පදවි ලැබූවෝය.

**පුස්තකාලය:**

උසස් අධ්‍යාපනයත් පර්යේෂණ කටයුතුත් සඳහා හොඳ පුස්තකාලයක ඇති වැදගත්කම අත්දැකීමෙන් දන සිටි සෝරත නාහිමියන් විශ්වවිද්‍යාලයේ පුස්තකාලය කෙරෙහි දැක්වූ උනන්දුව කෙතෙක් ද යනු නව විශ්වවිද්‍යාලයීය ගොඩනැගිලි සැලසුම් කිරීමේදී ගෘහනිර්මාණ ශිල්පීන් සමග ඉන්දියාවේ නව විශ්වවිද්‍යාලය කීපයක පුස්තකාලය ගොඩනැගිලි පිරික්සා බලා ඒ සඳහා අවශ්‍ය මූලික උපදෙස් දීමෙනුත්,[92] ගොඩනැගිලි තැනීමේදී පුස්තකාලය වශයෙන් මුලදී සැලසුම් කළ ශ්‍රී සුමංගල මන්දිරයට ප්‍රමුඛස්ථානය දීමෙනුත් පැහැදිලි වේ. ආරම්භයෙහි පටන් පුස්තකාලයාධිපති ධුරය දැරුවේ වේරගොඩ අමරමෝලි නාහිමියෝය. 1960 දී මඩිතියවල සුමංගල හිමි සහාය පුස්තකාලයාධිපති ධුරයට පත් විය. එම වර්ෂයේ ම සහාය පුස්තකාලයාධිපති වශයෙන් සේවයට බැඳුණු ඩබ්ලිව්. බී. දෙරකුඹුර මහතා පුස්තකාලය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පුහුණුව සඳහා කැනඩාවට යවන ලදුව, 1963 දී පෙරළා පැමිණ වැඩ භාරගත්තේය. මේ අතරතුර කාලයේ දී තිස්ස රාජපතිරණ (මාස කීපයක්), ප්‍රේමරත්න අබේසේකර (1963 දී සහාය ලේඛකාධිකාරි ධුරයට පත්වන තෙක්) යන භවත්හු ද සහාය පුස්තකාලයාධිකාරීන් ලෙස සේවය කළහ.

1961 දී ගංගොඩවිලට පුස්තකාලය ගෙන එන විට 10000 ක් පමණ වූ එහි පොත් සංඛ්‍යාව 1966 වන විට 35500 කට ආසන්න විය. දුර්ලභ පොත් සහිත වූ මහවලතැන්න පුස්තකාලය වැනි පුද්ගලික පුස්තකාලය කිහිපයක පොත් පරිත්‍යාග වශයෙන් ලැබීම එහි වටිනාකම අධික වීමට හේතු වී ඇත.

**පර්යේෂණ හා ශාස්ත්‍රීය කටයුතු:**

විද්‍යෝදය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය මගින් පළමු කොටත්, ලංකා විශ්වවිද්‍යාලය මගින් ඉන් අනතුරුවත් සිංහල මාධ්‍යයෙන් උසස් අධ්‍යාපන පහසුකම් සැලසීමෙහි අතුරු ඵලයක් වශයෙන්, මෙතෙක් කල් ඉංග්‍රීසි මාධ්‍යයට ම බොහෝදුරට සීමා වී පැවති ලක්දිව උපාධිධාරී උගතුන්ගේ පර්යේෂණ කටයුතු හා ශාස්ත්‍රීය ප්‍රකාශන ද ක්‍රමයෙන් සිංහල මාධ්‍යය දෙසට ද යොමු වන්නට විය. එක්දස් නවසිය පනස් ගණන්වලදී පිහිටුවන ලද ස්වභාෂා (පසුව රාජ්‍ය භාෂා) දෙපාර්තමේන්තුවේ විවිධ විෂයක ග්‍රන්ථ පරිවර්තන හා ශිල්ප වචන මාලා සම්පාදන කටයුතු ද මෙයට සෑහෙන දුරට උපකාරී වූ බව පෙනේ.

සිංහල, ඉතිහාසය, බුද්ධධර්මය යන විෂය ක්ෂේත්‍රයන් ගෙන් පටන් ගෙන පාලි, සංස්කෘත, මානව විද්‍යා, පුරා විද්‍යා, ආර්ථික විද්‍යා, භූගෝල විද්‍යා ආදී උපාධි විෂයමාලාවට ඇතුළත් සෑම විෂය ක්ෂේත්‍රයක ම පාහේ, ශාස්ත්‍රීය තත්වයේ හා අර්ධ ශාස්ත්‍රීය තත්ත්වයේ ලිපි ඇතුළත් වාර්ෂික සඟරා තරහයට මෙන් ප්‍රකාශයට පත්වන්නට විය. 1959 දී ඇති වූ මෙම උනන්දුව අවුරුදු පහක් හයක් යන තෙක් නො අඩුව පැවතිණ. ප්‍රධාන වශයෙන් විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ පර්යේෂණ ලිපි, සඳහා වෙන් වූ 'ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය සංග්‍රහය' නම් සඟරාවක පළකිරීම 1960 දී ආරම්භ

92. ඉහත 26 පිට බලන්න.

කරන ලදි. පිරිවෙන් විශ්වවිද්‍යාලයවල ආචාර්යවරුන් හා උපාධිධරයන් විසින් ලියන ලද ශාස්ත්‍රීය ග්‍රන්ථ හා නවකථා, කෙටිකථා, ඇතුළු නිර්මාණාත්මක ග්‍රන්ථ ද සැහෙන සංඛ්‍යාවක් නිකුත් වී තිබීමෙන් පෙනෙන්නේ මෙම අවදිය තුළ ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක ග්‍රන්ථ කරණයෙහි හා ප්‍රකාශනයෙහි විශේෂ උනන්දුවක් පැවති බවයි.

විශ්වවිද්‍යාලය ආරම්භයෙහිදී ම පර්යේෂණ අංශයක් ද පිහිටුවා විද්‍යෝදය පිරිවෙනේ ආචාර්යවරයකු වූ වැලිවිටියේ ප්‍රේමරතන නාහිමියන් එහි අධ්‍යක්ෂ ධූරයට පත්කර සිංහල සාහිත්‍යයේ සංඥානාම කෝෂයක් හා පාලි ශබ්දකෝෂයක් සෑදීමට පියවර ගෙන ඇතත්, එහි කටයුතු එතරම් සාර්ථක වූ බවක් නොපෙනේ.

**ශිෂ්‍ය ප්‍රශ්න හා වෙනත් ගැටළු:**

ශිෂ්‍ය සංඛ්‍යාව විශාල නුවූද ශිෂ්‍ය පිරිසෙන් වැඩිදෙනා භික්ෂූන් වූද මුල් වර්ෂ දෙක තුළ ඇතැම් බාහිර කථිකාචාර්යවරුන්ගේ දේශන පිළිබඳ ප්‍රශ්නයක් දෙකක් හැරුණු විට ශිෂ්‍ය පහසුකම් අඩුව තිබියදී පවා එතරම් බරපතළ ප්‍රශ්නයක් පැන නොනැගිණ. නවාතැන් ඇතැම් කරුණ ද පැන නැගුණේ විශ්වවිද්‍යාලය ගංගොඩවිලට ගෙන ඒමෙන් පසු ආරම්භ වූ නව වසරේ පටන්ය. කිවයුතු තරමේ ශිෂ්‍ය ප්‍රශ්නයක් පළමුවෙන් ම පැන නැගුණේ තෘතීය අධ්‍යයන වර්ෂයේදී ය. එම වසරෙහි මාලිගාකන්දේ දී, පහසුකම් ප්‍රශ්නය මත ශිෂ්‍ය සංගමයේ මෙහෙයවීමෙන් පංති වර්ජන ව්‍යාපාරයක් ගෙන යන ලද අතර, විනය පරීක්ෂණයකින් පසු එයට වරදකරුවන් වූ සිසුන් කීප දෙනෙකුගේ අභ්‍යන්තර ශිෂ්‍ය භාවය අවලංගු කරන ලදී. අනතුරුව, ඊළඟ වර්ෂයේ දී එක් පැවිදි ශිෂ්‍යයෙක් එම දඬුවම ඉවත් කරවා ගැනීමේ අරමුණින් උපවාසයක් ආරම්භ කළේය. ඉන් පසු, එයට සහයෝගය දක්වන ශිෂ්‍ය පංති වර්ජන ගංගොඩවිලදී දෙවරක් ම පැන නැගිණ.[93] මේ සිද්ධි නිසා මුල් වර්ෂ දෙක තුනේදී විශ්වවිද්‍යාලයට නන් දෙසින් ලැබුණු පැසසුම් හා ඇගයීම් වෙනුවට ඇනුම් බැණුම් හා විවේචන එල්ල වන්නට පටන් ගති. 1966 උසස් අධ්‍යාපන පනත ඉදිරිපත් කරමින් කළ කථාවේදී අධ්‍යාපන ඇමතිවරයා මේ ගැන ද සඳහන් කොට ඇත.[94]

මේ කාලය වන විට විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය මීටත් වඩා විවිධ විවේචනයන්ට ලක් වෙමින් පැවතිණ. කලක් නිසොල්මන්ව සිටි පිරිවෙන් විශ්වවිද්‍යාලය විරෝධී ඇතැම් බලවේගයන්ට නැගී සිටීමට මෙය හොඳ අවස්ථාවක් සැපයීය. ලංකා විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් චෝදනා නැගෙමින් තුබුණේ කලක සිටම ය. 1962 දී එවක අධ්‍යාපන ඇමති වූ බද්උද්දීන් මහමුද් මහතා විසින් ලංකා විශ්වවිද්‍යාලය, විද්‍යෝදය විශ්වවිද්‍යාලය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය යන ආයතනවල ක්‍රියාකාරිත්වය හා පරිපාලනය පිළිබඳව පිරික්සා බලා වාර්තා කිරීම සඳහා ඩී. සී. ගුණවර්ධන (සභාපති), පී. එච්. වික්‍රමසිංහ, ඩී. ඊ. විජේවර්ධන යන මහතුන්ගෙන් සමන්විත පරීක්ෂණ කොමිෂම පත්කරන ලද්දේ මෙම වාතාවරණය යටතේ ය. 1963 දී ප්‍රකාශයට පත්කරන ලද විද්‍යෝදය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය වසා දැමීමට කරන යෝජනාවක්[95] ද ඇතුළත් වූ මෙම කොමිෂමේ වාර්තාව පදනම් විරහිත ප්‍රකාශයන්ගෙන් ද, හේතු සාධක විරහිත නිගමනයන්ගෙන් හා පූර්වවිනිශ්චයන්ගෙන් ද ගහන වූවක් බව අධ්‍යාපන ඇමතිවරයා ඒ සම්බන්ධව එවූ ලිපියට පිළිතුරු වශයෙන් විද්‍යෝදය උපකුලපති විමලධම්ම නාහිමියන්

93. වා.පා.වා. 1961/62, පිටු 4–5.
94. Hansard, Vol. 67, Col. 1063
95. Report of the Universities Commission, 1962, Sessional Paper, XVI—1963, §, 65

යැවූ නිරීක්ෂණ වලින් පෙනේ.[96] විද්‍යාලංකාර උපකුලපතිවරයා විසින් ද මෙබඳුම නිරීක්ෂණ මාලාවක් යවන ලදී. 1964 දී ද විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ගිහි පැවිදි සිසුන් දෙපිරිස අතර බලවත් ගැටුමක් ඇතිවිය. ඉහත කී කොමිෂන් වාර්තාවෙන් ක්ෂණික ප්‍රතිඵලයක් නො ලැබුණ ද, 1966 අංක 20 දරන උසස් අධ්‍යාපන පනත පිළිබඳ විවාදයේ දී විශ්වවිද්‍යාලයවල ප්‍රතිසංවිධානයක් අවශ්‍ය බව පෙන්වීම සඳහා මෙම වාර්තාවෙහි කරුණු බෙහෙවින් ප්‍රයෝජනයට ගෙන ඇති බව හැන්සාඩ් වාර්තාවලින් පෙනේ.[97] 1966 දී විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි පැවති උපාධි ප්‍රදානෝත්සවයේ දී අධ්‍යාපන ඇමතිවරයාට එකදිගට හූ කීමේ සිද්ධිය ද යථෝක්ත විශ්වවිද්‍යාලය ප්‍රතිසංවිධානයට හේතුවක් වීය යි විරුද්ධ පක්ෂයේ සමහරු පැවසූහ.[98]

## III. ජාතික උසස් අධ්‍යාපන සභා අවධිය (1966-1972):

ජාතික උසස් අධ්‍යාපන සභා අවධිය ඇරඹෙන්නේ ඩඩ්ලි සේනානායක සභාග රජයේ අධ්‍යාපන ඇමති අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල මහතාගේ නියාමකත්වයෙන් සම්මත කරවා ගත් 1966 අංක 20 දරණ උසස් අධ්‍යාපන පනත ක්‍රියාත්මක වූ 1966.10.01 දින සිට ය. මෙම පනතේ මූලික අරමුණ වශයෙන් දැක්වෙන්නේ ජාතියේ සාමාජික සංස්කෘතික හා ආර්ථික අවශ්‍යතාවන් සමග සන්ධානයක් ඇතිවන සේ ලක්දිව උසස් අධ්‍යාපනය සකස්වන අයුරින් විශ්වවිද්‍යාලය ප්‍රධාන උසස් අධ්‍යාපන ආයතනවල පැවැත්ම හා සංවර්ධනය විධිමත් කොට පරිපාලනය කිරීමයි.[99] මෙම පනතින් උසස් අධ්‍යාපනය පිළිබඳ කරුණු සම්බන්ධව ඇමතිවරයාට උපදෙස් දීමේ වගකීමත් විශ්වවිද්‍යාලය පිළිබඳ අධීක්ෂණ බලතලත් පැවරුණු ජාතික උසස් අධ්‍යාපන සභාවේ[100] සභාපති පදවියට පත් වූයේ මහාචාර්ය ගුණපාල මලලසේකරය. පනත මගින් සිදු වූ ප්‍රතිසංවිධානවලින් බලවත් වෙනස්කම්වලට භාජන වූයේ පිරිවෙන් විශ්වවිද්‍යාලය දෙක ය. මෙම ප්‍රති සංවිධානය අනුව විද්‍යෝදය විශ්වවිද්‍යාලය ද පිරිවෙන් විශ්වවිද්‍යාලය ස්වරූපය අත්හැර ලංකාවේ සාමාන්‍ය විශ්වවිද්‍යාලය අතුරෙන් එකක් බවට පත්විය. ස්ත්‍රී පුරුෂ භේදයක් නැතිව විශ්වවිද්‍යාලය සියලු දෙනාට විවෘත වූ අතර, 1966/67 අධ්‍යයන වර්ෂයේ දී පළමු-වරට ශිෂ්‍යාවෝ පිරිසක් ද අභ්‍යන්තර භාවයෙන් ඇතුළත් කර ගන්නා ලදහ. උපකුලපති පදවිය ද ගිහිපැවිදි කාහටත් විවෘතව තැබිණ. කලින් පැවති පාලක සභාව වෙනුවට ජා.උ.අ. සභාවට අවනත වූ මහාධිකාරී මණ්ඩලයක්[101] බිහි විය.

විශ්වවිද්‍යාලයෙහි සිදු වූ මෙම වෙනස්කම්වල හොඳ නරක විනිශ්චය කළ යුත්තේ ඒවා විශ්වවිද්‍යාලය සංවර්ධනය කෙරෙහි බලපෑ ආකාරය විමසා බැලීමෙනි. එක් අතකින් පිරිවෙන් විශ්වවිද්‍යාලය ස්වරූපය නැතිවීමත්, භික්ෂූන්වහන්සේට පමණක් සීමා වී තිබූ උප කුලපති පදවිය විවෘත තත්ත්වයට පත්කිරීමත් භික්ෂු අධ්‍යාපනයට අලාභයක් විය. පනත පිළිබඳ විවාදයේ දී කථිකයන් කීප දෙනෙකු විසින් මෙම චෝදනාව ඇමතිවරයා වෙත එල්ල කරන ලද අතර[102] අධ්‍යාපන ඇමතිවරයා කීයේ "විද්‍යෝදය විද්‍යාලංකාර විශ්වවිද්‍යාල ද්වයෙන් අපේක්ෂිත උසස් භික්ෂු අධ්‍යාපනය හා

---

96. 1962 විශ්වවිද්‍යාලය කොමිෂන් සභා වාර්තාව ගැන අදහස් 1963.
97. Hansard, Vol. 67 Session 1966—67, Cols. 1048 f.
98. Ibid, Cols. 1102-1104.
99. Sec. 8, 29.
100. Sec. 7, 8
101. Sec. 45 (1).
102. Hansard Vol. 67: ඩී. බී. ඇම්. හේරත්, 1122 තීරුවේ සිට; වීරසේකර 1436 තීරුවේ සිට; ලක්ෂ්මන් ජයකොඩි 1521 තීරුවේ සිට.

විනය ද ශීල සමාධි ප්‍රඥා ආදී ගුණයන් ද ඒවායේ ඉගෙන ගත් භික්ෂූන්ගෙන් ඉවත්වන නිසා, භිකුෂුන් වහන්සේ සහ බුද්ධ ධර්මය – බුද්ධ ශාසනය – දවසෙන් දවස තල්ලු වී ගිය ප්‍රපාතයෙන් ගොඩගැනීම සඳහා'' පියවර ගැනීමට රජයට සිදුව ඇති බවයි.[103] පසුව බුද්ධ ශ්‍රාවක ධර්මපීඨය පිහිටුවීම මෙම ප්‍රතිඥාව අනුව ගත් තවත් පියවරකි.[104]

අනිත් අතට, කලින් විශ්වවිද්‍යාලයෙහි ශිෂ්‍ය ආචාර්ය දෙපක්ෂයට ම බලපෑ ස්ත්‍රී පුරුෂ භේදයක්, උපකුලපති ඈ පදවි සම්බන්ධයෙන් වූ ගිහි පැවිදි භේදයන් ඉවත් කිරීම නිසා ප්‍රතිසංවිධානයෙන් පසුව මෙය වඩාත් අංග සම්පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත්විය. එමගින් සකස් වූයේ 1962 ගුණවර්ධන කොමිසම ද දක්වා තිබූ අඩුපාඩුවකි.[105] ප්‍රතිසං-විධානයෙන් පසු විද්‍යෝදය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයෙන් වෙනස් වූයේ පීඨ හා විෂය ක්ෂේත්‍ර සංඛ්‍යාව අතින් පමණි.

පනත් කෙටුම්පත් විවාදයේ දී, රොබින්ස් කොමිටි වාර්තා උද්ධෘතයන් ඇතුළුව අධ්‍යාපන විශේෂඥ මත ගෙන හැර දක්වමින් කථා කළ විරුද්ධ පක්ෂයේ බොහෝ දෙනෙකුගේ තර්කයක් වූයේ විශ්වවිද්‍යාලය තුළ තිබිය යුතු වූ ශාස්ත්‍රීය ස්වාධීනතාව මෙම පනතින් නැතිව යන බවයි[106]. පනතේ 99 වන වගන්තිය ද පෞද්ගලික හෝ දේශපාලන පළිගැනීම්වලට වහල්කර ගත හැක්කක්ය යනුවෙන් බොහෝ දෙනාගේ විවේචනයට ලක් විය.[107] පනත ක්‍රියාත්මක වීමෙන් පසු සංක්‍රාන්තික කාලය තුළ (1967 දී) ජා.උ.අ. සභාව මගින් ලංකාවේ විශ්වවිද්‍යාලවල සියලු ආචාර්යවරුන්ගේත්, නිලධරයන්ගේත් පත්වීම් සමීක්ෂණයට ලක් කරන ලද අතර, සමීක්ෂණය අවසන කීප දෙනකුගේ සේවය නතර කරන ලදී. විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි මෙසේ සේවය නතර කරනු ලැබූවන්ගේ ගණන හතරකි.[108]

මෙම ප්‍රතිසංවිධානය යටතේ පීඨ හා අධ්‍යයනාංශ සංයුතියෙහි ද යම් යම් වෙනස්කම් ඇති විය. කලින් සමය (දර්ශන) පීඨය යටතේ තිබුණු අධ්‍යයනාංශ බෞද්ධ අධ්‍යයන පීඨයට එක්කොට සමය පීඨය අහෝසි වන්නට හරින ලදී. විද්‍යා පීඨය යටතේ තිබුණු භෞතික විද්‍යා අධ්‍යයනාංශය භෞතික විද්‍යා රසායන විද්‍යා යනුවෙන් අධ්‍යයනාංශ දෙකක් බවට පත්කරන ලදී. ගුණවර්ධන කොමිෂම විසින් සාවද්‍ය කරුණු පවා දක්වමින් අවඥාවට ලක්කළාවූ ද[109] නැවත ඒ මත පාර්ලිමේන්තුවේ දී විවේචනයට ලක්වූ ද[110] එක් වසරක වූ එක් ශිෂ්‍යයකු හැරුණු විට, විශ්වවිද්‍යාලය විෂය මාලාවෙහි නාමලේඛනයට පමණක් සීමා වී පැවැතුණාවූ ද, විෂය දෙකක් වන ආයුර්වේදය හා ජ්‍යෝතිෂය විෂය-මාලාවෙන් ඉවත් කරන ලදී.

සියලු විශ්වවිද්‍යාලයවලට පොදු වූ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට සේවකයන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් ජා.උ.අ.ස. මගින් ක්‍රියාත්මක කිරීම මෙම පනත යටතේ ගත් වැදගත් පියවරක් විය. මෙය ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දේ වර්ෂ කීපයකට පසු 1970 දීය.[111]

---

103. Ibid, Col. 1067.
104. 1968 අංක 16, බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය පනත බලන්න.
105. Sessional Paper XVI—1963 § 45.
106. Hansard, Vol. 67 : සූරියආරච්චි, 1076 තීරුවේ සිට, බර්නාඩ් සොයිසා, 1274 තීරුවේ සිට.
107. එහිම සූරියආරච්චි, තීරු 1106–1107; බර්නාඩ් සොයිසා, 1385 තීරුව; වීරසේකර, 1439 තීරුව; ජයකොඩි, 1545 තීරුව; බී. වයි. තුඩාවේ තීරු 1627–28.
108. වා.පා.වා. 1967/68 – 8 පිට.
109. Sessional Paper, XVI—1963, §§ 91, 92,
110. Hansard, Vol. 67 : එම්. ඩී. බණ්ඩා, තීරු 1967–68.
111. ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය, 1970.01.27.

කලින් පනත අනුව උපකුලපති තේරීමේ බලය තිබුණේ විශ්වවිද්‍යාලයේ කෝට් සභාවට වුවද, නව පනත යටතේ, ජා.උ.අ.ස. මගින් ඉදිරිපත් කළ නම් 3 ක් හෝ වැඩි ගණනක් අතුරෙන් සිය අභිමතය පරිදි එක් අයකු පත්කිරීමේ බලය ඇමතිවරයා සතුවිය[112]. 1966.10.01 දින නව පනත ක්‍රියාත්මක වීමෙන් පසු ඇමතිවරයා විසින් පත්කළ ප්‍රථම උපකුලපති වූයේ බෞද්ධ පඬිවරයකු හැටියට ජාත්‍යන්තර කීර්තියක් උසුලන ආචාර්ය වල්පොළ රාහුල හිමියෝ ය. ප්‍රතිසංවිධානය යටතේ ලේඛකාධිකාරී ධුරය අහෝසි වූ අතර[113] ඒ වෙනුවට ඇති කළ ලේකම් ධුරයට පළමුවෙන් පත්වූයේ කලින් අධ්‍යාපන අධ්‍යක්ෂ ධුරයක් දැරූ ඊ. නාගොඩවිතාන මහතාය. කේ. පි. ජී. විජයසුරේන්ද්‍ර, ප්‍රේමරත්න අබේසේකර යන මහත්වරු නියෝජ්‍ය ලේකම්වරු වූහ. මේ යටතේ පුස්තකාලයාධිපති ධුරයට පත්වූයේ කලින් ලංකා විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීව සිටි ඩබ්ලිව්. ඒ. ජයවර්ධන මහතාය.

භාෂා පීඨාධිපති ධුරයට, කලින් එම ධුරය දරමින් සිටි මහාචාර්ය විමල් බලගල්ලේ ද, කලා පීඨාධිපති ධුරයට, කලින් එම ධුරය දරමින් සිටි මහාචාර්ය හේම එල්ලාවල ද, විද්‍යා පීඨාධිපති ධුරයට මහාචාර්ය ජී. සී. එන්. ජයසූරිය ද, පත් වූ අතර, ප්‍රතිසංවිහිත බෞද්ධ අධ්‍යයන පීඨාධිපති ධුරයට 1967 දී බුද්ධ ධර්ම මහාචාර්ය ධුරයට පත්වූ කොටගම වාචිස්සර හිමියෝ පත්කර ගන්නා ලදහ. 1969 අගෝස්තු මාසයේ දී කොටගම වාචිස්සර හිමියන් අපවත් වීමෙන් පසු බෞද්ධ අධ්‍යයන පීඨාධිපති ධුරයෙහි වැඩ කිරීමද භාෂා පීඨාධිපති මහාචාර්ය විමල් බලගල්ලේ වෙත පැවරිණි. 1967 දී ආචාර්ය පී. ඩබ්ලිව්. ඇපාසිංහ ගණිත මහාචාර්ය ධුරයට ද, ආචාර්ය පී. සී. බී. ප්‍රනාන්දු භෞතික විද්‍යා මහාචාර්ය ධුරයට ද, ආචාර්ය පී. ඩී. ඒ. පෙරේරා භූගෝල විද්‍යා මහාචාර්ය ධුරයට ද, ආචාර්ය ධර්මසේන ද සිල්වා පරිපාලන විද්‍යා මහාචාර්ය ධුරයට ද 1969 දී ආචාර්ය ඩී. එම්. කන්නන්ගර ආර්ථික විද්‍යා මහාචාර්ය ධුරයට ද පත්කර ගනු ලැබූහ.

ශාස්ත්‍රපති, දර්ශන සූරි යන පශ්චාත් උපාධි සඳහා සිසුන්ට අධ්‍යයන පර්යේෂණ පහසුකම් සැලසීම කෙරෙහි මෙම විශ්වවිද්‍යාලය මුලපටන්ම විශේෂ උනන්දුවක් දක්වා ඇත. මේ යුගයේ දී මේ උනන්දුව වඩාත් දියුණු වූ අතර, වෘත්තීය පක්ෂයට නැඹුරුවූ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා කීපයක් ද සංවිධානය කොට පවත්වන ලදී. කලින් සිට පවත්වාගෙන ආ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවත්, ජෛවීය විද්‍යා අංශයේ මෙහෙයීමෙන් ආරම්භ කළ ආහාර විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවත්, භෞතික විද්‍යා අංශයේ මෙහෙයීමෙන් ආරම්භ කළ දෘෂ්ටිමිතිය ඩිප්ලෝමා පාඨමාලාවත්, ගණිත විද්‍යා අංශයේ මෙහෙයීමෙන් ආරම්භ කළ සංඛ්‍යාන ඩිප්ලෝමා පාඨමාලාවත්, සිංහල අංශයේ මෙහෙයීමෙන් ආරම්භ කළ සාහිත්‍ය නිර්මාණ ඩිප්ලෝමා පාඨමාලාවත් එබඳු පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවෝ යි.

1969.01.27 වනද අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති උත්සවයක දී විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨ ගොඩනැගිලි සංකීර්ණයට මුල්ගල් තබා වැඩ ඇරඹීම මේ කාලය තුළ වූ තවත් වැදගත් සිද්ධියකි.

සාමාන්‍යයෙන් මේ කාලය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය අරගල අඩු කාලපරිච්ඡේදයක් වුව ද, 1967 දී විශ්වවිද්‍යාලය තුළට පොලිසිය පවා කැඳවීමට සිදුවූ පංති වර්ජන ව්‍යාපාරයක්

---

112. Sec. 42 (1)
113. Secs. 9, 100.

පැන නැගිණ. මේ සම්බන්ධයෙන් වරද කරුවන් වූ සිසුන් කීප දෙනෙකු අස්කරන ලදුව, එයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරන ලද නඩුවක තීන්දුව අනුව විනය පාලනය සඳහා සිසුන් අස් කිරීමේ බලය උපකුලපතිවරයා සතු බව තහවුරු විය.

1969 ජූලි මාසයේ දී රාහුල හිමියෝ උපකුලපති ධූරයෙන් ඉල්ලා අස්වූහ. එම අගෝස්තු මාසයේ සිට ලංකා විශ්වවිද්‍යාලයේ සිටි ජ්‍යෙෂ්ඨතම මහාචාර්යවරයකු වූ ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා හිස් වූ උපකුලපති ධූරයට පත්කරනු ලැබීය. එම වසරේ දී ම හිස් වූ පුස්තකාලයාධිපති ධූරයට ඩබ්ලිව්. බී. දෙරකුඹුර මහතා ද, ඊළඟ වසරේ දී පාලි මහාචාර්ය ධූරයට ආචාර්ය කේ. ජිනදාස පෙරේරා ද, 1971 දී බුද්ධ ධර්ම මහාචාර්ය ධූරයට ආචාර්ය හේන්පිටගෙදර ඥාණාවාස හිමියෝ ද, 1972 සංස්කෘත මහාචාර්ය ධූරයට ආචාර්ය මහින්ද පලිහවඩන ද පත්වූහ.

1970 දී විශ්වවිද්‍යාලයට පැමිණි විල්මට් පෙරේරා කොමිෂමට සිසුන් අවහිර කිරීමෙන් ඇතිවූ කලබලය මේ වනවිට ලංකාවේ විශ්වවිද්‍යාලය තුළ වූ නොසංසුන්කම පෙන්වන්නකි.

අධ්‍යයන වර්ෂාවසානයේ දී මහාචාර්ය හෙට්ටිආරච්චි උපකුලපති ධූරයෙන් ඉල්ලා අස්වීමෙන් පසු, 1970 ඔක්තෝබර් මාසයේ දී, එම ධූරයට මහාචාර්ය හේම එල්ලාවල පත්කරන ලදී. මහාචාර්ය එල්. ජී. හේවගේ හිස් වූ කලා පීඨාධිපති ධූරයට පත්වූ අතර, ඩී. ඒ. අබේසිංහ මහතා වැ. බ. ලේකම් ධූරයට පත්විය. 1971 පෙබරවාරි මාසයේ දී මහාචාර්ය ජයසූරිය ඉල්ලා අස්වීමෙන් හිස් වූ විද්‍යා පීඨාධිපති ධූරයට මහාචාර්ය පී. සී. බී. ප්‍රනාන්දු පතවිය.

1971 අප්‍රේල් මාසයේ දී පැනනැගි ත්‍රස්තවාදී කලබලය නිසා විශ්වවිද්‍යාලය වසා දැමීමට සිදු වූ අතර, 1971 මැයි මාසයේ දී තර්ස්ටන් පාරේ රාජකීය විද්‍යාලයට යාබද ගොඩනැගිල්ලක විශ්වවිද්‍යාලය කාර්යාලයක් තාවකාලිකව පිහිටුවා ගෙන කාර්යාලයීය කටයුතු කරන ලදී. ගංගොඩවිල විශ්වවිද්‍යාලය භූමිය පුනරුත්ථාපන කඳවුරක් වශයෙන් යොදා ගැනිණ. තර්ස්ටන් පාරට කාර්යාලය ගෙනගිය මාස දෙක තුනක ඇතුළත, එහි ගොඩනැගිලිවල කොටසක් තාවකාලික විද්‍යාගාර වශයෙන් සකස්කර ගැනීමත්, පංති පැවැත්වීම සඳහා තාවකාලික ශාලාවක් තනා ගැනීමත්, පාසල් කාලයෙන් පසු විශ්වවිද්‍යාලයේ පංති පැවැත්වීම සඳහා හැව්ලොක් පාරේ ලුම්බිනි විදුහලෙහි හා ඉසිපතන විදුහලෙහි ශාලා කීපයක් ලබා ගැනීමත් සපුරා ගැනීමෙන් අනතුරුව ඉගැන්වීමේ කටයුතු ද නැවත ආරම්භ කිරීමට පියවර ගන්නා ලදි. මේ අනුව, ජූලි මස අගදී උපාධි අවසාන වර්ෂ පංතිවල තෙවන වාරය පටන් ගන්නා ලද අතර, එම ඔක්තෝබර මාසයේ දී නව වර්ෂය සඳහා නවක සිසුන් ඇතුළත් කර ගැනීම ද කළහැකි විය. එහෙත් සෙසු පංතිවල පරීක්ෂණ කටයුතු ආදිය 1972 අප්‍රේල් මාසය තෙක්ම පැවති හෙයින් නව අධ්‍යයන වර්ෂය නියම ලෙස පටන් ගතහැකි වූයේ 1972 මැයි 15 වනද ය. මෙසේ 1970/71 අධ්‍යයන වර්ෂයෙන් පසුව ලැබූ මෙම අධ්‍යයන වර්ෂය 1971/72 වශයෙන් නොව 1971/73 වශයෙන් හැඳින්විය යුත්තක් විය. අනතුරුව, 1972 දී පුස්තකාලයෙහි අත්‍යවශ්‍ය පොත් ඇතුළත් කොටසක් ද ලුම්බිනි විදුහල අසල ගොඩනැගිල්ලකට ගෙන යන ලදි. 1972 ඔක්තෝබර මාසයේ දී නැවත ගංගොඩවිල විශ්වවිද්‍යාලයීය ගොඩනැගිලි ආපසු ලැබෙන තුරු විශ්වවිද්‍යාලය පවත්වාගෙන යැමට සිදුවූයේ ඉහත කී විධිවිධාන යටතේ ඉමහත් දුෂ්කරතා මධ්‍යයේ ය.

## IV තනි විශ්වවිද්‍යාලය අවධිය : 1972—1978

තනි විශ්වවිද්‍යාලය අවධිය නිල වශයෙන් ඇරඹෙන්නේ 1972 අංක 1 දරන පනත ක්‍රියාත්මක වූ 1972 පෙබරවාරි 15 වනදා සිටය. එහෙත් එවකට සියලු ම විශ්වවිද්‍යාලයවල පැවති අවුල් සහගත තත්ත්වය නිසා 1973 වනතුරු එම පනතේ විධිවිධාන අධ්‍යයනාංශ ප්‍රතිසංවිධාන ආදිය සඳහා යොදා ගැනීමට නොහැකි විය.

1970 දී බලයට පත් සිරිමාවෝ බණ්ඩාරනායක සභාග රජය මැතිවරණ සමයෙහි දී තිබූ පොරොන්දුවක් අනුව, වැඩි ශාස්ත්‍රීය ස්වාධීනතාවක් ලැබෙන විශ්වවිද්‍යාලය ප්‍රතිසංවිධානයක් කිරීමේ අදහසින් කොමිෂන් සභා නිර්දේශ හා අධ්‍යාපන විශේෂඥ උපදෙස් ද ප්‍රයෝජනයට ගනිමින් සකස් කරනු ලැබූ පනත් කෙටුම්පතක් අධ්‍යාපන ඇමතිවරයා විසින් 1971 අප්‍රේල් 4 වනදා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරියෙහි සභාගත කරන ලදී. ජා.උ.අ.ස. වෙනුවට විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂමක් පිහිටුවීම වෛශේෂික ලක්ෂණය වූ මෙම පනත් කෙටුම්පතෙහි[114] කලින් පනත්වල නුවූ යහපත් ලක්ෂණ කීපයක් වූ නමුත්, පසුද අලුයම පටන් ගැනුණු ත්‍රස්තවාදී කලබලය නිසා, එය මන්ත්‍රණ සභාවේ විවාදය සඳහා ගනු නොලැබ අහෝසි වී ගියේය. කලබල ඇතිකළ සංවිධාන විශ්වවිද්‍යාලයන් තුළට ද රිංගාගෙන සිටිබවට පැතිර ගිය ආරංචි, විශ්වවිද්‍යාලය කෙරෙහි මුලදී රජය තුළ වූ ආකල්පය වෙනස් වීමට හේතු වූ බවක් පෙනේ. මෙම තත්ත්වය යටතේ අමුතුවෙන් ම විශ්වවිද්‍යාලය ප්‍රතිසංවිධානයක් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට, අධ්‍යාපන ඇමතිවරයා විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය ඔස්මන් ජයරත්නගේ ප්‍රධානත්වයෙන් විශ්වවිද්‍යාලයීය ආචාර්යවරුන් 7 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මැයි මාසයේ දී පත්කරන ලදී. මසකුත් දින 10 ක් ඇතුළත කඩිමුඩියේ ඉදිරිපත් කළ මෙම කමිටුවේ වාර්තාව[115] බොහෝදුරට පදනම් කරගත් පනත් කෙටුම්පතක් 1971.11.03 වන දින මන්ත්‍රී මණ්ඩලය ඉදිරියේ සභාගත කරන ලදී[116]. විශ්වවිද්‍යාලයීය ආචාර්යවරුන් වෙතින් මෙම පනත් කෙටුම්පතට එරෙහිව බලවත් විරෝධයක් පැන නැගිණ. එහෙත් විශ්වවිද්‍යාලය අධ්‍යාපන විශේෂඥයන් හැටියට රජය විශ්වාස කළ, රජයේ හොඳහිත දිනා සිටි ටික දෙනකුගේ උපදෙස් පිට එම විරුද්ධතා සියල්ල නොසලකා හරින ලදී. මන්ත්‍රණ සභා විවාදයෙන් පසු 1972.01.21 වනදා සම්මුතිය ලැබුණු මෙම පනත හැඳින්වුණේ 1972 අංක 1 දරන ලංකා විශ්වවිද්‍යාලය පනත[117] යනුවෙනි.

මේ පනත යටතේ අධ්‍යාපන ඇමතිවරයා කළ නියෝගයක මගින්[118] 1972.02.15 දින ජාතික උසස් අධ්‍යාපන සභාව අහෝසි වූ අතර,[119] විද්‍යෝදය විශ්වවිද්‍යාලය ද ඇතුළු ලක්දිව පැවති සියලු විශ්වවිද්‍යාලය සනාතන මන්දිරය කේන්ද්‍රස්ථාන කොට අලුතින් පිහිටුවන ලද තනි විශ්වවිද්‍යාලයෙහි උපාංග බවට පත්විය.[120] තනි ලංකා විශ්වවිද්‍යාල-

---

114. A Bill to provide for the establishment, maintainance and administration of Universities, and for matters connected therewith or incidental thereto; Presented by the Minister of Education, 04.04.1971.
115. Report of the Committee appointed by the Hon. Minister of Education to Report on the Re-organization of Higher Education, Colombo, June 1971.
116. A Bill to provide for the Establishment of a University of Ceylon, for the establishment, maintainance and Administration of that University, its Campuses, Faculties and Institutes and for matters connected therewith or incidental thereto; Presented by the Minister of Education, 3. 11. 1971
117. University of Ceylon Act, No. 1 of 1972
118. ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය, 1927.02.15 බලන්න.
119. Sec. 79.
120. Sec. 80

යේ කාර්‍යාලය වූයේ ද කලින් ජා.උ.අ.ස. කාර්‍යාලයමය. කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්‍ය බී. ඒ. අබේවික්‍රම විශ්වවිද්‍යාලයේ උපකුලපති ධුරයට පත් කරන ලදි. පැරණි විද්‍යෝදය විශ්වවිද්‍යාලය නව පනත අනුව[121] තනි විශ්වවිද්‍යාලයේ මණ්ඩපයක් බවට පත්වීමෙන් පසු නම් කරන ලද්දේ 'විද්‍යෝදය මණ්ඩපය' යනුවෙනි. 1972.02.15 වනදා පනත ක්‍රියාත්මක වීමත් සමග කලින් විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ උපකුලපතිව සිටි මහාචාර්‍ය හේම එල්ලාවල නව විද්‍යෝදය මණ්ඩපයේ මණ්ඩපාධිපති වශයෙන් පත්කරන ලදි.[122] මේ වනවිට විද්‍යෝදය කාර්‍යාලය පැවැත්තේ ඉහත කී තර්ස්ටන් පාරේ ගොඩනැගිල්ලෙහි ය.

1972 ප්‍රතිසංවිධානය අංශ කීපයකින්ම විද්‍යෝදයට අහිතකර යුගයක් උදා කළේය. පීඨ හා අධ්‍යයනාංශ සමහරක් අර්ථවිරහිතව නිර්දය ලෙස කප්පාදු කරන ලදී. බෞද්ධ අධ්‍යයන හා භාෂාපීඨත්, බුද්ධ ධර්ම, පාලි, සංස්කෘත, දෙමළ, ඉංග්‍රීසි, දර්ශන, පුරාවිද්‍යා ආදී අධ්‍යයනාංශත් මෙම කැපිල්ලට භාජන වූ පීඨ හා අධ්‍යයන අංශ විය. සිංහල අංශයෙහිදු අතිශය ශිෂ්‍ය ප්‍රියව තිබූ විශේෂ උපාධි පාඨමාලා මුලදී නවත්වා දමන ලදින්, ඒවා පුනරුත්ථාපනය කරවා ගත හැකි වූයේ බලවත් පරිශ්‍රමයකිනි. බෞද්ධ අධ්‍යයන හා ඉංග්‍රීසි යන විෂය භාෂා හා සංස්කෘතික අධ්‍යයන නම් අලුත් මිශ්‍රණයක උප අධ්‍යයනාංශ බවට පත්විය. සමාජ විද්‍යාව ඉතිහාස අංශයට ඈඳා 'ඉතිහාස හා සමාජ විද්‍යා' අධ්‍යයනාංශය නමින් හඳුන්වනු ලැබීය. කැපිල්ලට ලක්වූ අධ්‍යයනාංශවල සිටි ආචාර්‍යවරුන්ගෙන් සමහරෙක් 1973–74 වර්ෂ තුළ වෙනත් මණ්ඩපවලට මාරුකර යවන ලදහ. ටික දෙනෙක් විෂය කීපයක සන්ධානයක් වූ භාෂා හා සංස්කෘති අධ්‍යයනාංශයට අනුයුක්ත කරන ලදහ. ඒ වනවිට පීඨ තත්ත්වයට නැංවීමට තරම් හැම අතින් ම දියුණුව පැවති අධ්‍යාපන විද්‍යා අංශය පුස්තකාලයේ වැදගත් කොටසක් ද සමග කොළඹ මණ්ඩපයට මාරු කොට එහි අලුත් අධ්‍යාපන විද්‍යා පීඨයක් පිහිටුවන ලදි.

රාජ්‍ය හා ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය කළමනාකරණ හා වාණිජ්‍ය විද්‍යා පීඨ නමින් ස්වාධීන පීඨයක් බවට පත්කිරීම මෙම ප්‍රතිසංවිධානය යටතේ ගන්නා ලද කාලෝචිත පියවරක් සේ සැලකිය හැකිය. මේ පීඨය යටතේ රාජ්‍ය හා ව්‍යාපාර පරිපාලනයත් වාණිජ විද්‍යාවත් යන විෂයයන්ට අමතරව, 1974/75 වර්ෂයේ පටන්, දේශපාලන පාලනය හා තක්සේරු ශාස්ත්‍රය ද හැදෑරීමට පහසුකම් සපයන ලදි.

ප්‍රතිසංවිහිත වූ කලා හෙවත් ශාස්ත්‍ර පීඨයට අලුතෙන් ඇතුළත් වන සිසුන් සඳහා 'සංවර්ධන අධ්‍යයන' නමින් අලුත් උපාධි පාඨමාලාවක් ඉදිරිපත් කිරීම නවීකරණයක් මෙන්ම අත්හදා බැලීමක් ද විය. පීඨයට අයත් අධ්‍යයනාංශ සියල්ලෙහි සහයෝගයෙන් පැවැත්විය යුතුවූ මෙම පාඨමාලාවට ඇතුළත් වන සිසුන් 'පදනම් වර්ෂය' නමින් හැඳින්වුණු පළමු වසරේදී පොදු විෂය ඒකක ගණනක් හැදෑරීමෙන් පසු උපාධි පරීක්ෂණ සඳහා රක්ෂා පථ අනුව සකස් වූ විෂය ක්ෂේත්‍ර කීපයකින් එකකට බඳවා ගැනීම සිදුවිය. පීඨාධිපතිවරයාගේ උපදෙස් අනුව ක්‍රියා කළ පාඨමාලා සංවිධායකවරයකු මගින් අධ්‍යයනාංශාන්තර සම්බන්ධීකරණය කරන ලදි. මෙම සංවර්ධනවේදී උපාධි පාඨමාලාව ඉදිරිපත් කරන ලද්දේ කලා උපාධිධාරීන් අතර වූ රැකියා විරහිත බවට පිළියමක් වශයෙන් වුවද, වසර දෙකක් තුනක් ඇතුළත එය අසාර්ථක අත්හදා බැලීමක් බව පෙනී ගියෙන් නැවතත් 1975/76 අධ්‍යයන වර්ෂයේ සිට සාම්ප්‍රදායික විෂය මූලික විශේෂ උපාධි පාඨමාලා

---

121. Sec. 18

122. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය, 1967.02.12 බලන්න.

පැවැත්වීම ආරම්භ කරන ලදි. සංවර්ධන අධ්‍යයන ද එක් විශේෂ උපාධි පාඨමාලාවක් බවට පත්විය.[123] ඊළඟ අධ්‍යයන වර්ෂයේ සිට සංවර්ධනවේදී උපාධිය සඳහා පළමු වසරේදී නවක සිසුන් බඳවා ගැනීම නවත්වා දැමීමටත්, විෂය මූලිකව සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි අධ්‍යයනය සම්පූර්ණ කළවුන් අතුරෙන් තෝරාගත් සිසුන්ට සිවුවන වසරේ දී ශාස්ත්‍රවේදී උපාධි විශේෂ විෂය වශයෙන් 'සංවර්ධන අධ්‍යයන විෂය' හැදෑරීමට ඉඩදීමටත් පියවර ගෙන ඇත.

ඇතැම් විෂය ක්ෂේත්‍ර මගින් පවත්වා ගෙන ආ පශ්චාත් උපාධි පාඨමාලාවලට ප්‍රතිසංවිධානයෙන් අවහිර පැමිණිය ද, පීඨ මගින් කරගෙන ආ පශ්චාත් උපාධි පර්යේෂණ පහසුකම් සැපයීම දිගටම කළහැකි විය. මෙයට අමතරව, 1974 වර්ෂාරම්භයේ දී විදේශාධාර ඇතිව ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මෙහෙයීමෙන් පටන් ගත් සමාජ සංඛ්‍යාන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව ද, රසායන විද්‍යා අධ්‍යයනාංශයේ මෙහෙයීමෙන් පටන්ගත් පොලිමර් විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලාව ද විශේෂයෙන් සඳහන් කළ යුත්තකි.

1972 ප්‍රතිසංවිධානයෙන් විද්‍යෝදයට වූ හානිය පීඨ, අධ්‍යයනාංශ හා ආචාර්ය සංඛ්‍යාවේ අඩුවීමට පමණක් සීමා නොවිය; ඉතා හොඳින් දියුණුවීගෙන ආ විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය ද කටුබැද්ද මණ්ඩපයට ගෙන යනු ලැබීය.

පුනරුත්ථාපන කඳවුර විශ්වවිද්‍යාලය භූමියෙන් ඉවත් කිරීමෙන් පසු 1972.10.15 දින, ඉහත කී පරිදි, විද්‍යෝදය මණ්ඩපය නැවතත් ගංගොඩවිලට ම ගෙන එන ලද අතර, නොබෝ දිනකින් මහාචාර්ය එල්ලාවල මණ්ඩපාධිපති ධුරයෙන් ඉල්ලා අස්විය. ඉන්පසු මණ්ඩපාධිපති ධුරයට පත්වූයේ 1972 පෙබරවාරි මාසයේ නව පනත ක්‍රියාත්මක කළ තැන් සිට විද්‍යා පීඨාධිපති ධුරය ඉසිලූ ආචාර්ය වී. කේ. සමරනායක ය. හිස්වූ පීඨාධිපතිධුරයට ආචාර්ය එම්. පී. විජේසිංහ පත්විය. කලින් භාෂා හා බෞද්ධ අධ්‍යයන පීඨාධිපති ධුර දැරූ මහාචාර්ය විමල් බලගල්ලේත්, කලා පීඨාධිපති ධුරය දැරූ එල්. ජී. හේවගේත් නව පනත යටතේ 1973 දී පීඨ හා අධ්‍යයනාංශ ප්‍රතිසංවිධානය ක්‍රියාත්මක කරන තෙක් එම ධුර දැරූහ.[124]

1973.07.01 දින සිට පීඨ ප්‍රතිසංවිධානය ක්‍රියාත්මක කිරීමෙන් පසු කලා, භාෂා හා බෞද්ධ අධ්‍යයන යන පීඨ තුනේ ම ඉතිරි අධ්‍යයනාංශ හා පාඨමාලාවලින් සමන්විතව බිහිවූ නව ශාස්ත්‍ර පීඨයෙහි ප්‍රථම පීඨාධිපති ධුරයට පත්වූයේ භාෂා පීඨාධිපතිව සිටි මහාචාර්ය විමල් බලගල්ලේ ය. ආචාර්ය එම්. පී. විජේසිංහ විද්‍යා පීඨාධිපති ධුරයට පත්වූ අතර, අලුතින් පීඨයක් බවට පත් කළමනාකරණ හා වාණිජ්‍ය විද්‍යා පීඨයෙහි පීඨාධිපති ධුරයට මහාචාර්ය ධර්මසේන ද සිල්වා පත්විය.

1973 සැප්තැම්බර් අගදී ආචාර්ය සමරනායක මණ්ඩපාධිපති ධුරයෙන් ඉල්ලා අස්වී කොළඹ මණ්ඩපයට ගිය පසු ඔක්තෝබර් මස මුල සිට මහාචාර්ය විමල් බලගල්ලේ (වැ.බ.) මණ්ඩපාධිපති ධුරයට පත්කරනු ලැබීය. හිස් වූ ශාස්ත්‍ර පීඨාධිපති ධුරයට මහාචාර්ය හේන්පිටගෙදර ඤාණවාස හිමියෝ පත්වූහ.

123. වා.පා.වා. 1975, 3 පිට.

124. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය, අති විශේෂ, 1972.02.15 බලන්න.

නව පනත යටතේ පරිපාලනයෙහි සිදුවූ ප්‍රතිසංවිධානය අනුව සනාතන මන්දිරයේ ප්‍රධාන කාර්යාලයෙහි ආයතනික පරිපාලන කටයුතු ලේඛකාධිකාරිවරයෙකුට භාර වූ අතර, මණ්ඩපවල ආයතනික පරිපාලනය භාරවූයේ නියෝජ්‍ය ලේඛකාධිකාරිවරයකුට ය. විද්‍යොදය මණ්ඩපයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී ධූරයට ප්‍රථමයෙන් පත් කොට එවන ලද්දේ ඩී. පී. පී. සමරසේකරය. මහින්ද අබේවර්ධන, එම්. බී. අදිකාරම් යන මහත්වරු සහාය ලේඛකාධිකාරිහු වූහ. වර්ෂාවසානයේදී සමරසේකර ස්ථාන මාරුවක් ලබා ගිය අතර, ඒ වෙනුවට පැමිණියේ එච්. එම්. තිසේරා මහතා ය. විශ්වවිද්‍යාලය පරිපාලන සේවාව මධ්‍ය කාර්යාලයෙන් (සනාතන මන්දිරයෙන්) පාලිත වූවක් බවට පත්වීම ප්‍රතිසංවිධානයේ ප්‍රතිඵලයකි.

1974 පෙබරවාරි මස අවසානයේදී මහාචාර්ය බලගල්ලේ මණ්ඩපාධිපති ධූරයෙන් ඉල්ලා අස්වූයෙන් ආචාර්ය එම්. ඩබ්ලිව්. ඩී. ධර්මවර්ධන 1974.03.01 දින සිට එම ධූරයට පත්කරනු ලැබීය. එදින සිටම ක්‍රියාත්මක වන පරිදි මහාචාර්ය පී. සී. බී. ප්‍රනාන්දු ද මහාචාර්ය ඒ. සී. ජේ. වීරකෝන් ද විද්‍යා පීඨයේ සම පීඨාධිපති ධූරයට පත්කර ගන්නා ලදහ. 1974 ජූලි මාසයේ දී මහාචාර්ය පී. සී. බී. ප්‍රනාන්දු ඉල්ලා අස්වීමෙන් පසු ආචාර්ය වියුලි ද සිල්වා සම පීඨාධිපති වශයෙන් පත් කරනු ලැබ, එම නොවැම්බර මාසයේ දී පීඨාධිපති ධූරයට පත්විය. 1974 ජූලි මාසයේ දී මහාචාර්ය හේන්පිටගෙදර ඥාණාවාස හිමියන් ශාස්ත්‍ර පීඨාධිපති ධූරයෙන් ඉල්ලා අස්වීමෙන් පසු ආචාර්ය ඩබ්ලිව්. එම්. කේ. විජේතුංග ද ආචාර්ය විනීවිතාරණ ද සම පීඨාධිපති ධූරයට පත්කරනු ලැබූහ.

නව පනත සාකල්‍යයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා මුලින් නියමිත වූ සංක්‍රාන්තික කාල පරිච්ඡේදය 1974.02.15 වන දිනෙන් අවසන් විය යුතු වුවද, ප්‍රතිසංවිධානයෙන් පැනනැගි විවිධ ගැටළු නිසා වරින්වර තවදුරටත් එම සංක්‍රාන්තික කාලය දිගු කිරීමට ඇමතිවරයාට සිදු විය. පනතින් යෝජිත ප්‍රතිසංවිධාන සමහරක් ප්‍රායෝගික නොවන බව පෙනිණ. මණ්ඩප සඳහා අලුතින් යෝජිත ඇතැම් අධිකාරි මණ්ඩල ක්‍රියාත්මක කළ නොහැකි වූ අතර, සනාතන සභාව වැනි පැරණි අධිකාරි මණ්ඩලවල සේවය උපදේශක තත්ත්වයෙන් තවදුරටත් ලබා ගැනීමට සිදු විය. ආචාර්යවරුන් වැඩිදෙනා උදාසීනත්වයට පත්වූ අතර, ශිෂ්‍යයන් අතරෙහි කණ්ඩායම් ගැටුම් හා පංති වර්ජන ද බහුල විය. තනි විශ්වවිද්‍යාලය අවධියේ විශ්වවිද්‍යාලයෙහි පැවති මෙම අවුල් සහිත බව 1978 ඩී. ජී. දයාරත්න පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවෙන් ද පිළිබිඹු වෙයි.[125]

1975 පෙබරවාරි මාසයේ දී ආචාර්ය ධර්මවර්ධන මණ්ඩපාධිපති ධූරයෙන් ඉල්ලා අස්වූයෙන් ආචාර්ය ඩබ්ලිව්. එම්. කේ. විජේතුංග එම ධූරයට පත් විය. මාර්තු මාසයේ සිට ශාස්ත්‍ර පීඨාධිපති ධූරයේ වැඩ බැලූ ආචාර්ය ඒ. වී. සුරවීර ජූනි මාසයේ සිට එම ධූරයෙහි තහවුරු කරන ලදි. 1977 දී මහාචාර්ය ධර්මසේන ද සිල්වා නිවාඩු ගැනීමෙන් පසු මහාචාර්ය එස්. තිලකරත්න එම ධූරයෙහි වැඩ බැලීමට පත්කරනු ලැබීය.

1977 දී ආචාර්ය විජේතුංග මණ්ඩපාධිපති ධූරයෙන් ඉවත් වූයෙන් මහාචාර්ය වියුලි ද සිල්වා එම ධූරයට පත්විය. 1978 දී මහාචාර්ය ජිනදාස පෙරේරා එම ධූරයට පත්කරන ලදි.

මෙම කාලය තුළ 1973 දී ආචාර්ය එස්. තිලකරත්න ආර්ථික විද්‍යා මහාචාර්ය ධූරයටත්, 1975 දී ආචාර්ය වියුලි ද සිල්වා රසායන විද්‍යා මහාචාර්ය ධූරයටත් පත්වූහ.

125. ii සැසි වාර්තාව – 1981.

විශ්වවිද්‍යාලය මණ්ඩප භූමිය හා ගොඩනැගිලි පැත්තෙන් බලන විටද මෙම අවධිය ඉතා අඩු සංවර්ධනයක් පෙන්නුම් කරන කාලයක් බව කිව හැකිය. ත්‍රස්තවාදී කලබල හේතුකොට ගෙන අඩාළව පැවති විද්‍යා පීඨ සංකීර්ණයේ ගොඩනැගිලි කීපයක කටයුතු නැවත ආරම්භකරන ලදුව සෙමින් සෙමින් කෙරිගෙන ගියේය. මේ කාලය තුළ කාලානුරූපව සැලසුම් කොට අභිනවයෙන් ආරම්භ කළ ගොඩනැගිල්ලක් වූයේ 1973.10.15 වන දින වැඩ පටන් ගත් විමලධර්ම ශිෂ්‍ය නිවාසය යි. කලින් මුද්‍රණාලය පිහිටුවා තිබුණු ගොඩනැගිල්ල ද 1974 දී ශිෂ්‍ය නිවාසයක් බවට පරිවර්තනය කොට රාහුල ශිෂ්‍ය නිවාසයයි නම් කරන ලදි.

## V විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභා අවධිය : 1979—අදතෙක්

විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභා අවධිය ඇරඹෙන්නේ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාලය පනත ක්‍රියාත්මක වූ 1979.01.01 දින පටන්ය. ලංකාවේ විශ්වවිද්‍යාලය වලට අහිමි වී ගිය ස්වාධීනතාව නැවත ලබා දීම 1977 දී ජේ. ආර්. ජයවර්ධන මහතාගේ නායකත්වයෙන් රාජ්‍ය බලය ලබා ගත් එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ පොරොන්දුවලින් එකක් විය. නව පනතේ 139 වන වගන්තිය අනුව තනි විශ්වවිද්‍යාලයක මණ්ඩප වශයෙන් පැවති, විද්‍යොදය මණ්ඩපය ද ඇතුළු ආයතන 6 ම ස්වාධීන විශ්වවිද්‍යාලය බවට පත්වූ අතර, ඒවායේ පැරණි නම් වෙනුවට ඒවා පිහිටි තැන් ඇසුරු කොට ගත් අලුත් නම් ද දෙන ලදි. විද්‍යොදය මණ්ඩපය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය බවට පත්වූයේ එපරිද්දෙනි.

1978 පටන් මණ්ඩපාධිපති ධූරය දරමින් සිටි මහාචාර්ය කේ. ජිනදස පෙරේරා නව පනත ක්‍රියාත්මක කළ දිනය වූ 1979.01.01 දින සිට බලපවත්වන පරිදි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති ධූරයට පත්කරන ලදි. එහි කුලපති පදවියට පත්කරන ලද්දේ ඊ. ඩබ්ලිව්. අදිකාරම් ය. මේ පනත යටතේ කුලපති පදවිය කලින් මෙන් නිලබල යෙන් ආණ්ඩුකාර තුමා හෝ ජනාධිපති තුමා වෙත පැවරෙන්නක් නොව ජනාධිපති තුමා විසින් නම් කරනු ලැබූවකු වෙත පැවරෙන්නකි.[126]

බොහෝදුරට 1966 අංක 20 දරන පනතෙහි හා 1971.04.04 දින සභාගත කළ[127] පනත් කෙටුම්පතෙහි සංකලනයක් බඳු මෙම නව පනත යටතේ කෙරෙන ප්‍රතිසංවිධාන යෙහි කැපී පෙනෙන විශේෂ ලක්ෂණය වූයේ විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂමක් පිහිටුවා[128] ලංකාවේ විශ්වවිද්‍යාලය සියල්ල එහි අධීක්ෂණ පරිපාලනය යටතට ගැනීම යි. පනත යටතේ පිහිටුවන ලද වි.ප්‍ර.කො. සභාවෙහි ප්‍රථම සභාපති පදවියට පත්වූයේ, කලින් ලංකා විශ්වවිද්‍යාලයෙහි කෘෂිකර්ම මහාචාර්යවරයකු වූ ස්ටැන්ලි කල්පගේ මහතාය. එක් එක් විශ්වවිද්‍යාලයේ පැවැත්ම හා සංවර්ධනය සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සැලසීමේ වගකීම පැවරුණු මෙම වි.ප්‍ර. කොමිෂම කලින් තිබූ ජා.උ.අ. සභාවට වඩා පුළුල් බලතල ඇත්තකි. 1966 අංක 20 හා 1972 අංක 1 යන පනත් දෙක්හි දී මෙන් ම මෙහිදී ද ප්‍රථම උපාධි සඳහා සිසුන් ඇතුළත් කිරීමේ බලතල රජයේ ප්‍රතිපත්තිය අනුව ක්‍රියා කරන කොමිෂමේ අවයවයක් වූ ප්‍රවේශ කමිටුවකට පැවරෙන අතර[129] ඒ ඒ විශ්වවිද්‍යාලයෙහි පැවැත්විය යුතු පාඨමාලා පිළිබඳ අධීක්ෂණ බලතල ද එයට පැවරේ.[130]

126. Sec. 32
127. ඉහත 41 පිට බලන්න.
128. Sec. 2
129. Sec. 15 (vii).
130. Sec. 15 (v).

නව ප්‍රතිසංවිධානය යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි පීඨ සංඛ්‍යාවේ වෙනසක් නුවූ නමුත්, පීඨයන් තුළ අධ්‍යයනාංශයන්ගේ සංයුතියෙහි හිතකර වෙනස්වීම් කීපයක් සිදු විය. 1973 දී අධ්‍යයනාංශ හා පාඨමාලා කීපයක් ඒකාබද්ධ කිරීමෙන් පිහිටුවා තිබූ භාෂා හා සංස්කෘති අධ්‍යයනාංශයෙන් පාලි හා බෞද්ධ අධ්‍යයන පාඨමාලා ඉවත් කොට, 1980 පටන් එය ස්වාධීන අධ්‍යයනාංශයක් බවට පත්කරන ලදී. එහෙත් උප අධ්‍යයනාංශයක්ව පැවති ඉංග්‍රීසි විෂය භාෂා හා සංස්කෘති අධ්‍යයනාංශයට එක්කරන ලදී. ඉතිහාස අංශය හා ඒකාබද්ධ කොට තිබූ සමාජ විද්‍යාව ද ස්වාධීන අංශයක් කිරීමෙන් ශාස්ත්‍ර පීඨයේ අධ්‍යයනාංශ සංඛ්‍යාව 7 ක් බවට පත්විය. ශාස්ත්‍ර පීඨයෙහි සමහර අධ්‍යයනාංශ මගින් සැපයෙන උපාධි පාඨමාලා විෂය ක්ෂේත්‍ර සංඛ්‍යාවෙහි ද වර්ධනයක් මේ කාලය තුළ වූ බව පෙනේ. ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය මගින් සැපයෙන සමාජ සංඛ්‍යානය පාඨමාලාවත්, භාෂා හා සංස්කෘති අධ්‍යයනාංශය මගින් සැපයෙන පුරාවිද්‍යාව (1963 දී මෙය ඉතිහාස අංශයට පවරනු ලැබීය) සහ සංස්කෘතික අධ්‍යයන යන පාඨමාලාත්, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය මගින් සැපයෙන බෞද්ධ දර්ශනය පාඨමාලාවත් එබඳු විෂය ක්ෂේත්‍ර කීපයකි. කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨයෙහි රාජ්‍ය පරිපාලන හා ව්‍යාපාර පරිපාලන අංශය දෙකට කඩා ස්වාධීන අධ්‍යයනාංශ දෙකක් කිරීම නිසා පීඨයේ අධ්‍යයනාංශ ගණන 3 ක් විය.[131] මෙම පීඨය මගින් මෙතෙක් පවත්වා ගෙන ආ දෙමළ මාධ්‍ය පංති 1982 දී යාපනයට මාරු කරන ලදී. 1981 දී, කළමනාකරණය පිළිබඳ වෘත්තීය පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් අරඹන ලදී. විද්‍යා පීඨයෙහි මෙතෙක් එක් අධ්‍යයනාංශයක් වශයෙන් පැවති ජෛවීය විද්‍යා අංශය 1982 දී දෙකට බෙද සත්ත්ව විද්‍යා උද්භිද විද්‍යා යයි අධ්‍යයනාංශ 2 ක් කිරීම නිසා පීඨයේ අධ්‍යයනාංශ සංඛ්‍යාව 5 ක් බවට පත්විය.[132] 1983 දී උද්භිද විද්‍යා අංශය මගින් විදේශාධාර ද ඇතිව වන විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලාවක් ආරම්භ කරන ලදී.[133]

1979 න් ඇරඹුණු වර්ෂත්‍රය තුළ උපකුලපති ධූරය දැරුයේ මහාචාර්ය කේ. ජිනදස පෙරේරා ය. එම වර්ෂාරම්භයෙහි ශාස්ත්‍ර පීඨාධිපති ධූරයට පත්වූ ආචාර්ය (පසුව මහාචාර්ය) එම්. එම්. කරුණානායක සප්තවාර්ෂික නිවාඩු ගැනීමෙන් පසු 1979 සැප්තැම්බර මාසයේ දී සහාය මහාචාර්ය ටී. බී. කාන්ගාරච්චි පීඨාධිපති ධූරයට පත්විය. ජී. එම්. හේම විජේවර්ධන කළමනාකරණ පීඨාධිපති ධූරය ද, පී. එල්. ඩී. වෛද්‍යසේකර ව්‍යවහාරික විද්‍යා පීඨාධිපති ධූරය ද ඉසිලූහ.

1979 ජූනි මාසයේ දී ලේඛකාධිකාරී ධූරයට පත් ඩබ්ලිව්. පී. අබේදීර මහතා නිවාඩු යැමෙන් පසු එන්. ඩබ්. එස් ද සිල්වා මහතාත්, අනතුරුව එම්. ඒ. මුනිදස මහතාත් එම ධූරයෙහි වැඩ බැලීම කළහ. පසුව එම තනතුර හිස්වූයෙන් 1983 දී මහින්ද අබේවර්ධන මහතා එයට පත්කර ගනු ලැබීය.

විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභා අවධියේ මුල් වර්ෂ කීපය විශ්වවිද්‍යාලයෙහි වාතාවරණය යහපත් අතට හැරුණු කාලපරිච්ඡේදයක් සේ සැලකිය හැකිය. සිසු විනයද තරමක් දුරට හොඳ අතට හැරිණ. මේ කාලය තුළ බරපතල ශිෂ්‍ය අරගලයක් පැනනැංගේ එක් වතාවක පමණි. ආචාර්යවරුන් වැඩි දෙනා තුළවූ උදාසීනතාව ටිකෙන් ටික මගහැරී අධ්‍යාපන කටයුතු යහපත් අතට හැරෙන්නට විය. වැටුප් පිළිබඳ ප්‍රශ්නය උඩ එක් අවස්ථාවක දී ආචාර්ය සංගමය මෙහෙයවූ ආචාර්යවරුන් සිය නිල කටයුතුවලට

---

131. වා.පා.වා. 1980, 135 පිට.
132. වා.පා.වා. 1982, 115 පිට.
133. වා.පා.වා. 1981, 104 පිට; 1982, 113 පිට.

අමතර කාර්‍යයන්ගෙන් වැලකී සිටීමේ ව්‍යාපාරය හැරුණු විට විශ්වවිද්‍යාලය අධිකාරීන් හා ආචාර්‍යවරුන් අතර සහයෝගය පලුදු වන සිදුවීමක් නොවීය. කාලයක් මුළුල්ලේ නවතා දමා තිබුණු උපාධි ප්‍රදානෝත්සව නැවත වරක් ආරම්භ කොට වසර පිළිවෙළින් පවත්වා ගෙන යෑමට පියවර ගැනීම විශ්වවිද්‍යාලය ගැන රට තුළ නැවත ප්‍රබෝධයක් ඇතිවීමට හේතු විය.

මූලධන සංවර්ධනය අතින් ද මේ තුන්විදයක කාලපරිච්ඡේදයකි. වි.ප්‍ර.කො. සභාවේ උපදෙස් පරිදි විශ්වවිද්‍යාලය භූමියෙහි ඇති ගොඩනැගිලි ඇතුළත් කොට ඉදිරි සංවර්ධන කටයුතුවලට අදාළ සංයුක්ත සැලැස්මක් (Corporate Plan) බිල්ට් ඉන් එන්වයරන්මන්ට්ස් ගෘහනිර්මාණ ශිල්පීන් ලවා සකස් කරවා ගෙන එයට අනුමැතිය ලබා ගැනීමෙන් පසු පළමු කොට ගැලුම් 30,000 ක ධාරිතාවක් ඇති ජලස්තම්භය තැනීමේ වැඩ ආරම්භ කරන ලදි. මායිම් තාප්පයෙහි වැඩ ද විද්‍යා පීඨ සංකීර්ණයෙහි ඉතිරිව තිබූ කටයුතු ද මුළුමනින් ම වාගේ නිම කළ හැකි විය.

මහාචාර්‍ය ජිනදාස පෙරේරාගේ සේවා කාලය අවසන් වීමත් සමඟ, පනතෙහි නියමිත පරිදි කෝට් සභා ඡන්දයෙන් තේරුණු[134] සහාය මහාචාර්‍ය ටී. බී. කාංගහාරච්චි 1962.01.01 දින සිට උපකුලපති ධූරයට පත්විය.[135] අනතුරුව මහාචාර්‍ය විමල් ජී. බලගල්ලේ ශාස්ත්‍ර පීඨාධිපති ධූරයට ද, මහාචාර්‍ය ටියුලි ද සිල්වා ව්‍යවහාරික විද්‍යා පීඨාධිපති ධූරයට ද, හේම විජේවර්ධන මහතා (පසුව මහාචාර්‍ය) කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨාධිපති ධූරයට තෝරා පත්කර ගනු ලැබූහ.[136]

1983 වර්ෂාරම්භයෙහි පැවති උත්සවයකදී සිසුන් කණ්ඩායමක් හා සේවකයකු අතර ඇති වූ ගැටුමක් ගමට ද පැතිර යෑමෙන් පැනනැගි තත්ත්වය හේතු කොට ගෙන අධ්‍යාපන කටයුතු සඳහා විශ්වවිද්‍යාලය දින නියමයක් නැතිව වසා තබන්නට සිදු විය. මේ අවි-නිශ්චිත තත්ත්වය යටතේ වි.ප්‍ර.කො. සභාව විසින් ආර්ථික විද්‍යා අංශයේ කථිකාචාර්‍ය-වරයකු ද, තරුණ හා රැකී රක්ෂා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයකු ද වූ කරුණාසේන කොඩිතුවක්කු මහතා 1963.02.07 වන දින සිට විශ්වවිද්‍යාලයේ නිසි බලධර වශයෙන් පත්කොට එවන ලදි. එතැන් සිට දින කීපයක් ඇතුළත විශ්වවිද්‍යාල-යේ අධ්‍යාපන කටයුතු යථා තත්ත්වයට පැමිණියේය. පසුව 1983 ජූලි මාසයේ දී පැන-නැගි ජාතිවාදී ගැටුම් හේතුකොට ගෙන ප්‍රකාශයට පත් කළ හදිසි අවස්ථා නීතිය යටතේ කරන ලද නියෝගයක් මගින් ඒ මහතා උපකුලපති ධූරයට පත්කරන ලදි. එම නියෝගය මගින් ම අහෝසි වූ පීඨාධිපති හා අංශ ප්‍රධාන ධූරවලට කලින් එම ධූර දැරූවෝ ම පත්-කරනු ලැබූහ.

1983 පෙබරවාරි මාසයෙන් පසු විශ්වවිද්‍යාලයේ වාතාවරණය ටිකින් ටික යහපත් අතට හැරෙමින් පවතිද්දීය ජූලි මාසයෙහි පැනනැගි ජාතිවාද කලබල නිසා ලංකාවේ විශ්වවිද්‍යාලය සියල්ල අධ්‍යාපන කටයුතු සම්බන්ධව හදිසියේ වසා දමන්නට සිදු වූයේ. නැවත ශිෂ්‍ය කටයුතු ආරම්භ වූයේ නියමිත වාර්ෂික පරීක්ෂණ වලිනි. 1983/84 අධ්‍යයන වර්ෂයේ නවක සිසුන් සඳහා 1983 ඔක්තෝබර් මාසයේ දී ආරම්භ කොට සති 8 ක් පැවැත්වූ

134. Sec. 34 (1)
135. වා.පා.වා. 1981 13 පිට.
136. Sec. 49 (1)

අධිවේග ඉංග්‍රීසි වැඩසටහන සමඟ සමාන්තරව යන සේ සති 4 ක් තුළ ක්‍රියාත්මක කළ නම්‍යීකරණ වැඩසටහන සාර්ථක අත්හද බැලීමක් විය. නව අධ්‍යයන වර්ෂය පටන් ගැනීමට සිදුවූයේ 1964 ජනවාරි මාසයේ ය.

වි.ප්‍ර.කො. යහා අවධිය තුළදී මහාචාර්ය ධූර ගණනාවක් පුරවනු ලැබීම අධ්‍යයනාංශවල දියුණුවට රුකුලක් විය. 1979 දී ආචාර්ය එම්. එම්. කරුණානායක භූගෝල විද්‍යා මහාචාර්ය ධූරයට, ආචාර්ය ආර්. ඒ. දයානන්ද සංඛ්‍යාන මහාචාර්ය ධූරයට හා ආචාර්ය එස්. පී. ද අල්විස් ගණිත මහාචාර්ය ධූරයට ද, 1982 ආචාර්ය ඩබ්ලිව්. ඊ. රත්නායක සත්ත්ව විද්‍යා මහාචාර්ය ධූරයට, ආචාර්ය එච්. ජී. නන්දදස උද්භිද විද්‍යා මහාචාර්ය ධූරයට හා ආචාර්ය ඒ. වී. සුරවීර සිංහල මහාචාර්ය ධූරයකට ද, 1983 දී ආචාර්ය නන්දසේන රත්නපාල සමාජ විද්‍යා මහාචාර්ය ධූරයට, ආචාර්ය හේම විජේවර්ධන වාණිජ විද්‍යා මහාචාර්ය ධූරයට හා ආචාර්ය එල්. පී. එන්. පෙරේරා පාලි මහාචාර්ය ධූරයට ද පත් කරනු ලැබූහ. විදේශීය විශ්වවිද්‍යාලය සමඟ ඇති ආචාර්ය මණ්ඩලීය හුවමාරු හා ෆුල් බ්‍රයිට් ක්‍රම යටතේ කැනේඩියානු ඇමෙරිකානු හා නෙදර්ලන්ත මහාචාර්යවරුන් කීප දෙනෙකුගේ සේවය ද,—විශේෂයෙන් පශ්චාත් උපාධි පාඨමාලා හා පර්යේෂණ ව්‍යාපෘති සඳහා, මේ කාලය තුළ ලබා ගත හැකි විය.

තනි විශ්වවිද්‍යාලයක මණ්ඩප තත්ත්වයෙන් මිදී ස්වාධීන විශ්වවිද්‍යාලය තත්ත්වය ලැබූ මෙම අවධියෙහි විශ්වවිද්‍යාලයේ වර්ධනය සිදුවූයේ ඉහත කී ලෙස නව පාඨමාලා අතින් පමණක් නො වේ. මෙම වර්ධනය ශිෂ්‍ය සංඛ්‍යාව හා ආචාර්යසංඛ්‍යාව අතිනුදු දක්ක හැකිය. 1973, 1974 වර්ෂවල පාඨමාලා සම්බන්ධයෙන් සිදු කළ ප්‍රතිසංවිධාන හා ඉවත් කිරීම් හේතු කොට ගෙන, කලින් 3,000 කට ආසන්නව තිබූ සිසුන්ගේ ගණන 1974 දී,— ශාස්ත්‍ර පීඨයෙහි 946 ක්ද, කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨයෙහි 741 ක් ද, විද්‍යා පීඨයෙහි 155 කදැයි, පශ්චාත් උපාධි සිසුන් ද ඇතුළුව මුළු ගණන, — 1842 දක්වා පහත වැටී තිබුණි 1975 දී ශාස්ත්‍ර පීඨ සිසුන්ගේ ගණන 904 දක්වා තවත් පිරිහිණ. එහෙත්, කළමනාකරණ පීඨය රැකියා යොමු පාඨමාලාවක් වශයෙන් අලුතින් ඉදිරිපත් කළ දේපොළ පාලනය හා තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ පාඨමාලාවටත්, විද්‍යා පීඨයටත් වැඩි ගණනක් සිසුන් බඳවා ගැනීම නිසා 1975 දී මුළු සිසුන්ගේ ගණන 2,036 ක් විය. එතැන් පටන් දෙදහසකට ආසන්නවපැවති මෙම ශිෂ්‍ය සංඛ්‍යාව, 1979 දී, ශාස්ත්‍ර පීඨයෙහි 1359 ක් ද, කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨයෙහි 796 ක්ද, විද්‍යා පීඨයෙහි 386 ක් දැයි එකතුව 2,541 ක් විය. එහෙත් විශ්වවිද්‍යාලයවලට සිසුන් ඇතුළත් කරගැනීමේ ප්‍රතිපත්තිය සම්බන්ධව මතුවූ නීති ප්‍රශ්නයක් නිසා 1980 දි නවක සිසුන් ඇතුළත් කරගත නොහැකි වූයෙන් මෙම ගණන 2,168 දක්වා පහත වැටිණ. ඊළඟ වර්ෂයේ දී වැඩි ගණනක් සිසුන් ඇතුළත් කර ගැනීමෙන් එයට යෙදූ පිළියම නිසා, 1981 දී ශාස්ත්‍ර පීඨයෙහි 1,554 ක් ද, කළමනාකරණ පීඨයෙහි 1334 ක් ද, විද්‍යා පීඨයෙහි 348 ක් දැයි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 3,226 දක්වා ඉහළ ගියේය. 1982 දී ශාස්ත්‍ර හා කළමනාකරණ පීඨවලට බඳවා ගත් සිසුන්ගේ සංඛ්‍යාව ස්වල්ප වශයෙන් අඩු වූ අතර, විද්‍යා පීඨය ගත් සිසුන්ගේ ගණන තවත් වැඩිවිය. ශාස්ත්‍ර හා කළමනාකරණ යන එක් එක් පීඨය සිසුන්ගේ ගණන 1,500 ට ආසන්න ප්‍රමාණයක තබා ගැනීමත්, විද්‍යා පීඨ සිසුන්ගේ ගණන සම්පත් තත්ත්වය ද අනුරූප වනසේ වර්ධනය වන්නට හැරීමත් යෝග්‍ය බව සාමාන්‍යයෙන් පිළිගෙන ඇත. දැන් විශ්වවිද්‍යාලයෙහි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 3,500 කට ආසන්න වේ.

මෙම අවධිය තුළ ආචාර්ය මණ්ඩලයෙහි ක්‍රමික වර්ධනයක් දක්ක හැක්කේ විද්‍යා පීඨය සම්බන්ධයෙනි. 1975 දී 36 ක් වූ විද්‍යා පීඨයෙහි ස්ථිර ආචාර්යවරුන්ගේ සංඛ්‍යාව

1979 දී 51 දක්වා ද, 1980 දී 58 දක්වා ද, 1982 දී 65 දක්වා ද වැඩිවීම නිසා එම පීඨය දැන් ආචාර්ය ශිෂ්‍ය ප්‍රතිශතය අතින් බලන විට, ලක්දිව විශ්වවිද්‍යාලය අතර හොඳ තත්ත්වයක සිටින බව පෙනී යයි. යථාකාලයේදී ආධුනික ආචාර්යවරුන්ට පශ්චාත් උපාධි පුහුණුව ලබාදීම ද නොකඩවා සිදු කැරිණ. කළමනාකරණ විද්‍යා පීඨයෙහි 1975 දී 22 ක් වූ ස්ථිර ආචාර්ය සංඛ්‍යාව දැන් තිස් ගණනක් වී ඇතත්, සුදුසුකම් ඇති ස්ථිර ආචාර්යවරුන් අවශ්‍යතරම් ලබා ගත නොහැකිවීම නිසා, පසුගිය කාලය තුළ මහ බැංකුව වැනි ආයතනවලින් බාහිර කථිකාචාර්ය සේවය ලබා ගැනීමෙන් එම අඩුපාඩු සපුරා ගැනීමට සිදුව ඇත. ආචාර්ය මණ්ඩලය අතින් අඩුම වර්ධනයක් දක්නා හැක්කේ ශාස්ත්‍ර පීඨයෙහි ය. විශ්වවිද්‍යාලයෙහි පැරණිතම අධ්‍යයනාංශයන්ගෙන් සමන්විත පීඨය වූ එහි ආචාර්යවරුන්ගෙන් බොහෝ දෙනෙක් දැන් අවුරුදු 15 කට 20 කට වඩා සේවා කාලයක් ඇති ජ්‍යෙෂ්ඨ ආචාර්යවරු ය. 1975 දී 59 දක්වා අඩු වූ ශාස්ත්‍ර පීඨයේ ස්ථිර ආචාර්ය සංඛ්‍යාව 1979 දී 62 ක් වූ අතර, ඉන්පසු, පුරප්පාඩු පිරවීම හැරුණු විට ලොකු වෙනසක් නොවීය. මේ කාලය තුළ, පීඨයේ ආචාර්යවරුන්ගෙන් 6 දෙනෙකු (V : V ආර්ථික විද්‍යා 1+ ඉතිහාසය 3+ භූගෝල විද්‍යා 1+ සිංහල 1) රජයේ හෝ රාජ්‍ය ආයතනවල පූර්ණකාලීන සේවය සඳහා මුදවා හැරීමට ද සිදුවිය. 1983 දී ආචාර්ය සංඛ්‍යාව 2 කින් වැඩි වුවද, පාඨමාලා අතින් වූ සංවර්ධනයට අනුරූප වනසේ ආචාර්ය මණ්ඩලය වර්ධනය නොවීම ඇතැම් අධ්‍යයනාංශවල අධ්‍යාපන කටයුතු කෙරෙහි තදින් බලපෑවේය. මෙසේ තිබියදී, 1984 වර්ෂයේ දී ශාස්ත්‍ර පීඨයට ද ආචාර්යවරුන් 8 දෙනෙකු හා උපදේශකවරුන් 10 දෙනෙකු අලුතෙන් බඳවා ගැනීමට ඉඩ ලැබීම නිසා මෙම තත්ත්වය ද දැන් යහපත් අතට හැරී ඇත.

1984 සිට ඉදිරි පස් වසර සඳහා මෙම විශ්වවිද්‍යාලයේ කුලපති පදවියට ආචාර්ය විමලා ද සිල්වා මහත්මිය ජනාධිපති තුමන් විසින් පත්කරනු ලැබීම ද ලක්දිව විශ්වවිද්‍යාලයීය ඉතිහාසයෙහි කාන්තාවක එම ධුරයට පත් වූ ප්‍රථමාවස්ථාව වශයෙන් සඳහන් කළ යුත්තකි.